බලශක්ති අමාත්‍යාංශය
வலுசக்தி அமைச்சு
Ministry of Energy

2025

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
Annual Performance Report

බලශක්ති අමාත්‍යාංශය

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2025

අංක 437, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංකය - 011 2574922
ෆැක්ස් - 011 2574741
විද්‍යුත් තැපැල - info@energymin.gov.lk

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
බලශක්ති අමාත්‍යාංශය
වැය ශීර්ෂ අංකය - 119

අන්තර්ගතය

පිටු අංකය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැඳින්වීම 2
1.2 අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර 5
1.3 බලශක්ති අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන් 6
1.4 සංවිධාන සටහන 7
1.5 අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ හා කාර්යයන් 9
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 13

පරිච්ඡේදය 02 - 2025 වර්ෂය තුළ ප්‍රගතිය හා ඉදිරි දැක්ම - 2026 16

2.1 2025 වර්ෂය තුළ විදුලිබල අංශයේ කාර්යසාධනය 17
2.1.1 විදුලිබල ක්ෂේත්‍රයේ සම්පිණ්ඩනයක් ලෙසින් 17
2.1.2 විදුලි උත්පාදනය 17
2.1.3 ජාතික විදුලිබල ජාලයේ ස්ථාපිත ධාරිතාවය 18
2.1.4 විදුලි උත්පාදන ව්‍යාපෘති 19
2.1.5 සම්ප්‍රේෂණ සංවර්ධන කටයුතු 21
2.1.6 දේශගුණික විපර්යාස අවම කිරීම හා විදුලිබල ක්ෂේත්‍රයේ ජාතිකව නිර්ණය කරන ලද දායකත්වය (NDCs) 24
2.1.7 විදුලි ගාස්තු සංශෝධනය 25
2.1.8 පුනර්ජනනීය බලශක්ති ගාස්තු සංශෝධනය 25

2.2 2025 වර්ෂයේ බලශක්ති අංශයේ කාර්යයසාධනය 26
2.2.1 ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අංශයේ තොරතුරු ලුහුඬින් -2025 26
2.2.2 ගෝලීය ඛනිජ තෙල් මිල ප්‍රවනතා ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි ඇති කරන ලද බලපෑම 26
2.2.3 ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, ආනයන පිරිවැය සහ අලෙවිය 29
2.2.4 බොර තෙල් ආනයනය සහ පිරිපහදු කිරීම 31
2.2.5 ඉන්ධන ගබඩා කිරීම 33
2.2.6 ඉන්ධන බෙදාහැරීම 33
2.2.7 ඛනිජ තෙල් වෙළඳපොළ ස්වභාවය 35
2.2.8 2025 වර්ෂය තුළ ඛනිජ තෙල් ක්ෂේත්‍රයට අදාළව ඉටුකරන ලද නියාමන කාර්යයන් 37
2.2.9 ඛනිජ තෙල් ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 42

2.3 ඉදිරි දැක්ම 2026 45

අන්තර්ගතය

පිටු අංකය

පරිච්ඡේදය 03 - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය 46

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 48
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 49
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 50
3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 51
3.5 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය 51
3.6 මු.රෙ. 208 ප්‍රකාරව, ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 51
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 54
3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව (ඇමුණුම 1)

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක 55

4.1 අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 56

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 58

5.1 විදුලිබල ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධන ඉලක්ක (SDG) 59
5.2 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය 59
5.3 තිරසාර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග 60

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 62

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 63
6.2 අමාත්‍යාංශයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේද යන්න 63
6.3 මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් 63

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 67

වගු නාමාවලිය

		පිටු අංකය
වගුව 2.1.1	පාරිභෝගික සංඛ්‍යාව - 2025	17
වගුව 2.1.2	විදුලි උත්පාදනය - 2025	17
වගුව 2.1.3	උත්පාදන මූලාශ්‍රය අනුව ස්ථාපිත විදුලි ධාරිතාවය (2025 දෙසැම්බර් අග වන විට)	18
වගුව 2.1.4	ජල විදුලි උත්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘති	19
වගුව 2.1.5	තාප විදුලි උත්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘති	19
වගුව 2.1.6	පියැසි පාදක සූර්ය බලශක්ති පද්ධති සම්බන්ධතා වල ප්‍රගතිය	20
වගුව 2.1.7	සුළං බලශක්ති උත්පාදන ව්‍යාපෘති	20
වගුව 2.1.8	බලශක්ති ගබඩා සංවර්ධන ව්‍යාපෘති	21
වගුව 2.1.9	පද්ධති නවීකරණය සහ සහායක ව්‍යාපෘති	21
වගුව 2.1.10	දැනට ක්‍රියාත්මක සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය	21
වගුව 2.1.11	අරමුදල් සම්පාදනය කරගැනීමට නියමිත සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර	24
වගුව 2.2.1	ආසියා-පැසිෆික් කලාපීය බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන මිල ප්‍රවණතා - 2025	27
වගුව 2.2.2	ඛනිජ තෙල් නිෂ්පාදන වල සාමාන්‍ය ඉහළ සහ අඩුම මිල ගණන් - 2025 (සිංගප්පූරු ප්ලැට්ස් මිල දර්ශක පදනම් කර ගනිමින්)	28
වගුව 2.2.3	ඉන්ධන සඳහා වූ සාමාන්‍ය මාසික ආනයන පිරිවැය - 2025	28
වගුව 2.2.4	ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය - 2025	29
වගුව 2.2.5	ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන පිරිවැය - 2025	29
වගුව 2.2.6	ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය - 2025	30
වගුව 2.2.7	විදුලි උත්පාදනය සඳහා ඉන්ධන අලෙවිය (2022-2025)	31
වගුව 2.2.8	බොර තෙල් ආනයනය (2020-2025)	31
වගුව 2.2.9	දේශීයව පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන (2022-2025)	32
වගුව 2.2.10	ආනයනික නිමි නිෂ්පාදනය සහ දේශීයව පිරිපහදු කළ නිෂ්පාදන පිළිබඳ විස්තර - 2025	32
වගුව 2.2.11	කොළොන්නාව සහ මුතුරාජවෙල ඉන්ධන ගබඩා පර්යන්තය පිළිබඳ තොරතුරු	33
වගුව 2.2.12	ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය - 2025	34
වගුව 2.2.13	සමස්ථ ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව - 2025	35
වගුව 2.2.14	ලිහිසි තෙල් අංශයේ ක්‍රියාකාරකම් - 2025	36
වගුව 2.2.15	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව - 2025	39
වගුව 2.2.16	2025 වර්ෂය තුළ වාර්තා වූ උපරිම සහ අවම වෙළඳපොළ මිල ගණන්	40
වගුව 2.2.17	ඉන්ධන ගබඩා ධාරිතාව ව්‍යාප්ත කිරීම	44
වගුව 2.2.18	ඉන්ධන නල මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම	44

ප්‍රස්තාර

ප්‍රස්තාරය 2.1.1	විදුලි උත්පාදනය - 2025	18
ප්‍රස්තාරය 2.1.2	විදුලිබල ජාලයේ ස්ථාපිත ධාරිතාවය	19
ප්‍රස්තාරය 2.2.1	ඉන්ධන බෙදාහැරීමේ සංයුතිය - 2025	34
ප්‍රස්තාරය 2.2.2	2025 වර්ෂය තුළ වාර්තා වූ වෙළඳපොළ මිල ගණන්	40

01 වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01 වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

විදුලිබල හා ඛනිජ තෙල් යන දෙඅංශයේම පරිපාලනය සම්බන්ධයෙන් වගකීමෙන් බැඳී සිටින්නා වූ බලශක්ති අමාත්‍යාංශය විසින් 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මගින් සංශෝධිත 2024 අංක 36 දරන නව ශ්‍රී ලංකා විදුලිබල පනත හඳුන්වාදෙනු ලැබූ අතර එය ක්‍රියාවට නැංවීම හරහා බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කෙරිය. මෙහිදී, මූලික පැවරුම් සැලැස්ම, ජාතික විදුලිබල ප්‍රතිපත්තිය, ජාතික අයකුම ප්‍රතිපත්තිය, වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලැස්ම, දිගුකාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම සහ දිගුකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම අනුමත කර ඇති බවට සෑහීමකට පත්වීමෙන් අනතුරුව, ලංකා විදුලිබල මණ්ඩලය (CEB) කොටස් වශයෙන් බෙදා වෙන් කොට නව අනුප්‍රාප්තික සමාගම් හයක් ලියාපදිංචි කිරීමට ද, නව සමාගම්වල මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහා මණ්ඩලයෙන් අවසර හිමිවන දිනය හෙවත් නියමිත දිනය ප්‍රකාශයට පත් කිරීම සඳහා වන අවශ්‍යතා සපුරාලීමට ද මූලික ක්‍රියාමාර්ග ගනු ලැබීය. මෙම ප්‍රතිසංස්කරණ හා සමගාමීව, ජාතික බලශක්ති ප්‍රතිපත්තියට අනුකූලව දිගුකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යය නැෂනල් සිස්ටම් ඔපරේටර් (ප්‍රයිවට්) ලිමිටඩ් නම් යෝජිත සමාගම වෙත පැවරෙනු ඇත. පුළුල් ප්‍රතිපත්තියක් වන ජාතික බලශක්ති ප්‍රතිපත්තිය යටතේ විදුලිබල ක්ෂේත්‍රය අරමුණු කරගනිමින් පුනර්ජනනීය හයිඩ්‍රජන්, විදුලි වාහන ආරෝපණය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ බැටරි බලශක්ති ගබඩා පද්ධති සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලැබීමට පියවර ගනු ලැබීය.

පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීම, පද්ධති නවීකරණය කිරීම සහ ආයතනික ප්‍රතිසංස්කරණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලද 2025 වසරේ දී ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය ස්ථායි ප්‍රගතියක් අත් කරගැනීමට සමත්ව ඇත. 2025 වසරේ සමස්ත ස්ථාපිත ධාරිතාව මෙ.වො. 6,749 ක් වූ අතර, ඉන් 67% කට පමණ දායක වී ඇත්තේ ප්‍රධාන හා කුඩා ජල විදුලි, සුළංබල, සූර්යබල සහ ජෛව ස්කන්ධ ඇතුළු පුනර්ජනනීය බලශක්ති මූලාශයන් ය. 2025 වසරේ දී ශුද්ධ විදුලි උත්පාදනය ගි.වො.පැ. 17,812 ක් වී ඇති අතර, මින් ආසන්න වශයෙන් 60%ක් පමණ සපුරාගෙන ඇත්තේ පුනර්ජනනීය බලශක්ති සම්පත් වලින් ය. පුනර්ජනනීය බලශක්තිය සහ පිවිතුරු තාක්ෂණයන් ප්‍රවර්ධනය කරලීම සඳහා මෙම වසර තුළ අමාත්‍යාංශය මගින් මූලික ක්‍රියාමාර්ග රැසක් කඩිනමින් ක්‍රියාවට නංවා ඇත. මෙ.වො. 700 ඉක්මවූ සූර්ය බලශක්ති උත්පාදන ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතිය වෙත එක් කිරීම සිදුව ඇති අතර සුළං විදුලි ව්‍යාපෘති, බැටරි බලශක්ති ගබඩා ව්‍යාපෘති කිහිපයක සහ පොම්ප කළ ජල ගබඩා (ජල විදුලි) ව්‍යාපෘතියක ප්‍රාරම්භක කටයුතු සඳහා මුලපුරා ඇත. සියලුම පුරවැසියන් වෙත සාධාරණ සහ දැරිය හැකි මිලකට විදුලිය ලබා ගැනීමට ඇති හැකියාව සහතික කොට කලාපය තුළ අඩුම විදුලි මිල ගණන් සහිත රටක් බවට ශ්‍රී ලංකාව පත් කරලීමේ රජයේ පරමාර්ථය කෙරෙහි මෙම ක්‍රියාකලාපයන් ඉවහල් වී ඇත.

2025 වසරේ දී විදුලිබල ක්ෂේත්‍රය තුළ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්ම ක්‍රියාවට නංවනු ලැබූ අතර ඒවායින් බොහොමයක්ම ඇත්තේ අවසන් අදියරෙහි ය. එකම ජල විදුලි උත්පාදන ව්‍යාපෘතිය වන මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය 2025 වසර අවසන් වන විට නිම කිරීමට යෙදී තිබුණද, දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ දැඩි හානි හේතුවෙන් 2026 අවසානය දක්වා එහි කාලය දීර්ඝ කිරීමක් සිදු කෙරිනි. ජාතික සම්ප්‍රේෂණ බෙදාහැරීමේ ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (NTDND & EIP) - පැකේජය 1 සහ 2 සහ විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහායවීමේ ව්‍යාපෘතිය (SESRIP) - පැකේජය 4, මෙම වසර අවසානයේදී නිම කිරීමට යෙදී තිබූ ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘති විය. ඩෙල්ෆ්ට්, අනලතිව්, නයිනතිව් යන

කුඩා දූපත් වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීම සහ හම්බන්තොට මෙ.වො. 5/මෙ.වො.පැ.10.7 බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් ස්ථාපිත කිරීම 2025 වසරේ දී සිදු කර ගෙන යනු ලැබූ වැදගත් උත්පාදන හා විදුලි ගබඩා ව්‍යාපෘති විය. ඊට අමතරව, රට පුරා ස්ථාන 16ක මෙ.වො.160/මෙ.වො.පැ.640 තනි බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) ස්ථාපිත කිරීම, මන්නාරම මෙ.වො. 50 සුළං විදුලි බලාගාරය (තම්බපවනි අදියර II), ත්‍රිකුණාමලය (සාම්පූර්) මෙ.වො. 50 සූර්ය විදුලිබල ව්‍යාපෘතිය (අදියර I), මුල්ලික්කුලම් (මෙ.වො. 50+මෙ.වො. 50) සුළං විදුලිබල ව්‍යාපෘතිය, සියඹලාණ්ඩුව මෙ.වො. 100 භූමිය මත ඉදිකෙරෙන සූර්ය උද්‍යානය සහ කෙරවලපිටිය මෙ.වො. 350 ස්වභාවික ද්‍රව වායුවලින් (LNG) ක්‍රියාත්මක ඒකාබද්ධ චක්‍රීය දෙවන බලාගාරය වන සහස්දනවි බලාගාරය සංවර්ධනය කිරීම වැනි ව්‍යාපෘති කිහිපයක්ම පෞද්ගලික ආයෝජකයින්ගේ සහාය ඇතිව ආරම්භ කර ඇත.

ජාතික විදුලිබල පද්ධතියේ විදුලි බෙදාහැරීමේ කටයුතු වැඩිදියුණු කිරීමටත් නවීකරණය කිරීමටත් පියවර ගෙන ඇත. සමස්ත අංශ හතරෙහිම උසස් මණුකරණ යටිතල පහසුකම් සහිත (AMI) සහාය අධීක්ෂණ පාලන හා දත්ත උකහාගැනුම් පද්ධතියක් (SCADA) ස්ථාපිත කිරීම හරහා බෙදාහැරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගෙන ඇත. ඊට අමතරව, ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) විසින් සිය විදුලිබල පද්ධතිය භූගත කේබල් ආදිය යොදා ගනිමින් නවීකරණය කිරීම පිළිබඳව ද අවධානය යොමු කර ඇත.

එමෙන්ම, බලශක්ති උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම සහ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අදාළ කටයුතු සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO), ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) ඇතුළු විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රධාන ආයතන සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සහ අධීක්ෂණය සපයනු ලැබීමට අමාත්‍යාංශය අඛණ්ඩව කටයුතු කරනු ලැබීය. ශ්‍රී ලංකාව තුළ න්‍යෂ්ටික බලශක්ති යෙදවුම් සංවර්ධනය කිරීම හා අදාළව සිය කටයුතු නොනවත්වා ඉදිරියට ගෙන යාමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (SLAERC) සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB) විසින් කටයුතු කරනු ලැබ ඇත. විදුලිබල උත්පාදනය කිරීම පිණිස න්‍යෂ්ටික බලශක්තිය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ සහ සැලසුම් කිරීමේ වැඩසටහන ද 2025 වසර තුළ අඛණ්ඩව ඉදිරියට ගෙන ගොස් ඇත. පසුව, 2025 ඔක්තෝබර් 18 දිනැති අංක 2458/65 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතට පවරනු ලැබීය. ඊට අමතරව, ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC), ශ්‍රී ලංකා එනර්ජීස් (SLE) සහ LTL හෝල්ඩින්ග්ස් යන සමාගම් ද එම කාල සීමාව තුළ දී සිය මෙහෙයුම් හා සංවර්ධන කටයුතු නොකඩවා සිදු කර ගෙන ගොස් ඇත.

2025 නොවැම්බර් 28 වන දින ශ්‍රී ලංකාවට බලපෑ දිට්වා කුණාටුවෙන් ජාතික යටිතල පහසුකම් පද්ධතිවලට, විශේෂයෙන්ම විදුලිබල ජාලයට පෙර නොවූ ආකාරයෙන් දැඩි බලපෑමක් එල්ල විය. ජල විදුලිය, සුළං බලශක්ති සහ සූර්ය බලශක්ති වත්කම්, සම්ප්‍රේෂණ කුළුණු සහ ධ්‍රැව හැන් මෙන්ම විදුලි මනු වැනි උපයෝගිතා උපකරණවලට ද බලපෑම් ඇති කරමින් විදුලිබල උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ සහ බෙදා හැරීමේ කටයුතුවලට සිදු වූ බරපතල බලපෑමින් සිදුවූ හානිය ශ්‍රී.ලං.රු. බිලියන 23.9 (ඇමරිකානු ඩොලර් මිලියන 78.5) ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. දින 14ක් දක්වා සිදු වූ විදුලි ඇනහිටීම්වලින් ද මිලියන 4.1කට වඩා වැඩි පාරිභෝගිකයින් සඳහා මෙන්ම අත්‍යවශ්‍ය පහසුකම් (රෝහල්, ජල සැපයුම) සහ ප්‍රධාන නිෂ්පාදන හා කෘෂිකාර්මික කටයුතු සඳහා වන සැපයුම් අඩාල වීමෙන් ද සිදුවූ ඇස්තමේන්තුගත අලාභය ශ්‍රී.ලං.රු. බිලියන 5.8 (ඇමරිකානු ඩොලර් මිලියන 19.2) වී ඇත. හදිසි ප්‍රතිචාර සේවා, මහජන ආරක්ෂාව, සෞඛ්‍ය සේවා, ජල සැපයුම, සන්නිවේදනය මෙන්ම සමස්ත ආර්ථිකය සාමාන්‍ය තත්ත්වයට පත් කරමින් දින දෙකක් තුළ විදුලි සැපයුම 87%ක් යථා තත්ත්වයට පත් කෙරිය. සියලුම හානි යථා තත්ත්වයට පත් කොට වර්තමානය වන විට ඒවා ක්‍රියාකාරී මට්ටමට පත් කර ඇත.

ජාතික බලශක්ති සුරක්ෂිතතාව සවිබල ගැන්වීමේ සහ අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීමේ අරමුණ පෙරදැරිව ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ

ප්‍රතිසංස්කරණ සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කරනු ලැබීමේ කාර්යයේ දී සුවිශේෂී ප්‍රගතියක් අත් කර ගැනීමට 2025 වසර තුළ මෙම අමාත්‍යාංශය සමත් වී ඇත.

සපුගස්කන්ද තෙල් පිරිපහදුව වැඩිදියුණු කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා මුලපුරා ඇති අතර, ඒ හා සමගාමීව උසස් මෙහෙයුම් කාර්යක්ෂමතාවක් සහ ධාරිතාවක් සහිත නව පිරිපහදුවක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කරනු ලැබීය. ඒ හා සමගම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) සතු ටැංකි 24 සහ හවුල්කාර සමාගම් විසින් මෙහෙයුම් සිදු කරනු ලබන ටැංකි 61 ඇතුළුව ඛනිජ තෙල් ගබඩා පහසුකම් ක්‍රියාත්මක කිරීමෙන් සහ ප්‍රයෝජනයට යොදා ගැනීමෙන් හිමිවන ආර්ථික ප්‍රතිලාභ තවත් ඉහළ නංවාගැනීම සඳහා ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ගිවිසුම් සමාලෝචනය කිරීම ද නව ව්‍යාපාර ආකෘතියක් සකස් කිරීම ද සිදු කරනු ලැබීය.

මෙම වසර තුළ උපායමාර්ගික ඉන්ධන සැපයුම් සහ බෙදාහැරීමේ යටිතල පහසුකම් ව්‍යාපෘති කිහිපයක් ද ක්‍රියාවට නංවා ඇත. මෙරට පුරා ඉන්ධන බෙදාහැරීම ශක්තිමත් කිරීම සහ අඛණ්ඩ සැපයුමක් සහතික කිරීම සඳහා දුම්රිය ඉන්ධන ගබඩා සහ බෙදාහැරීමේ පද්ධතියේ වෙනස්කම් ආරම්භ කරනු ලැබීය. ඊට අමතරව, ඉන්ධන ගොඩබෑමේ සහ බෙදා හැරීමේ මෙහෙයුම් විශ්වසනීය ලෙස සිදුවීම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහතික වන අයුරින් කොළඹ වරාය සහ කොලොන්නාව පර්යන්තය සම්බන්ධ කෙරෙන, හානියට පත්ව තිබූ නළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත (පුද්ගලික) සමාගමේ (CPSTL) ආයෝජන හරහා සිදු කරනු ලැබීය.

ඛනිජ තෙල් සහ ස්වාභාවික වායු ගවේෂණයට අදාළ කටයුතු කඩිනම් කිරීමට ද අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ලැබීය. මන්නාරම සහ කාවේරි ද්‍රෝණි තුළ හඳුනාගනු ලැබූ ස්වාභාවික වායු සහ අනෙකුත් පොසිල ඉන්ධන සම්පත් ගවේෂණය කිරීම සහ නිස්සාරණය කිරීම සඳහා නව ගිවිසුම් සහ ප්‍රාරම්භක කටයුතු ඉදිරියට ගෙන ගොස් ඇත. ශ්‍රී ලංකාවේ බලශක්ති ස්වයංපෝෂිතභාවය දිගුකාලීනව නඟාසිටුවීමට මෙන්ම ආනයනිත පොසිල ඉන්ධන මත යැපීම අවම කිරීමෙහිලා මෙම මූලික ක්‍රියාමාර්ග සැලකිය යුතු දායකත්වයක් හිමි කරදෙනු ඇතැයි අපේක්ෂා තබා ඇත.

තවද, ඛනිජ තෙල් කර්මාන්තය ශක්තිමත් කිරීම සඳහා වූ ප්‍රතිපත්ති සහ නියාමන රාමු සකස් කරනු ලැබීම සඳහා මෙම අමාත්‍යාංශයේ ඛනිජ තෙල් අංශය විසින් සක්‍රීය දායකත්වයක් සපයමින් ඇත. ලිහිසි තෙල් සහ නෞකා ඉන්ධන සැපයුම් කර්මාන්ත සඳහා වූ ප්‍රතිපත්ති රාමු මේ වන විටත් අවසන් සැකසුම් අදියරෙහි පසුවෙමින් ඇත. මීට අමතරව, ජෙට් A-1 ඉන්ධන සහ තාර (Bituman) ආනයනය පාලනය කරන ප්‍රතිපත්ති රාමු සකස් කිරීම සඳහා ද කමිටු පත් කොට ඇත. නියාමන අධීක්ෂණය ඉහළ නැංවීම, වෙළඳපොළ කාර්යක්ෂමතාව සහ තරඟකාරිත්වය ප්‍රවර්ධනය කරනු ලැබීම සහ ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අඛණ්ඩ ඛනිජ තෙල් නිෂ්පාදන සැපයුමක් සහතික කිරීම මෙම මුලපිරීම් හි අරමුණ වී ඇත.

ඛනිජ තෙල් සැපයීම, ගබඩා කිරීම, බෙදා හැරීම, ගවේෂණය කිරීම මෙන්ම ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු ඵලදායීව සම්බන්ධීකරණය කිරීම සහතික කරමින්, ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ ප්‍රධාන ආයතන වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සහ ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL) ඇතුළු ආයතන සඳහා ප්‍රතිපත්තිමය මග පෙන්වීම ලබා දීමට සහ කටයුතු අධීක්ෂණය කිරීමට අමාත්‍යාංශය විසින් අඛණ්ඩව ක්‍රියා කර ඇත.

මීට අමතරව, විදුලි වාහන ආරෝපණය කිරීම සඳහා මධ්‍යස්ථාන ජාලයක් දිවයින පුරා ව්‍යාප්ත කිරීමට කටයුතු කෙරෙමින් ඇති අතර, මේ වන විට මධ්‍යස්ථාන හතක් ක්‍රියාත්මක තත්ත්වයෙන් ද 2025 වසර අග වන විට තවත් මධ්‍යස්ථාන තුනක් ඉදිකෙරෙමින් ද ඇත.

මනා සවිමත් පාලනය, ආයතනික සම්බන්ධීකරණය, යටිතල පහසුකම් නවීකරණය සහ තිරසර බලශක්ති පිළිවෙත් ඔස්සේ මෙම අමාත්‍යාංශය ඇප කැප වී ක්‍රියා කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය පරිවර්තනයකට ලක් කිරීම උදෙසා ය. ප්‍රත්‍යස්ථ හෙවත් ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු, සුරක්ෂිත සහ තිරසරබව සහතික කළ බලශක්ති අනාගතයක් මෙරටට උදා කරදීම වෙනුවෙන් අඛණ්ඩව ඉදිරියටත් මෙම මුලපිරීම් ඔස්සේ දායකත්වය සපයනු ලැබීමට මෙම අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ඇත.

1.2 අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර

දැක්ම

"ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ බලශක්ති කේන්ද්‍රය බවට පත් කිරීම"

මෙහෙවර

විදුලිබල අංශය

"ජාතික ආර්ථික සෞභාග්‍ය උදෙසා ඇවැසි ගුණාත්මක, විශ්වසනීය, තිරසර හා මිල දැරිය හැකි විදුලිබල සැපයුමක් සහතික කිරීම"

මෙහෙවර

බලශක්ති අංශය

"ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි, අඩු වියදම් බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කරමින් ඉන්ධන ආනයනය කළමනාකරණය හා දේශීයව නව බලශක්ති ප්‍රභවයන් බලශක්ති මිශ්‍රණයට එකතු කිරීම සහ නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව බලශක්ති විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය මඟින් පරිසර හිතකාමී තිරසර බලශක්ති සැපයුමක් තහවුරු කිරීම"

1.3 බලශක්ති අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන්

2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන ගැසට් නිවේදනයට අනුව බලශක්ති අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන් පහත පරිදි වේ;

01. සූර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනා දී මූලාශ්‍රයන් මගින් පුනර්ජනනීය බලශක්ති, විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය.
02. ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතා සපුරාලීම සහ බලශක්ති සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම.
03. බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම.
04. දිගුකාලීන අවශ්‍යතා පදනම් කරගත් විදුලි ජනන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
05. බලශක්ති සම්ප්‍රේෂණය හා බෙදා හැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.
06. ජනනය කරනු ලබන විදුලි බලය උපරිම කාර්යක්ෂමතාව සහිතව භාවිත කිරීම සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් නිර්මාණය කිරීම.
07. විදුලිය ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩු කිරීම සහ ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම.
08. පවතින අධික වියදම් සහිත විදුලි උත්පාදන ප්‍රභවයන් අඩු වියදම්, පරිසර හිතකාමී, පුනර්ජනනීය ප්‍රභවයන් සමඟ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
09. ජාතික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල ආයෝජන සඳහා දේශීය සමාගම්වලට සමාන අවස්ථා ලැබෙන බව සහතික කිරීම.
10. කාර්මික අපද්‍රව්‍ය භාවිතයෙන් බලශක්ති උත්පාදනය වැඩි කිරීම.
11. සමුපකාර මූලධර්ම මත පදනම්ව බලශක්ති ඒකක ලෙස ක්ෂුද්‍ර ජාල ස්ථාපිත කිරීම.
12. බලශක්ති ක්ෂේත්‍රයේ උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ ආයෝජන අවස්ථා ඇති කිරීම.
13. විශේෂයෙන් පවතින ගිවිසුම් අලුත් කිරීම මගින් කුඩා පරිමාණ ජල විදුලිබල උත්පාදනය සඳහා නැවත ආයෝජනය කිරීම දිරිමත් කිරීම.
14. විදුලි බිල යාවත්කාලීන කිරීම සහ ඛනිජ තෙල් සහ ගෑස් සඳහා මිල සූත්‍රය ආදේශය සඳහා වඩාත් සාධාරණ හා විනිවිද පෙනෙන ක්‍රමවේදයක් හඳුන්වාදීම.
15. දිගු කාලීන අවශ්‍යතා මත බලශක්ති උත්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
16. ආයතනික කළමනාකරණ මට්ටමින් සිදුවන පාඩු සහ විදුලි ජනන හා බෙදාහැරීමේ පද්ධතියට සිදුවන තාක්ෂණික හානි අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
17. විදුලි වාහන භාවිතයට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම.
18. ශ්‍රී ලංකාව බලශක්ති වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත්කිරීම සඳහා කටයුතු කිරීම.
19. හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම.
20. ග්‍රාමීය විද්‍යුතනය.
21. ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සහ ස්වාභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදු කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම.
22. ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු.
23. ඛනිජ තෙල් සහ ස්වාභාවික ගෑස් ගවේෂණය සහ ඒ ආශ්‍රිත කටයුතු.
24. ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් සහ අතුරු නිෂ්පාදන නිපදවීමට අදාළ කටයුතු, තොග පවත්වා ගැනීම, නිෂ්පාදනය හා බෙදා හැරීම.
25. ඉන්ධන සැපයීම සහ බෙදා හැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
26. බලශක්ති සම්පත් පාලනය, නියාමනය සහ උපයෝජනය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.
27. තෙල් පිරිපහදු කිරීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම සහ පෙට්‍රෝලියම් අතුරු-නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත දිරිමත් කිරීම.
28. ඉන්ධන සැපයීමේ විශ්වසනීයත්වය, අඛණ්ඩතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

1.4 සංවිධාන සටහන

- විදුලිබල අංශය



1.4 සංවිධාන සටහන

අ බලශක්ති අංශය



1.5 අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ හා කාර්යයන්

- **මානව සම්පත් අංශය**
  - අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණය සහ සුභසාධන පහසුකම් සැලසීම.
  - අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ගේ පරිපාලන කටයුතු සිදු කිරීම සහ තම කාර්යයන් ඉටු කිරීමේදී නිලධාරින්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීමට ක්‍රියා කිරීම.
  - අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම
  - දැනුම, අත්දැකීම් සහ ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, සම්මේලන සහ වැඩමුළු සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගී කිරීමට කටයුතු සැලසීම
  - පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සකස් කිරීම සහ පාර්ලිමේන්තු කාරක සභා සඳහා පහසුකම් සැලසීම.
  - බලශක්ති අංශයේ ලේඛනාගාරය නඩත්තු කිරීම.
  - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC), ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL), ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL), ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත සමාගම (TPTL), ලංකා විදුලිබල මණ්ඩලය (CEB), ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO) සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) ඇතුළු අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා මානව සම්පත් කළමනාකරණ පහසුකම් සැලසීම.

- **කාර්ය සම්පාදන අංශය**
  - අමාත්‍යාංශයේ සේවය කරන සියලුම නිලධාරීන්ට සහ අමාත්‍යාංශයට අදාළව සියලුම සුළු ප්‍රසම්පාදන කාර්යයන් සහ අවශ්‍යතා ඉටු කිරීම.
  - සියලුම නිලධාරීන්ගේ සහ ගොඩනැගිලි පරිශ්‍රයේ අවශ්‍යතා සපුරාලීම, මහජනතාවගේ ඉල්ලීම් සහ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ සේවක අයිතිවාසිකම්වලට අදාළ ගැටළු විසඳීම.
  - අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා හිතකර කාර්යාල පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අමාත්‍යාංශය පිහිටා ඇති ගොඩනැගිල්ලේ යටිතල පහසුකම් සහ නඩත්තු කටයුතු නිසි ලෙස පවත්වාගෙන යාම.
  - යටිතල පහසුකම් සහ නඩත්තු කටයුතු යටතේ අමාත්‍යාංශයේ දුරකථන, පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර නඩත්තු කිරීම.
  - නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ නිලධාරීන්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීම, අලුත්වැඩියා කිරීම සහ නඩත්තු මඟින් ඔවුන්ගේ දෛනික කටයුතු සඳහා පහසුකම් සැලසීම.
  - අමාත්‍යාංශය යටතේ ඇති වාහන 45 ක් නිසි ලෙස නඩත්තු කිරීම සහ අවශ්‍යතා අනුව නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැපයීම.
  - බාහිර ආයතන සහ පුද්ගලයින් විසින් අමාත්‍යාංශ වෙත යොමු කරන ලියකියවිලි අදාළ අංශ වෙත යොමු කිරීම.
  - අමාත්‍යාංශය විසින් බාහිර පාර්ශවයන් වෙත නිකුත් කරන ලිපි, වාර්තා සම්බන්ධයෙන් කටයුතු කිරීම.
  - මහජනතාව විසින් යොමු කරන ඉල්ලීම්, පැමිණිලි සහ යෝජනා සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම.
  - විවිධ ආගමික සහ පෙරහැර කටයුතු සඳහා එම ආගමික ස්ථානවලින් ලැබෙන ඉල්ලීම් ලිපි සඳහා, ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන මඟින් ඇස්තමේන්තු අනුව අරමුදල් ලබා දීමට පියවර ගැනීම.
  - මෙම අමාත්‍යාංශයේ සහ ඊට අනුබද්ධිත ආයතන (11) හි කාර්යසම්පාදන පරිපාලන කාර්යයන් ඉටු කිරීම, කලින්

කලට මතුවන ගැටළු විසඳීමට අවශ්‍ය පියවර ගැනීම සහ නිලධාරීන්ගේ රැකියා තෘප්තිය පවත්වා ගැනීම.

- **සංවර්ධන අංශය**
  - පුනර්ජනනීය බලශක්ති / පරමාණුක බලශක්ති හා විකිරණ ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම.
  - පුනර්ජනනීය බලශක්ති ජනනයන් ජාතික පද්ධතියට එකතු කර ගැනීමේ ගාස්තු නිර්ණය කිරීම.
  - ව්‍යාපෘති මූල්‍යනය සහ දායකත්ව සම්බන්ධීකරණය - බහුපාර්ශවීය සම්බන්ධීකරණය.
  - පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම.
  - පුනර්ජනනීය බලශක්ති / පරමාණුක බලශක්ති හා විකිරණ ක්ෂේත්‍රයට අදාළ විදේශ ආයතන සමග සම්බන්ධීකරණය.
  - පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ, උපකරණ හා අමුද්‍රව්‍ය සඳහා රේගු නිශ්කාෂණ හා බදු සහන ඉල්ලීම් නිර්දේශ කිරීම.
  - පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා පැමිණෙන විදේශීය උපදේශකවරුන් / කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය පිවිසුම් වීසා / පදිංචි වීසා නිකුත් කිරීම / දීර්ඝ කිරීම සඳහා නිර්දේශ ලබා දීම.
  - පෙරභාග, මධ්‍ය සහ පසුභාග ඛනිජ තෙල් කර්මාන්තයට අදාළ වන සංවර්ධන ප්‍රතිපත්තිමය තීරණ සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
  - ඛනිජ තෙල් හා ස්වාභාවික වායු ගවේෂණය සහ නිෂ්පාදනයට අදාළ සියලු සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
  - ඛනිජ තෙල් අංශයට අදාළ සංවර්ධන හා නියාමන කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය.
  - ඛනිජ තෙල් නිෂ්පාදන මිල නියම කිරීම, ඉන්ධන සහනාධාර ලබාදීම, බෙදාහැරීම, වෙළඳාම සහ අලෙවිකරණයට අදාළ ගැටලු ආදියේදී මුදල් අමාත්‍යාංශය හා අනෙකුත් රාජ්‍ය ආයතන සමබන්ධීකරණය කිරීම.
  - ශ්‍රී ලංකාව තුළ නැව් තෙල් වෙළඳපොළ, තාර වෙළඳපොළ සහ ලිහිසි තෙල් වෙළඳපොළ සම්බන්ධ කටයුතුවල යෙදී සිටින සුදුසු පාර්ශව වෙත බලපත්‍ර නිකුත් කිරීම, නිකුත් කරන ලද බලපත්‍ර අලුත් කිරීම සහ වෙනත් විශේෂිත වූ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමට පෞද්ගලික අංශයට අවසර ලබාදීම.

- **විදුලිබල හා විදුලිබල ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ අංශය**
  - විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කරුණු සහ විශාල හා මධ්‍ය පරිමාණ විදුලි උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
  - ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය සඳහා පරිසර හිතකාමී ඉන්ධනයක් ලෙස ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) හඳුන්වාදීමේ ක්‍රියාවලිය මෙහෙය වීම.
  - විදුලිබල ක්ෂේත්‍රය සඳහා ආයතනික ප්‍රතිව්‍යුහකරණයට අදාළව සිදු කරන සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.
  - තාප විදුලිබලාගාර ව්‍යාපෘති සහ පුනර්ජනනීය විදුලි බලාගාර ව්‍යාපෘති අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒවාට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු.
  - ඉහත සඳහන් ව්‍යාපෘතිවලට අදාළව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- **තාක්ෂණ අංශය**
  - ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ විධිවිධාන සංශෝධනය කිරීම, රෙගුලාසි හා රීති පැනවීම, ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් සිදු කිරීම ඇතුළුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය කිරීම.

- විදුලි ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සඳහා වන බලපත්‍ර ලබාදීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමට අවශ්‍ය වන ගරු අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- ජාතික විදුලිබල ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සම්බන්ධ ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් සහ විදුලි ගාස්තු පැනවීම්, බලපත්‍ර නිකුත් කිරීම් ඇතුළුව මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය කිරීම.
- ජලවිදුලි සහ තාප විදුලි (ගල් අඟුරු, ඉන්ධන තෙල් සහ පරමාණු බලශක්ති වැනි) බලාගාරවල නිෂ්පාදනයන් අධීක්ෂණය කිරීම හා මෙහෙයවීම. විදුලි සැපයුම් බිඳවැටීම් වැළක්වීමට, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් පද්ධතිවල සියලුම ඌනතා වැළැක්වීමට හා අඩුකිරීමට අදාළ සියලුම තාක්ෂණික කටයුතු.
- ජල විදුලිය, පරමාණු බලශක්ති, ගල් අඟුරු තාපබල විදුලි, අනෙකුත් තාපබල විදුලි සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති වැනි ප්‍රභවයන් යොදාගනු ලබන සියළුම විදුලි බලාගාර ව්‍යාපෘතීන් වල ඉදිකිරීම් වලට අදාළ තාක්ෂණික කටයුතු.
- බලශක්ති සැලසුම් කිරීමට අදාළ සියලු කටයුතු අධීක්ෂණය කිරීම හා මෙහෙයවීම.
- බලශක්ති සංරක්ෂණය සහ ඉල්ලුම් හා සැපැයුම් කළමනාකරණයට අදාළ කටයුතු.
- ඉන්දියා - ශ්‍රී ලංකා විදුලිජාල පද්ධති අන්තර් සම්බන්ධ කිරීමට (India – Sri Lanka Grid Interconnection) යෝජිත ව්‍යාපෘතියට අදාළ කටයුතු.
- සුනිත්‍ය බලශක්තිය උපයෝගී කරගනිමින් ශ්‍රී ලංකාව තුළ විදුලි රථවාහන ප්‍රවාහනය ප්‍රචලිත කිරීමේ අරමුණ හා සමගාමීව විදුලි වාහන ආරෝපණය කිරීමේ යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම.
- විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයට අදාළව SAARC, BIMSTEC, ESCAP වැනි අන්තර්ජාතික සංවිධාන සමඟ සිදුවන තාක්ෂණික කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- තාක්ෂණ අංශයට අදාළ විෂය පථය යටතේ වන සියලුම අවබෝධතා ගිවිසුම් (MOU) සහ සහයෝගිතා ගිවිසුම් සම්බන්ධයෙන් අවශ්‍ය වන අනුමැතියන් සහ ක්‍රියාත්මක කිරීම් සඳහා සම්බන්ධීකරණ කටයුතු කිරීම.

ක්‍රමසම්පාදන අංශය

- අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලසුම්, වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ ප්‍රගති වාර්තාව සකස් කිරීම සහ අදාළ පාර්ශව වෙත ඉදිරිපත් කිරීම.
- විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති යෝජනා සකස් කිරීම, සමාලෝචනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.
- සංවර්ධන ව්‍යාපෘති සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම.
- ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම සහ කාලීනව ප්‍රගති වාර්තා සකස් කිරීම.
- විදුලිබල අංශයේ ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්ව ක්‍රියාත්මක කිරීම සහ තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ ක්‍රියාකාරකම් අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය.
- කාබන් වෙළඳාම් පහසුකම (carbon trading facility) සඳහා වන ඉල්ලීම් සම්බන්ධයෙන් සහ කාබන් ශුද්ධ ශුන්‍ය ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, රේඛීය අමාත්‍යාංශ සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු මගින් ඉල්ලා සිටින විවිධ වාර්තා සහ සැලසුම් සකස් කිරීම.
- බලශක්ති සංක්‍රාන්ති පනත සහ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය

මාර්ගවලට අදාළව කටයුතුවල නිරත වීම.

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනවල වාර්ෂික වාර්තා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

◆ **ප්‍රසම්පාදන අංශය**

- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු (HLPC/ SHLPC, SSHLPC) හා සම්බන්ධ කටයුතු සිදුකිරීම.
- උපදේශක ප්‍රසම්පාදන කමිටු අමාත්‍යාංශ මට්ටමට (CPCM) අදාළ කටයුතු සිදුකිරීම.
- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිට (CANC) හා සම්බන්ධ කටයුතු සිදුකිරීම.
- අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු (MPC) හා සම්බන්ධ කටයුතු සිදුකිරීම.
- ප්‍රසම්පාදන අභියාචනයට අදාළ කටයුතු සිදුකිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශය සඳහා අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.
- විවිධ ප්‍රසම්පාදන කමිටු සඳහා නිලධාරීන් පත් කිරීම සම්බන්ධීකරණය කිරීම, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවල (SSCAPC) කටයුතු සිදු කර ගෙන යාම සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.
- මුදල් අමාත්‍යාංශය සමග සමස්ත ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන අධීක්ෂණය කිරීම, නිරීක්ෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී උපදේශනය ලබා දීම.

◆ **මූල්‍ය අංශය**

- පාර්ලිමේන්තුව විසින් අදාළ වර්ෂය සඳහා සම්මත කරන ලද අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයන් අනුව අමාත්‍යාංශයේ සියලුම වියදම් කළමනාකරණය කිරීම.
- අමාත්‍ය කාර්යමණ්ඩල හා අමාත්‍යාංශ කාර්යමණ්ඩලයේ වැටුප් සකස් කිරීම, ගෙවීම් හා වැටුප් සම්බන්ධ අනිකුත් කටයුතු සිදු කිරීම.
- අමාත්‍ය කාර්යමණ්ඩලයට හා අමාත්‍යාංශ කාර්යමණ්ඩලයට අවශ්‍ය සියලුම වට්ටෝරු භාණ්ඩ, ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ විධිමත්ව ඇණවුම් කිරීම හා අංශවල අවශ්‍යතා අනුව ඒවා නිකුත් කිරීම.
- අමාත්‍යාංශය සතු නිල බැංකු ගිණුම නිසි අයුරින් පවත්වාගෙන යාම.
- ඉදිරි මුදල් වර්ෂය සඳහා අමාත්‍යාංශයේ වියදම්වලට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයන් ගණනය කරමින් අයවැය ඇස්තමේන්තු සකස් කිරීම.
- රජයේ ආදායම් වශයෙන් අමාත්‍යාංශය වෙත ලැබෙන මුදල් හා අමාත්‍යාංශයේ කටයුතුවලදී දරනු ලබන වියදම් සඳහා සම්මත වර්ගීකරණය කිරීම හා ඒ සම්බන්ධ වාර්තා සකස් කිරීම හා පවත්වා ගෙන යාම.
- අමාත්‍යාංශයට දෛනිකව ලැබෙන ආදායම් හා සිදු කරන වියදම් අනුව ඒ ඒ මාසවලට ගිණුම් පිළියෙල කිරීම හා එම ගිණුම්වල තොරතුරු මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම.
- වාර්ෂිකව අමාත්‍යාංශයේ සියලුම ගණුදෙනු නියෝජනය වන පරිදි විසර්ජන ගිණුම පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- පාර්ලිමේන්තුව විසින් අදාළ වර්ෂය සඳහා සම්මත කරන ලද අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයන් අනුව අමාත්‍යාංශයේ සියලුම වියදම් කළමනාකරණය කිරීම.

- **අභ්‍යන්තර විගණන අංශය**
    - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම් අනුව අවදානම් මත පදනම්ව අමාත්‍යාංශයේ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.
    - අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
    - අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනයන්ට අදාළව කාර්යයන් ඉටු කිරීම.
    - ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ උපදෙස් මත විශේෂ විමර්ශන පැවැත්වීම.
    - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි අමාත්‍යාංශයේ විගණන සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
    - අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් පරිදි විශේෂ විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම.
    - අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අභ්‍යන්තර විගණන අංශවල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
    - විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.
    - කාර්තුමය වාර්තා සකස් කිරීම.

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

- **ලංකා විදුලිබල මණ්ඩලය**

ලංකා විදුලිබල මණ්ඩලය (CEB), රාජ්‍ය ව්‍යවසායක් ලෙස 1969 අංක 17 දරන පනත යටතේ ස්ථාපිත කර ඇති අතර ශ්‍රී ලංකාවේ විදුලිය ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම නියාමනය කිරීම සඳහා කිහිප වරක් සංශෝධනය කර ඇත. 2013 අංක 31 දරන පනතින් සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ලංකා විදුලිබල මණ්ඩලය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) යටතට පත් කරන ලදී. 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත 2024 ජූනි 27 දින සම්මත කරන ලද අතර 2025 අංක 14 දරන පනත එහි සංශෝධනයකි.

- **සී/ස. ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO) යනු 1982 අංක 17 දරන සමාගම් පනත සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 1983 වසරේදී සංස්ථාගත කරන ලද සීමාසහිත සමාගමකි. බස්නාහිර පළාතේ සිට දකුණු පළාත දක්වා වෙරළ බඩ කලාපය ආවරණය වන පරිදි බලය පවරන ලද ප්‍රදේශවල විදුලිය බෙදා හැරීම පිණිස ලංකා විදුලි (පුද්ගලික) සමාගම ස්ථාපිත කර ඇත. 54.84%ක කොටස් හිමිකාරිත්වයක් සමගින් ලංකා විදුලිබල මණ්ඩලයේ අනුබද්ධිත ආයතනයක් ලෙස පවතින ලංකා විදුලි (පුද්ගලික) සමාගම මහා භාණ්ඩාගාරය වෙත 43.56%ක ද, නාගරික සංවර්ධන අධිකාරිය වෙත 0.79%ක ද, ප්‍රාදේශිය පරිපාලන ආයතන (Local authorities) වෙත 0.81%ක සුළුතර කොටස් හිමිකාරීත්වයක් සහිත ආයතනයකි. මීගමුව සිට ගාල්ල දක්වා වූ ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරය ඔස්සේ ප්‍රධාන ආර්ථික කලාපය ආවරණය වන පරිදි එහි බලයලත් ප්‍රදේශය තුළ විදුලිය බෙදා හැරීම සිදුකරනු ලැබීම මෙහි ප්‍රධාන අරමුණයි. ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් පාරිභෝගිකයින් 631,000කට වැඩි ප්‍රමාණයක් සඳහා සේවා සපයනු ලබයි. 2009 අංක 20 දරන විදුලි පනත මගින්, සමාගම වෙත බෙදාහැරීමේ බලපත්‍රයක් නිකුත් කිරීමත් සමඟ ලංකා විදුලි (පුද්ගලික) සමාගම පසුකාලීනව මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමනය යටතට ගෙන එන ලදී.

- **ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**

2007 ඔක්තෝබර් 1 වන දින තිරසාර බලශක්ති සංවර්ධනයක් උදෙසා වන ජාතික ආයතනය වශයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) පිහිටුවනු ලැබූයේ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය, බලශක්ති කළමනාකරණය, ප්‍රතිපත්ති සංවර්ධනය සහ අරමුදල් කළමනාකරණය යනුවෙන් වූ මූලික අරමුණු හතරක් සහිතවයි. 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත මගින් මෙම අධිකාරිය සංස්ථාගත කර ඇත. ශ්‍රී ලංකාව වසර 2050 වන විට කාබන් උදාසීනත්වය ළඟා කරගැනීම සඳහා මුලපුරන ලද්දේ වසර 2030 වන විට මෙම ඉලක්කය ඔස්සේ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය 70%ක් ලෙස සාක්ෂාත්

කර ගැනීමේ අපේක්ෂාගත ඉලක්කය ද ඇතිවයි. එම ඉලක්කයෙන් 60%ක් මේ වන විටත් සපුරා ගැනීමට සමත් වෙමින් වසර 2024 වන විට සැලකිය යුතු ප්‍රගතියක් ළඟා කරගෙන තිබේ.

- **සී/ස. LTL හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම**

"ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ්" ලෙස මින් පෙර හඳුන්වනු ලැබූ සීමාසහිත LTL හෝල්ඩින්ග්ස් සමාගම (LTLH) ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ තවත් ආයතන තුනක් අතරේ ක්‍රියාත්මක රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් වන අතර එහි හිමිකාරිත්වය LTL සමූහයේ (LTL Group) සහ සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ (WCPL) සේවකයින් සතුව පවතී. වත්මන් කොටස් හිමිකාරීත්ව ව්‍යුහයට අනුව, ඉන් 35% ක් ලංකා විදුලිබල මණ්ඩලය සතුව ද, 28% ක් සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් සමාගම සතුව ද පවතින අතර, ඉතිරි 37%ක කොටස් LTL සමූහයේ සේවකයින් නියෝජනය කරන සමාගම් දෙකකට (02) අයත් වේ.

- **ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව**

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (සභාව) පිහිටුවනු ලබා ඇත්තේ 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත (පනත) යටතේ 2015 ජනවාරි 1 වන දින දී ය. එවකට මෙම සභාව බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් පැවතුනි. පනතේ විධිවිධානවලට අනුව, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවට පහත කාර්යයන් පැවරී ඇත;

(අ) මහජනතාව, විකිරණ ශිල්පීන්, රෝගීන් සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක වීම, බලපත්‍ර නිකුත් කිරීම, පරීක්ෂා කිරීම සහ ආනයන සහ අපනයන පාලන වැඩසටහන් සිදුකිරීම මගින් අයනීකරණ විකිරණ සම්බන්ධ භාවිතාවන් සහ ප්‍රභවයන් නියාමනය කිරීම.

(ආ) විකිරණ ප්‍රභවයන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව සහතික කිරීම.

(ඇ) පනතේ විධිවිධාන සහ බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් බලාත්මක කළ හැකි ක්‍රියාමාර්ග ගැනීම.

(ඈ) න්‍යෂ්ටික යෙදවුම්වලට අදාළව ආරක්ෂාව, සුරක්ෂිතබව සහ ආරක්ෂණ ක්‍රම පිළිබඳව ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති ගිවිසුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම් ඉටු කිරීමට පියවර ගැනීම.

- **ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය**

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB) යනු එවකට බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ රජයේ ප්‍රමුඛතම න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ ආයතනකි. ජාතික සංවර්ධන අරමුණු සඳහා න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම සඳහා 2014 අංක 40 දරන පරමාණුක බලශක්ති පනත මගින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත බලතල පැවරී ඇත. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් අදාළ සේවාවන් ඔස්සේ, පර්යේෂණ සහ සංවර්ධන (R&D) කටයුතු හරහා න්‍යෂ්ටික තාක්ෂණයේ හිතකර යෙදවුම් ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම සිදුකරනු ලබන අතර නියාමන අවශ්‍යතා සපුරමින් විකිරණ ආරක්ෂණ සේවා සැපයීම ද ආරක්ෂාව, සුරක්ෂිතභාවය සහ ගුණාත්මකභාවය සහතික කිරීම ද සිදුකරයි. න්‍යෂ්ටික තාක්ෂණය යටතේ ශ්‍රී ලංකාවේ වෛද්‍ය, කෘෂිකාර්මික, කර්මාන්ත, බලශක්ති සහ පාරිසරික ක්ෂේත්‍රයන්හි සංවර්ධනය කෙරෙහි සැලකිය යුතු දායකත්වයක් සැපයීමේ හැකියාව ඇති බොහෝ ක්ෂේත්‍රයන්ට අදාළ පුළුල් පරාසයක යෙදවුම් පවතී.

- **සී/ස. ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම**

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) යනු රජය විසින් පූර්ණ අයිතිය දරනු ලබන ව්‍යාපාරික ආයතනයකි. මෙම සමාගම ලංකා විදුලිබල මණ්ඩලය (CEB) යටතේ ක්‍රියාත්මක වන නොරොච්චෝලේ ලක්විජය විදුලි බලාගාරය (LVPP) වෙත ගල් අඟුරු ආනයනය කොට සැපයීම උදෙසාම පමණක් සංස්ථාගත කර ඇත. 60%ක කොටස් හිමිකාරීත්වයක් සහිතව ලංකා විදුලිබල මණ්ඩලයේ එක් අනුබද්ධිත ආයතනයක් වන ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමෙහි මහා භාණ්ඩාගාරය වෙත 20%ක, ලංකා නැව් සංස්ථාව වෙත 10%ක සහ ශ්‍රී ලංකා

වරාය අධිකාරිය වෙත 10%ක සුළුතර කොටස් හිමිකාරීත්වයක් සතුවේ.

- **සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම**

2011 වසරේ දී සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වන සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම 100%ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් හිමිකාරීත්වය දරනු ලබන අනුබද්ධිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා එනර්ජීස් සමාගම විසින් අදාළ **සම්ප්‍රේෂණ වත්කම් සංවර්ධනය සහ මිනිස්බල සම්පත් සැපයීම** යන අනෙකුත් අරමුණු අතරින් **පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය** කෙරෙහි වූ දැක්මක් සහිතව කටයුතු කරනු ලබයි.

- **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, අපනයනය කිරීම, පිරිපහදු කිරීම, අලෙවි කිරීම, සැපයීම හා බෙදා හැරීම සම්බන්ධ ව්‍යාපාරික කටයුතුවල නියැලීම පිණිස 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් සංස්ථා පනත යටතේ ලංකා ඛනිජ තෙල් සංස්ථාව ස්ථාපිත කරනු ලැබ ඇත. ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන දේශීය ඉල්ලුමෙන් 68%ක් පමණ ආනයනය කර බෙදා හරිනු ලබන්නේ ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනකරු ලෙස කටයුතු කරන මෙම අස්තිත්වයයි. 1969 සිට, මෙම ආයතනය විසින් තනි හිමිකාරිත්වය යටතේ බොරතෙල් ආනයනය කර සපුගස්කන්දේදී දේශීයව පිරිපහදු කිරීම් කටයුතු සිදුකොට, සැපයීම සිදු කරනු ලබන අතර, ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන මුළු දේශීය ඉල්ලුමෙන් 32%ක් පමණ සපයයි. ඊට අමතරව, ගුවන්යානා ඉන්ධන සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කරන මෙම ආයතනය විදුලිබල උත්පාදනය සඳහා ද ඉන්ධන සපයයි.

- **ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම**

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමකි. මෙම සමාගම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමේ කොටස් හිමිකාරිත්වය හරහා සංස්ථාගත කරන ලද්දකි. පිරිපහදුවේ සිට පිරවුම්හල් දක්වා ඉන්ධන බෙදා හැරීම මේ හරහා සිදු කරන අතර ඛනිජ තෙල් ගබඩා පවත්වාගෙන යාම ද සිදු කරයි.

- **ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය**

ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය 2021 අංක 21 දරන ඛනිජ තෙල් පනත යටතේ පිහිටුවන ලද අතර ඛනිජ තෙල් ආශ්‍රිත සම්පත් ගවේෂණය හා සංවර්ධනය සඳහා බලයලත් ආයතනය වේ.

- **ත්‍රිකුණාමල ඛනිජතෙල් පර්යන්ත සමාගම**

මෙම සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද අතර ත්‍රිකුණාමලයේ පිහිටි ඛනිජ තෙල් ගබඩා ටැංකි ආශ්‍රිත සංවර්ධන කටයුතු සිදු කිරීම එහි මූලික කාර්යභාරය වේ.

02 වන පරිච්ඡේදය
2025 වර්ෂය තුළ ප්‍රගතිය හා
ඉදිරි දැක්ම - 2026

02 වන පරිච්ඡේදය

2025 වර්ෂය තුළ ප්‍රගතිය හා ඉදිරි දැක්ම - 2026

2.1 2025 වර්ෂය තුළ විදුලිබල අංශයේ කාර්යසාධනය

2.1.1 විදුලිබල ක්ෂේත්‍රයේ සම්පිණ්ඩනයක් ලෙසින්

වගුව 2.1.1
පාරිභෝගිකයින් සංඛ්‍යාව - 2025

	කාණ්ඩය	ලංවිම (CEB)	ලංවිපුස (LECO)	එකතුව
1	ගෘහස්ථ	6,142,601	521,473	6,664,074
2	ආගමික	44,777	2,804	47,581
3	කර්මාන්ත	73,039	3,566	76,605
4	පොදු කාර්යය	908,991	108,069	1,017,060
5	හෝටල්	972	141	1,113
6	රාජ්‍ය ආයතන	9,254	420	9,674
7	කෘෂි කාර්මික	4,636	-	4,636
8	වීදි ආලෝකකරණය	1	2028	2029
9	තාවකාලික	-	61	61
	එකතුව	**7,184,271**	**638,501**	**7,822,772**

2.1.2 විදුලි උත්පාදනය

2025 වසරේ සමස්ත විදුලි උත්පාදනය ගි.වො.පැ. 17,812 (ශුද්ධ) වූ අතර එය පසුගිය වසරේ ගි.වො.පැ. 16,802ක් ලෙස පැවති අගයට වඩා 6% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2025 වසරේ දී මෙම උත්පාදනයෙන් 60% ක් පමණ පුනර්ජනනීය බලශක්ති සම්පත් හරහා සපුරා ගෙන ඇත. ඉතිරිය උත්පාදනය කර ඇත්තේ ගල් අඟුරු සහ තෙල් මත පදනම් වූ තාප විදුලිය හරහා ය.

ගි.වො.පැ. 17,812ක අගයකින් යුතු 2025 වසරේ ශුද්ධ විදුලි උත්පාදනය සඳහා එක් එක් ප්‍රභවයන්ගෙන් ලැබී ඇති දායකත්වය ප්‍රතිශතයන් ලෙස පහත වගුවේ දක්වා ඇත.

වගුව 2.1.2
විදුලි උත්පාදනය - 2025

අංක	ප්‍රභවය	ප්‍රතිශතය (%)
01	ජල විදුලි (ලංවිම)	34
02	කුඩා ජල විදුලි (ස්.බ.නි.)	8
03	සුළං (ලංවිම)	2
04	සුළං (ස්.බ.නි.)	2
05	පියැසි පාදක සූර්ය පැනල- (ස්.බ.නි.)) - ඇස්තමේන්තුගත	10
06	විදුලි පද්ධතිය වෙත සම්බන්ධිත සූර්ය බලශක්තිය - (ස්.බ.නි.)	2
07	තාප තෙල් (ලංවිම)	8
08	තාප තෙල් (ස්.බ.නි.)	4
09	ගල් අඟුරු (ලංවිම)	29
10	සාම්ප්‍රදායික නොවන වෙනත්	1
	එකතුව	**100**

මූලාශ්‍රය - ලංවිම, ලංවිපුස, සු.බ.අ.

ප්‍රස්තාරය 2.1.1
විදුලි උත්පාදනය - 2025



ස්.බ.නි. - ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්

2.1.3 ජාතික විදුලිබල ජාලයේ ස්ථාපිත ධාරිතාවය

2025 දෙසැම්බර් මස අග වන විට සමස්ත ස්ථාපිත ධාරිතාව මෙ.වො. 6,749 ක් වූ අතර, එහි ප්‍රභේදනය පහත වගුවේ දක්වා ඇත.

ප්‍රධාන ජල විදුලි බලාගාරවල ස්ථාපිත ධාරිතාව සමස්ත ධාරිතාවෙන් 23% ක් වී ඇත. සමස්ත ස්ථාපිත ධාරිතාවෙන් 67% ක් කුඩා ජල විදුලි බලාගාර ඇතුළු පුනර්ජනනීය බලශක්ති බලාගාරවලින් ලැබී ඇති අතර, පියැසි පාදක සූර්ය බලශක්තිය 29%ක් ලෙස ද, ඉතිරි 38% සඳහා අනෙකුත් මූලාශ්‍රයන් ද දායකත්වය ලබා දී ඇත.

වගුව 2.1.3
උත්පාදන මූලාශ්‍රය අනුව ස්ථාපිත විදුලි ධාරිතාවය
(2025 දෙසැම්බර් මස අග වන විට)

	බලශක්ති මූලාශ්‍රය		ස්ථාපිත ධාරිතාවය (මෙ.වො)	බලාගාර සංඛ්‍යාව
1	තාප	නැප්තා, දැවි තෙල්, ඩීසල් (ලංවිම)	727	07
2		නැප්තා, දැවි තෙල්, ඩීසල් (ස්.බ.නි.)	582	02
3		ගල් අඟුරු	900	01
4	පුනර්ජනනීය බලශක්ති	ප්‍රධාන ජල විදුලි- (ලංවිම)	1,530	19
5		කුඩා ජල විදුලි - (ස්.බ.නි.)	437	221
6		සුළං - (ලංවිම)	104	01
		සුළං - (ස්.බ.නි.)	163	19
7		භූමිය මත ස්ථාපිත සූර්ය පැනල- (ස්.බ.නි.)	307	131
8		පියැසි පාදක සූර්ය පැනල- (ස්.බ.නි.)	1,935	108,979
9		ජෛව ස්කන්ධ - (ස්.බ.නි.)	64	16
	මුළු ධාරිතාව (පියැසි පාදක සූර්ය බලශක්තිය සහිතව)		**6,749**	**109,396**

ප්‍රස්තාරය 2.1.2
විදුලිබල ජාලයේ ස්ථාපිත ධාරිතාවය



2.1.4 විදුලි උත්පාදන ව්‍යාපෘති

පහත සඳහන් උත්පාදන ව්‍යාපෘති දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතී:

වගුව 2.1.4
ජල විදුලි උත්පාදනය පුළුල් කිරීමේ ව්‍යාපෘති

අංග	ව්‍යාපෘතිය/වැඩසටහන	ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය
1	මෙ.වො. 31 මොරගොල්ල ජල විදුලි බලාගාරය	ඉදිකිරීම් සිදු කෙරෙන අතර අවසන් අදියරේ (90%) පසුවේ	2026 සැප්තැම්බර්

වගුව 2.1.5
තාප විදුලි උත්පාදනය පුළුල් කිරීමේ ව්‍යාපෘති

අංග	ව්‍යාපෘතිය/වැඩසටහන	ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය
1	පළමු මෙ.වො. 350 ස්වභාවික වායු/ඩීසල්වලින් ක්‍රියා කළ හැකි විදුලි බලාගාරය (සොබාදනව් විදුලි බලාගාරය) සංවර්ධනය කිරීම.	2025-06-23 දින ඒකාබද්ධ චක්‍රීය මෙහෙයුම් ආරම්භ කෙරුණු අතර ජාතික විදුලිබල පද්ධතිය වෙත මෙ.වො. 320ක දායකත්වයක් සපයමින් එය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් ඇත.	අවසන් කර ඇත
2	කෙරවලපිටිය 2 වන මෙ.වො. 350 සහස්දනව් ස්වභාවික වායු සංයුක්ත චක්‍රීය බලාගාරය	පාරිසරික බලපෑම් තක්සේරුව සහ සවිස්තරාත්මක සැලසුම් කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, 2026 අප්‍රේල් වන විට මූලික ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට නියමිත ය. විවෘත චක්‍රීය මෙහෙයුම් 2028 මාර්තු මාසයේදී ආරම්භ කිරීමට නියමිතය.	සැලසුම් කර ඇති කාලය (GT) - 2027 ඔක්තෝබර් සැලසුම් කර ඇති කාලය (ST)- 2028 ඔක්තෝබර්
3	කැලණිතිස්ස මෙ.වො. 130 ගෑස් ටර්බයින	ප්‍රසම්පාදනය තාවකාලිකව නවතා ඇත.	2030
4	මෙ.වො. 200 ස්වභාවික වායු අභ්‍යන්තර දහන එන්ජින් බලාගාරය	වත්මන් තත්ත්වය අනුව ව්‍යාපෘතිය නවතා දමා, ව්‍යාපෘතියේ අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනය කිරීමට අමාත්‍යාංශයේ දී තීරණයක් ගනු ලැබිය.	2028

වගුව 2.1.6
පියැසි පාදක සූර්ය බලශක්ති පද්ධති සම්බන්ධතා වල ප්‍රගතිය

විස්තරය	නෙට් මීටරින් (Net Metering)	නෙට් ප්ලස් (Net Plus)	නෙට් අකවුන්ටින් (Net Accounting)	නෙට් ප්ලස් ප්ලස් (Net Plus Plus)	එකතුව
පියැසි පාදක සූර්ය බලශක්ති නිෂ්පාදකයන් ගණන	14,453	3,589	72,088	18,849	108,979
ස්ථාපිත ධාරිතාව (මෙ.වො.)	233	225	863	614	1,935

වගුව 2.1.7
සුළං බලශක්ති උත්පාදන ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම	ධාරිතාව	2025-12-31 දිනට භෞතික ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය
මෙ.වො. (1-10) ධාරිතාවලින් යුත් මෙ.වො. 60 සුළං විදුලි ව්‍යාපෘතිය	මෙ.වො. 35	- මෙ.වො. 15 බලාගාරය (මන්නාරම) මෙහෙවරෙහි යොදවා ඇත. - මෙ.වො.10 බලාගාරය (ත්‍රිකුණාමලය) අවලංගු කර ඇති - 2 x මෙ.වො. 5 (මාදම්පෙ- නැවත ටෙන්ඩර් කැඳවා ඇත) නොවැළැක්විය හැකි තත්ත්වයන් (Force Majeure) (ඉඩම් ගැටළුව) ප්‍රකාශයට පත් කර ඇති අතර අතර විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් තබා ඇත.	2027
මෙ.වො. 250 මන්නාරම අදියර II සුළං විදුලි ව්‍යාපෘතිය	මෙ.වො. 250	- ව්‍යාපෘති යෝජකයා විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර ඔවුන් සමඟ මූල්‍ය යෝජනාව සම්බන්ධයෙන් සම්මුති සාකච්ඡා සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව කටයුතු කරමින් ඇත.	2026
මෙ.වො. 20 වෙරළබඩ භූමිය මත නංවන සුළං විදුලි බලාගාර (මෙ.වො. 25-10)	මෙ.වො. 20	- 3 x මෙ.වො. 5 -බලාගාරය ඉදිකිරීම අවසන් කර ඇති අතර 2026 ජනවාරි මස මෙහෙවරෙහි යෙදවීමට අපේක්ෂිත ය. - 1 x මෙ.වො. 5 - නොවැළැක්විය හැකි තත්ත්වයන් ප්‍රකාශයට කර ඇති බලාගාරයකි. 2026 පෙබරවාරි මස මෙහෙවරෙහි යෙදවීමට අපේක්ෂිත ය.	2026
මෙ.වො. 234 පූනරින් සුළං විදුලි ව්‍යාපෘතිය	මෙ.වො. 234	- ව්‍යාපෘති යෝජකයා විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර ඔවුන් සමඟ මූල්‍ය යෝජනාව සම්බන්ධයෙන් සම්මුති සාකච්ඡා සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව කටයුතු කරමින් ඇත.	2026
මන්නාරම මෙ.වො. 50 සුළං ව්‍යාපෘතිය	මෙ.වො. 50	- 2025-05-28 දින විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් තබා ඇත.	2027
මුල්ලිකුලම් 2 x මෙ.වො. 50 සුළං ව්‍යාපෘතිය	මෙ.වො.100	- 2026-01-14 දින කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත.	2027

වගුව 2.1.8
බලශක්ති ගබඩා සංවර්ධන ව්‍යාපෘති

අංග	ව්‍යාපෘතිය/වැඩසටහන	ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය
1	මෙ.වො.100/මෙ.වො.පැ. 100 තනි බැටරි බලශක්ති ගබඩා පද්ධතිය	යෝජනා සඳහා ඉල්ලීම ලේඛනය අවසන් කරමින් පවතී	2027
2	මෙ.වො.160 /මෙ.වො.පැ.640 බැටරි බලශක්ති ගබඩා පද්ධති ව්‍යාපෘතිය	ටෙන්ඩර් කැඳවා ඇත	2026
3	හම්බන්තොට මෙ.වො.5/මෙ.වො.පැ.10.7 බැටරි බලශක්ති ගබඩා පද්ධතිය	පරීක්ෂා කිරීම් සහ මෙහෙවරෙහි යෙදීමේ (commissioning) කටයුතු ආරම්භ කර ඇත.	2026
4	දකුණේ මෙ.වො.100 /මෙ.වො.පැ.400 බැටරි බලශක්ති ගබඩා පද්ධතිය	ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ලංවිම අභ්‍යන්තර අනුමැතින් ලබා ගෙන ඇත	2028
5	මහඔය පොම්ප කළ ජල ගබඩා විදුලි බලාගාරය හි මේවෝ 600 පොම්ප කළ ජල ගබඩාව (PSPP)	සවිස්තරාත්මක සැලසුම් සඳහා අරමුදල් ලබා ගැනීම සිදු වෙමින් පවතී	2034

වගුව 2.1.9
පද්ධති නවීකරණය සහ සහායක ව්‍යාපෘති

අංග	ව්‍යාපෘතිය/වැඩසටහන	ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය
1	ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයේ පුනර්ජනනීය බලශක්ති පාලන සහ අධීක්ෂණ පහසුකම (Renewable Energy Control & Monitoring Desk)	ලංසු ලේඛනය සකස් කරමින් පවතී	2027

2.1.5 සම්ප්‍රේෂණ සංවර්ධන කටයුතු

විදුලිබල පද්ධතිය සවිබලගැන්වීම, පද්ධති විශ්වසනීයත්වය ඉහළ නැංවීම සහ අනාගත ඉල්ලුමේ වර්ධනයට ඉඩ සැලසීම අරමුණු කරගත් 2025-12-31 දින වන විට දැනට ක්‍රියාත්මක තත්ත්වයේ ඇති සම්ප්‍රේෂණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය පහත දැක්වේ.

වගුව 2.1.10
දැනට ක්‍රියාත්මක සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

ව්‍යාපෘතිය/ ශාඛාව	පැකේජය	පිරිවැය (ශ්‍රී ලං.රු.මිලියන)	2025.12.31 දිනට භෞතික ප්‍රගතිය	කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය
ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය	පැකේජය 1: කි.වෝ. 400, කි.වෝ.220 සහ කි.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම	41,589	80.55%	2026 - දෙසැ.
	පැකේජය 2 : ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සහ විශාලනය		78.90%	2026 - මාර්තු
	පැකේජය 3: සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම (කි.වෝ. 220, කි.වෝ.132)		79.4% (කොන්ත්‍රාත්තුව අත් හිටුවා ඇත- 59.8%)	2028 ජනවාරි (නව ලංසු කැඳවීම අදියර II 2026.01.29 වන දින අවසන් විය)
	පැකේජය 4: බෙදාහැරීමේ උපපොළ සහ කේබල ඉදිකිරීම (කි.වෝ.33, කි.වෝ.11, කි.වෝ. 0.4)		41% (කොන්ත්‍රාත්තුව අත් හිටුවා ඇත-).	2029- අගෝ. (නව ලංසු කැඳවීමේ ක්‍රියාපටිපාටිය අදියර II)

විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය	කි.වෝ. 33 රැහැන් කුළුණු 16ක් (කි.මී. 285) සහ කොටස් දෙකකින් යුත් තනි බස්බාර් ගැන්ට්‍රි 13ක් ඉදිකිරීම.	ඇ.ඩො. මිලියන 23.65 සහ ශ්‍රී ලං.රු. මිලියන 4,867.5	91%	2026 - මාර්තු
කෙරවලපිටිය-වරාය කි.වෝ. 220 දෙවන භූගත රැහැන් ව්‍යාපෘතිය	කෙරවලපිටිය සිට වරාය ග්‍රිඩ් උපපොළ දක්වා කි.මී.15.7 ක දිගින් යුත් භූගත කේබල් පරිපථයක් ඉදිකිරීම.	ඇ.ඩො. මිලියන 52	-	2027- ඔක්තො.
සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති	මැදගම - අම්පාර කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම	3,206	79%	2026 - මැයි
සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති	වික්ටෝරියා - රන්ටැඹේ කි.වෝ.220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	2,200	පාරිසරික බලපෑම් තක්සේරු අනුමැතිය සමඟ සංශෝධනය කිරීමට නියමිත ය	2027- අප්‍රේල්
	පූනරින් - කිලිනොච්චි කි.වෝ.220 DC සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේ කටයුතු		-	N/A
	කොළොන්නාව - පන්නිපිටිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම	1,120	-	2026- දෙසැ.
	කැළණිතිස්ස - කොළොන්නාව කි.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ගය උස් කිරීම	702	-	N/A
	දඹුල්ල - නව හබරණ කි.වෝ. 220/132 පෝෂක පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	1,790	55%	2026- මැයි
	මන්නාරම - නඩුකුඩා කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම	550	10%	2026- දෙසැ.
	කැළණිතිස්ස කි.වෝ. 132 වායු පරිවරණිත (GIS) උපපොළ පුළුල් කිරීම	1,400	අදියර 1 - 100% අදියර 2 -15%	2025- සැප්.
	බලංගොඩ ග්‍රිඩ් උපපොළේ කි.වෝ. 33 පෝෂක බහනු (Feeder Bays) 02ක් ඉදිකිරීම	702	80%	2026- මාර්තු
	රන්ටැඹේ වහරු අංගනයේ කි.වෝ. 220 වායු පරිවරණය කළ උපපොළක් (GIS) ඉදිකිරීම	464	-	2025- දෙසැ.
	වික්ටෝරියා බලාගාරයේ වහරු අංගනයෙහි කි.වෝ.220 පෝෂක බහනුවක් ඉදිකිරීම	291	60%	2025- දෙසැ.
	අම්පාර ග්‍රිඩ් උපපොළේ කි.වෝ. 132 පෝෂක බහනු 01ක් ඉදිකිරීම	67	85%	2025- දෙසැ.
	කි.වෝ. 33 ආරක්ෂණ පිළියවන (Protection Relay) ප්‍රතිස්ථාපනය	15	45%	2026- මාර්තු
	නව අනුරාධපුර ග්‍රිඩ් උපපොළේ කි.වෝ. 220 පෝෂක බහනු 02ක් ඉදිකිරීම	2,809	70%	2026- මැයි
	චුන්නාකම් ග්‍රිඩ් උපපොළ විශාලනය	229	38%	2026- මැයි
	අතියකන්ද ග්‍රිඩ් උපපොළ විශාලනය	350	48%	2026- මාර්තු

සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති	කුකුලේගඟ වහරු අංගනය විශාලනය	85	60%	2026- අප්‍රේල්
	මතුගම ග්‍රිඩ් උපපොළ විශාලනය	212	38%	2026- මැයි
	නවුකුඩා ග්‍රිඩ් උපපොළ විශාලනය	595	5%	2026- මැයි
	සියඹලාණ්ඩුව ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම	-	14%	2027-අප්‍රේල්
	ඇඹිලිපිටිය ග්‍රිඩ් උපපොළ විශාලනය	353	අදියර 1 - 100% අදියර 2 - NS	2025- දෙසැ.
මන්නාරම - වවුනියාව කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග සන්නායකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	දැනට ඇති සීබ්‍රා සන්නායකය ඉහළ උෂ්ණත්වයක් දැරිය හැකි එල්ලා වැටීමෙන් අඩු වර්ගයේ නව සන්නායකයක් (HTLS Conductor) මගින් ප්‍රතිස්ථාපනය කිරීම (කි.මී. 72)	569	38.14%	2026- ඔක්තෝ.
මුල්ලිකුලම් සුළං විදුලි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය	* මන්නාරම - මුල්ලිකුලම් කි.වෝ. 220 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම (කි.මී. 28)	5,969.00	2026 ජනවාරි මස ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නියමිත ය	2027- අගෝ
	* මන්නාරම ග්‍රිඩ් උපපොළේ කි.වෝ.220 රැහැන් බහනු 2ක් ඉදිකිරීම / මුල්ලිකුලම් රැස් කිරීමේ උපපොළේ ආදාන පැතිකඩ (Incomer side) ඉදි කිරීම			
සම්ප්‍රේෂණ ව්‍යාපෘති	**භාණ්ඩ ප්‍රසම්පාදනය** සාම්පූර්-කප්පල්තුරේ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පැකේජ 4,5,6,10 සහ 11ට අදාළ සම්ප්‍රේෂණ ජාල අවශ්‍යතාවයන් සඳහා අමතර කොටස් සහ මෙවලම් ලෙස ද්‍රව්‍ය/ උපකරණ ප්‍රසම්පාදනය	4,381	98.00%	2025- මාර්තු
	පූනරින් - කිලිනොච්චි කි.වෝ. 220 DC සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේ මූලික කටයුතු PSRSP-Ph-02-OU2	3,400	69%	2026- මාර්තු
විදුලිබල පද්ධති විශ්වසනීයත්වය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය PSRSP : Ph II P 2 - OU 01	හොරණ-පාදුක්ක කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ ඉතිරි කටයුතු ඉදිකිරීම	568	60%	2026- දෙසැ.
විදුලි පද්ධති බලගැන්වීමේ සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධකරණ ව්‍යාපෘතිය - PSSREIP	පැකේජ 6 කින් සමන්විත වේ	76,281.000	ඉදිකිරීම් කොන්ත්‍රාත්තු තවමත් ප්‍රදානය කර නොමැත	ණය ගිවිසුම අනුව, 2029
විදුලිබල පද්ධති විශ්වසනීයත්වය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය - PSRSP පැකේජය 4A - නව හබරණ-නව අනුරාධපුර කි.වෝ.220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	6ii) නව හබරණ - නව අනුරාධපුර කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සඳහා වන සිවිල් ඉදිකිරීම් කටයුතු වැඩ, කුළුණු ඉදිකිරීම සහ රැහැන් එලීමේ කටයුතු සහ දැනට පවතින පැරණි හබරණ - නව අනුරාධපුර කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉවත් කිරීම	1,911.000	56%	2026- සැප්.

අරමුදල් සම්පාදනය කරගැනීමට නියමිත සම්ප්‍රේෂණ සංවර්ධන කටයුතු පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගුව 2.1.11
අරමුදල් සම්පාදනය කරගැනීමට නියමිත සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර

අයිතමය	කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත වර්ෂය	සමස්ත පිරිවැය ඇස්තමේන්තුව (ශ්‍රී.ලං.රු.මි.)	2026 වසර සඳහා අවශ්‍යවන මූල්‍ය බැඳීම් වටිනාකම (ශ්‍රී.ලං.රු.මි.)
සාම්පූර්-කප්පල්තුරේ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය **(SKTDP)**	2026	7,896	7,106
සාම්පූර් - කප්පල්තුරේ කි.වෝ. 220 දිවිත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සහ සාම්පූර්හි කි.වෝ. 220/33 රාශිකරණ ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම			
විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය **PSRSP : Ph II P 2 - OU 01**	2027	7,710	771
වාරියපොල කි.වෝ. 220/132 උපපොළ ඉදිකිරීම, වාරියපොල - කුරුණෑගල කි.වෝ. 132 ද්විත්ව පරිපථ කි.මී. 22 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම, හබරණ -වේයන්ගොඩ කි.වෝ.220 සම්ප්‍රේෂණ මාර්ගයේ සිට වාරියපොළ උපපොළ දක්වා (කි.මී. 3) ද්විත්ව පිවිසුම්-පිටවීම් සම්බන්ධතාවය ඉදිකිරීම, කුරුණෑගල කි.වෝ.132 ග්‍රිඩ් උපපොළ විශාලනය			
	2027	3,897	556
විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය **PSRSP : Ph II P 2 - OU 02** (i) ඒකල කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ, කොටුගොඩ-කැළණිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ සිට කි.මී. 4ක ද්විත්ව ආදාන සහ ප්‍රතිදාන සම්බන්ධතාවය			
(ii) යක්කල කි.වෝ.132/33 ග්‍රිඩ් උපපොළ, කිරිඳිවැල ග්‍රිඩ් උපපොළේ සිට යෝජිත යක්කල ග්‍රිඩ් උපපොළ දක්වා ආසන්න වශයෙන් කි.මී. 10ක කි.වෝ. 132 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය		3,226	479
(iii) කි.වෝ. 220 වව්නියාව ග්‍රිඩ් උපපොළ, සංවර්ධනය කිරීම	2028	9,097	910
	තවම තීරණය කර අවසන් නැත	12,717	925
විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය **PSRSP : Ph II P 2 - OU 03** කි.වෝ. 132/11 මහනුවර නගර ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම, මහනුවර නගර ග්‍රිඩ් උපපොළ සඳහා කි.මී. 6ක් දිග සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සහ කිරිබත්කුඹුර හා උකුවෙල ග්‍රිඩ් උපපොළයන් විශාලනය			
කි.වෝ. 132/33, මෙ.වෝ.ඇ. 31.5 වැලිගම ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම	තවම තීරණය කර අවසන් නැත	3,824	714
මන්නාරම - වව්නියාව කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගයේ සන්නායකය නවීකරණය	2026	664 (බදු සහිතව)	489 (බදු සහිතව)
මුල්ලිකුලම් සුළං විදුලි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය	2027	5,951	3,273

2.1.6 දේශගුණික විපර්යාස අවම කිරීම හා විදුලිබල ක්ෂේත්‍රයේ ජාතිකව නිර්ණය කරන ලද දායකත්වය (NDCs)

විදුලිබල ක්ෂේත්‍රයෙහි වත්මන් ගමන්මග සහ මෑත කාලීන සංවර්ධනයන් මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වයේ යථා ස්වභාවය සහ ඒ හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ මූල්‍ය, තාක්ෂණ හුවමාරුව සහ ධාරිතා සංවර්ධන අවශ්‍යතා සැලකිල්ලට ගෙන ඇති, වැඩි දියුණු කළ ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව 3.0 තුළින් සැලකිය යුතු වර්ධනයක් ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව 2.0ට වඩා පෙන්නුම් කෙරෙයි.

යාවත්කාලීන කරන ලද ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව ක්‍රියාත්මක කිරීම මගින් සාමාන්‍ය තත්ත්වයට (BAU case) සාපේක්ෂව හරිතාගාර වායු විමෝචනයන් සැලකිය යුතු ලෙස අඩුවීමක් 2026 සිට 2035 දක්වා කාලය තුළ සිදුවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. එනම්,

විදුලිබල ක්ෂේත්‍රයේ ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව ක්‍රියාත්මක කිරීමෙන් වසර 2035 වන විට සමස්ත හරිතාගාර වායු විමෝචනය 26.2% කින් අඩු වනු ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර, මෙහිදී ශ්‍රී ලංකාව විසින් කොන්දේසි විරහිතව 5.3% කින් ද සහ ජාත්‍යන්තර මූල්‍ය, තාක්ෂණ හුවමාරුව සහ ධාරිතා සංවර්ධන සහාය ලබාගැනීම මත කොන්දේසි රහිතව 20.9% කින් ද මෙය සාක්ෂාත් කරගැනීමෙහිලා දායක විය යුතුව ඇත. 2026-2035 කාල සීමාව තුළ මෙම අඩු කිරීම් ප්‍රතිශතවලින් ඇස්තමේන්තුගත කර ඇති සමස්ත අඩු වීමේ බලපෑම, කොන්දේසි විරහිතව ගිගාග්‍රෑම් 13,604.9 කට සමාන කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයක් ද (13,604.9 Gg CO_2 eq) සහ කොන්දේසි සහිතව ගිගාග්‍රෑම් 53,746.2කට සමාන කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයක් ද (53,746.2 Gg CO_2 eq) වන වූ සමස්තය ගිගාග්‍රෑම් 67,357.ට සමාන කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයකි (67,351.1 Gg CO_2 eq).

2.1.7 විදුලි ගාස්තු සංශෝධනය

බලශක්ති අමාත්‍යවරයා විසින් 2024.12.05 දිනැති "ගාස්තු කාල සීමාව මාස තුනේ සිට මාස හයක් දක්වා සංශෝධනය කිරීම සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සංශෝධනය කිරීම" මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරනු ලැබ ඇත. දැනට ක්‍රියාත්මක වන විදුලි ගාස්තු සංශෝධන කාල සීමාවන් සංශෝධනය කිරීම පිළිබඳව ඊට අදාළ සවිස්තරාත්මක යෝජනාවක් ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) අතර අත්සන් තබා ඇති විස්තීරණ අරමුදල් පහසුකම් (EFF) වැඩසටහනේ ඊළඟ කාර්ය මණ්ඩල මට්ටමේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් 2024.12.18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත නියම කෙරිණි.

ඒ අනුව, "මාස 3 සිට මාස 6 දක්වා අයකුම කාල සීමාව ආපසු සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් IMF වෙත ඉදිරිපත් කෙරෙන වාර්තාව (Report to IMF on the Necessity of Reversion of Tariff Period from 3 Months to 6 Months)"ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2025.07.01 දින යොමු කර තිබූ අතර බලශක්ති අමාත්‍යාංශය විසින් 2025.08.26 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත මෙම වාර්තාව ඉදිරිපත් කෙරිණි.

2.1.8 පුනර්ජනනීය බලශක්ති ගාස්තු සංශෝධනය

2024 වසරේ සිට ක්‍රියාත්මක කෙරෙන පරිදි සමතල ගාස්තු අයකුම විකල්පයක් හඳුන්වාදීම සිදුව ඇත. මින් පෙර භාවිතයේ පැවති ත්‍රිත්ව-ස්ථර ගාස්තු අයකුම ව්‍යුහය සහ විචල්‍ය ගාස්තු අයකුමය 2024 වසරේ සිට තවදුරටත් ක්‍රියාත්මක නොවනු ඇත. 2025 වර්ෂය සඳහා, මෙ.වො. 10 හෝ ඊට අඩු ධාරිතාවක් සහිත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සහ පියැසි පාදක සූර්ය බලශක්තිය සඳහා 2025 ජුනි 16 වන දින සිට ගාස්තු අයකුම සංශෝධනය කර ඇති පියැසි පාදක සූර්ය බලශක්ති පැනල සමඟ සම්බන්ධ කෙරෙන බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) සඳහා මෙම වසරේ දී අයකුමයක් හඳුන්වා දෙනු ලැබ ඇත. පියැසි මත සවිකරන සූර්ය බලශක්ති පද්ධති සමඟ සම්බන්ධ කරන බැටරි බලශක්ති ගබඩා පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් ද සකස් කර තිබෙන අතර කෙසේවුවද, එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තීරණවලට එළැඹීම ඉදිරියේදී සිදු කෙරෙනු ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැනට නිසි ලෙස ක්‍රියාත්මක නොකරන විචල්‍ය ගාස්තුව සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර මෙම ගාස්තුව කාලෝචිතව ක්‍රියාවට නැංවීම සහතික කිරීම මෙහි අරමුණ ය. මෙ.වො. 10 සහ ඊට අඩු ධාරිතාවක් සහිත පුනර්ජනනීය බලශක්ති බලාගාර ජාතික විදුලිබල පද්ධතිය වෙත ඒකාබද්ධ කිරීම සඳහා අයකුම සූත්‍රයක් සකස් කිරීමට කමිටුවක් පත් කර ඇත.

2.2 2025 වර්ෂයේ බලශක්ති අංශයේ කාර්යසාධනය

බලශක්ති අමාත්‍යාංශයේ බලශක්ති අංශය ජාතියේ බලශක්ති අවශ්‍යතා සපුරාලීම සහ ආර්ථික හා සමාජීය සංවර්ධනය සඳහා සහය වීම සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඉන්ධන යනු ජනතාවගේ දෛනික ජීවිතයට අත්‍යවශ්‍ය අංගයක් වන අතර ප්‍රවාහනය, කර්මාන්ත සහ නිවාස සඳහා අවශ්‍ය බලශක්තිය ලබා දෙමින් පොදු සේවාවන් සුමටව පවත්වාගෙන යාම තහවුරු කරනු ලබයි. අමාත්‍යාංශය විසින් ඉන්ධන සැපයුමේ විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීමට, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට මෙන්ම ගබඩා කිරීමේ සහ බෙදා හැරීමේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමටත් අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

මෙම පරිච්ඡේදය මගින් ගෝලීය ඉන්ධන මිල ප්‍රවණතා දේශීය මිල කෙරෙහි බලපාන ආකාරය, ජාතික ඉන්ධන ඉල්ලුම සපුරාලීම සඳහා දක්වන ලද දායකත්වය, ඛනිජ තෙල් කර්මාන්තය සඳහා ක්‍රියාත්මක කරන ලද නියාමන පියවර, ඛනිජ තෙල් අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ 2026 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලසුම් පිළිබඳ සමාලෝචනයක් ඉදිරිපත් කෙරෙනු ඇත.

2.2.1 ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අංශයේ තොරතුරු ලුහුඬින් - 2025

සමස්ත පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය	මෙ.ටො. 5,006,930.56
සමස්ත බොර තෙල් ආනයනය	මෙ.ටො. 1,679,000
සපුගස්කන්ද පිරිපහදුවේ නිෂ්පාදනය	මෙ.ටො. 1,715,799
සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන වල ආනයන පිරිවැය	ඇමරිකන් ඩොලර් මිලියන 3,256.16
සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන වල අලෙවිය	මෙ.ටො. 6,450,811.34
ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව	1,436
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සමස්ත ගබඩා ධාරිතාවය	මෙ.ටො. 474,404

2.2.2 ගෝලීය ඛනිජ තෙල් මිල ප්‍රවනතා ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි ඇති කරන ලද බලපෑම

i. ගෝලීය ඛනිජ තෙල් මිල ප්‍රවනතා

ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් දේශීය ඉන්ධන මිල ගණන් කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරයි. 2025 වර්ෂය තුළ ආසියා-පැසිෆික් කලාපයේ බොරතෙල් සහ පිරිපහදු කළ ඉන්ධන මිල ගණන්වල පහත සඳහන් ප්‍රවණතා නිරීක්ෂණය වී ඇත.

2025 වර්ෂය තුළ බොර තෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනවල මිල ගණන් මධ්‍යස්ථ අස්ථාවරත්වයක් පෙන්නුම් කරන ලදී. බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල ඇමෙරිකානු ඩොලර් 63 ත් 80 ත් අතර අගයක උච්චාවචනය වූ අතර, පෙට්‍රල් (ඔක්ටේන් 92 සහ 95) සහ ඩීසල් (ඔටෝ සහ සුපර්) මිල ගණන් ද ඊට සමාන වෙනස්වීම් පෙන්නුම් කර ඇත. වසරේ පළමු භාගයේදී මිල ගණන් ක්‍රමයෙන් පහත වැටීමක් වාර්තා වූ අතර, ගෝලීය ඉල්ලුම අඩුවීම සහ සැපයුම් තත්ත්වයන් වැඩිදියුණු වීම යන කරුණු ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය වීම සහ ප්‍රධාන තෙල් අපනයනය කරන රටවල් විසින් නිෂ්පාදන කෝටාවන් සංශෝධනය කිරීම හේතුවෙන් ජූනි මාසයේ සිට මන්දගාමී යථා තත්ත්වයට පත්වීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය විය. මෙම ගෝලීය මිල විචලනයන් ශ්‍රී ලංකාවේ දේශීය ඉන්ධන මිල ව්‍යුහය කෙරෙහි ඍජු බලපෑමක් ඇති කළ අතර, වසර තුළ ඛනිජ තෙල් ආනයන පිරිවැය කෙරෙහි ද බලපෑම් ඇති කරන ලදී .

2025 වර්ෂය තුළ ගෝලීය ඛනිජ තෙල් මිලෙහි සිදු වූ විචලනයන් ශ්‍රී ලංකාවේ දේශීය ඉන්ධන මිල යාන්ත්‍රණය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. අප රට ආනයනික බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන මත දැඩි ලෙස රඳා පවතින බැවින් ජාත්‍යන්තර වෙළඳපොළ මිලෙහි සිදුවන වෙනස්වීම් දේශීය ඉන්ධන පිරිවැය කෙරෙහි ඍජුවම බලපානු ලබයි. ගෝලීය මිල උච්චාවචනයන් සහ විනිමය අනුපාතික වෙනස්වීම් පිළිබිඹු කරන දේශීය මිල සූත්‍රය, මිල ස්ථායීතාවය සහ ඉන්ධන සැපයුමේ

තිරසාරභාවය සහතික කිරීම සඳහා වරින් වර සංශෝධනය කරන ලදී. වසරේ මුල් මාසවලදී ගෝලීය මිල ගණන් පහත වැටීම ආනයන වියදම් අඩු කිරීමට උපකාරී වුවද, 2025 මැද භාගයේ සිට මිල ගණන් නැවත ඉහළ යාම සිල්ලර ඉන්ධන මිල කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන ලදී. බලශක්ති අමාත්‍යාංශය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (**CPC**) එක්ව ඉන්ධන සැපයුම අඛණ්ඩව පවත්වාගෙන යාමටත්, දේශීය මිල ගණන්වල අස්ථාවරත්වය අවම කිරීමටත්, පාරිභෝගිකයන්ට දැරිය හැකි මිලකට ඉන්ධන ලබා දෙන අතරම ඛනිජ තෙල් අංශයේ මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීමටත් අවශ්‍ය නිසි පියවර ගන්නා ලදී.

බැරලයක සාමාන්‍ය මිල ඇමරිකානු ඩොලර් 71.246ක් ලෙස හඳුනා ගන්නා ලදී.

- ඔක්ටේන් 92 පෙට්‍රල් බැරලයක ඉහළම මිල වන ඇමරිකානු ඩොලර් 84.833ක අගය පෙබරවාරි මාසයේදීත් අවම අගය වන ඇමරිකානු ඩොලර් 75.029ක් මැයි මාසයේදීත් වාර්තා විය. ඔක්ටේන් 92 පෙට්‍රල් බැරලයක වාර්ෂික සාමාන්‍ය මිල ඇමරිකානු ඩොලර් 78.864කි.
- ඔක්ටේන් 95 පෙට්‍රල් බැරලයක ඉහළම මිල ජනවාරි මාසයේදී ඇමරිකානු ඩොලර් 86.750ක් ලෙසත්, අඩුම මිල මැයි මාසයේදී

වගුව 2.2.1
ආසියා-පැසිෆික් කලාපීය බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන මිල ප්‍රවණතා - 2025

මාසය	(බැරලයක මිල ඇමරිකානු ඩොලර් වලින්)				
	ඔක්ටේන් 92 පෙට්‍රල්	ඔක්ටේන් 95 පෙට්‍රල්	සුපිරි ඩීසල්	ඔටෝ ඩීසල්	බොර තෙල්
ජනවාරි	84.48	86.75	95.41	94.76	72.81
පෙබරවාරි	84.83	86.30	91.70	90.62	73.28
මාර්තු	79.55	81.00	86.47	85.12	80.22
අප්‍රේල්	75.30	76.75	81.77	80.48	77.62
මැයි	75.02	76.46	79.36	78.85	72.63
ජූනි	80.10	82.00	87.03	86.58	67.73
ජූලි	77.92	79.59	90.88	89.81	63.62
අගෝස්තු	77.96	80.12	86.37	85.47	69.81
සැප්තැම්බර්	79.51	81.55	89.08	88.22	71.12
ඔක්තෝබර්	77.09	79.75	88.89	87.79	70.10
නොවැම්බර්	78.73	81.51	93.59	91.75	70.22
දෙසැම්බර්	75.82	77.29	82.39	82.09	65.79

මූලාශ්‍රය: ආසියා-පැසිපික් කලාපීය ඛනිජ තෙල් වෙළඳපොළ සංඛ්‍යාලේඛන 2025

2025 වර්ෂය තුළ ඉහත සඳහන් සිංගප්පූරු ප්ලැට්ස් (Singapore Platts) මිල ගණන් සැළකිල්ලට ගැනීමේදී;

- බොර තෙල් බැරලයක ඉහළම අගය වන ඇමරිකානු ඩොලර් 80.22ක් මාර්තු මාසයේදීත්, අවම අගය වන ඇමරිකානු ඩොලර් 63.62ක් ජූලි මාසයේදීත් වාර්තා වූ අතර බොර තෙල්

ඇමරිකානු ඩොලර් 76.467ක් ලෙසත් වාර්තා විය. ඔක්ටේන් 95 පෙට්‍රල් බැරලයක වාර්ෂික සාමාන්‍ය මිල ඇමරිකානු ඩොලර් 80.760කි.

- ඔටෝ ඩීසල් බැරලයක් සඳහා ඉහළම මිල ජනවාරි මාසයේදී ඇමරිකානු ඩොලර් 94.765ක් වූ අතර, මැයි මාසයේදී අවම මිල ඇමරිකානු ඩොලර් 78.851ක් ලෙස වාර්තා විය. ඔටෝ ඩීසල් බැරලයක වාර්ෂික

සාමාන්‍ය මිල ඇමරිකානු ඩොලර් 86.799ක් ලෙස සටහන් විය.

- සුපිරි ඩීසල් බැරලයක ඉහළම මිල ජනවාරි මාසයේදී ඇමරිකානු ඩොලර් 95.412ක් වූ අතර, අඩුම මිල මැයි මාසයේදී ඇමරිකානු ඩොලර් 79.365ක් ලෙස වාර්තා විය. වසර තුළ සුපිරි ඩීසල් බැරලයක වාර්ෂික සාමාන්‍ය මිල ඇමරිකානු ඩොලර් 87.749කි.

වගුව 2.2.2
බනිජ තෙල් නිෂ්පාදන වල සාමාන්‍ය ඉහළ සහ අඩුම මිල ගණන් -2025
(සිංගප්පූරු ප්ලැට්ස් මිල දර්ශක පදනම් කර ගනිමින්)

බනිජ තෙල් නිෂ්පාදන	ඉහළම මිල (ඇමරිකානු ඩොලර්/බැරලයකට)	වාර්තා වූ මාසය	අඩුම මිල (ඇමරිකානු ඩොලර්/බැරලයකට)	වාර්තා වූ මාසය	සාමාන්‍ය මිල (ඇමරිකානු ඩොලර්/බැරලයකට)
බොරතෙල්	80.22	මාර්තු	63.62	ජූලි	71.24
ඔක්ටේන් 92 පෙට්‍රල්	84.83	පෙබරවාරි	75.02	මැයි	78.86
ඔක්ටේන් 95 පෙට්‍රල්	86.75	ජනවාරි	76.46	මැයි	80.76
ඔටෝ ඩීසල්	94.76	ජනවාරි	78.85	මැයි	86.79
සුපිරි ඩීසල්	95.41	ජනවාරි	79.36	මැයි	87.74

මූලාශ්‍රය: ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව

ii. ගෝලීය මිල ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි ඇති කරන ලද බලපෑම

ශ්‍රී ලංකාව පූර්ණ වශයෙන් බනිජ තෙල් නිෂ්පාදන ආනයනය මත රඳා පවතින බැවින් ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් දේශීය ඉන්ධන මිල කෙරෙහි සෘජුවම බලපෑමක් ඇති කරනු ලැබේ. පෙට්‍රල් ඔක්ටේන් 92 සහ ඔටෝ ඩීසල් සඳහා ඉහළ දෛනික අලෙවියක් පවතින බැවින් එම ඉන්ධනවල ගෝලීය මිල උච්චාවචනයන් සෘජුවම දේශීය ඉන්ධන මිල කෙරෙහි බලපෑමක් ඇති කරනු ලැබේ. කෙසේ වෙතත්, පෙට්‍රල් ඔක්ටේන් 95 සහ සුපර් ඩීසල්වල දෛනික අලෙවිය සුළු ප්‍රමාණයක් වන බැවින් ජාත්‍යන්තර මිල වෙනස් වූ පමණින්ම දේශීය මිල වෙනස් වීමක් දක්නට නොලැබේ.

වගුව 2.2.3
ඉන්ධන සඳහා වූ සාමාන්‍ය මාසික ආනයන පිරිවැය - 2025

මාසය	බැරලයක සාමාන්‍ය ආනයන පිරිවැය (ගොඩබෑමේ පිරිවැය) (ඇමරිකානු ඩොලර්)	
	ඔක්ටේන් 92 පෙට්‍රල් (ඇමරිකානු ඩොලර්/බැරලයකට)	ලංකා ඔටෝ ඩීසල් (ඇමරිකානු ඩොලර්/ බැරලයකට)
ජනවාරි	94.73	106.95
පෙබරවාරි	100.28	106.95
මාර්තු	105.44	109.51
අප්‍රේල්	108.34	109.32
මැයි	102.29	101.34
ජූනි	93.17	103.23
ජූලි	-	-
අගෝස්තු	89.93	94.99
සැප්තැම්බර්	83.66	86.82
ඔක්තෝබර්	117.17	115.52
නොවැම්බර්	115.70	118.04
දෙසැම්බර්	116.70	113.62

මූලාශ්‍රය: ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව

2.2.3 ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, ආනයන පිරිවැය සහ අලෙවිය

i. ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සහ ආනයන පිරිවැය

ආර්ථික අර්බුදයෙන් පසු ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ විදේශ විනිමය අර්බුදය සමනය වීම සමගම 2025 වසරේදී ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන කටයුතු විධිමත් විය. ඒ අනුව දේශිය ඛනිජ තෙල් අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2025 වර්ෂය තුළ දී බොරතෙල් ඇතුළු ඛනිජ තෙල් නිෂ්පාදන 08 කින් මෙට්‍රික් ටොන් 5,006,930.56 ක ප්‍රමාණයක් ලංකා ඛනිජ තෙල් සංස්ථාව ඇතුළු ප්‍රධාන සැපයුම්කාර ආයතන හතර (04) විසින් ආනයනය කර සපයන ලද අතර ඒ සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 3,256.16 ක් වැය කර ඇත.

වගුව 2.2.4
ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය - 2025

නිෂ්පාදනය	නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.)				එකතුව
	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්එම් පාර්ක් පුද්ගලික සමාගම	
බොරතෙල්	1,679,012.61	-	-	-	**1,679,012.61**
ලංකා ඔටෝ ඩීසල්	551,134.72	331,679.29	202,801.01	148,467.88	**1,234,082.90**
ලංකා සුපිරි ඩීසල්	25,062.79	10,955.97	9,050.31	9,029.90	**54,098.97**
ඔක්ටේන් 92 පෙට්‍රල්	639,589.25	317,211.30	166,347.87	146,337.17	**1,269,485.59**
ඔක්ටේන් 95 පෙට්‍රල්	20,629.12	17,098.69	6,141.03	6,081.76	**49,950.60**
ගුවන් යානා ඉන්ධන	330,049.24	-	-	-	**330,049.24**
වැඩි සල්ෆර් දැවි තෙල්	-	-	19,122.00	-	**19,122.00**
අඩු සල්ෆර් දැවි තෙල් (180 CST)	-	247,597.65	123,531.00	-	**371,128.65**
එකතුව	**3,245,477.73**	**924,542.90**	**526,993.22**	**309,916.71**	**5,006,930.56**

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම

වගුව 2.2.5
ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන පිරිවැය - 2025

නිෂ්පාදනය	ආනයන පිරිවැය (ඇ.එ.ජ.ඩො. මිලියන)				එකතුව
	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්.එම්. පාර්ක් පුද්ගලික සමාගම	
බොරතෙල්	1,014.38	-	-	-	**1,014.38**
ලංකා ඔටෝ ඩීසල්	373.07	223.72	137.31	90.70	**824.80**
ලංකා සුපිරි ඩීසල්	16.95	7.59	6.29	16.30	**47.13**
ඔක්ටේන් 92 පෙට්‍රල්	447.18	226.89	118.37	104.70	**897.14**
ඔක්ටේන් 95 පෙට්‍රල්	14.78	12.40	4.61	4.50	**36.29**
ගුවන් යානා ඉන්ධන	232.36	-	-	-	**232.36**
වැඩි සල්ෆර් දැවි තෙල්	-	-	8.99	-	**8.99**
අඩු සල්ෆර් දැවි තෙල් (180 CST)	-	127.13	67.94	-	**195.07**
එකතුව	**2,098.72**	**597.73**	**343.51**	**216.20**	**3,256.16**

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම

ii. ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය

ජාතික ආර්ථිකයේ සියළු අංශයන්හි එනම් ප්‍රවාහන, විදුලි බල සැපයුම, කර්මාන්ත, කෘෂිකර්ම, ධීවර යනාදී අංශයන්හි ක්‍රියාකාරීත්වය බලශක්තිය සැපයුම මත රඳා පවතින බැවින් එම අංශවල සුමට ක්‍රියාකාරීත්වයක් පැවතීම සඳහා, ඉල්ලුමට සරිලන සැපයුමක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව එක් එක් ඉන්ධන සැපයුම්කරු විසින් 2025 වර්ෂයේ දී ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය සඳහා දක්වන ලද දායකත්වය පහතින් දැක්වේ. 2025 වසරේදී සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය මෙට්‍රික් ටොන් 6,450,811.34 ක් විය.

වගුව 2.2.6

ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය - 2025

නිෂ්පාදනය	අලෙවි ප්‍රමාණය (මෙ.ටො.)				එකතුව (මෙ.ටො.)
	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්එම් පාර්ක් සමාගම	
පෙට්‍රල් - 92 ඔක්ටේන්	1,486,470.00	301,302.60	159,547.36	205,617.00	**2,152,937.96**
පෙට්‍රල් - 95 ඔක්ටේන්	47,047.00	18,421.07	6,233.96	9,702.00	**81,404.03**
ලංකා ඔටෝ ඩීසල්	1,459,023.00	353,490.74	187,585.27	183,190.00	**2,183,289.01**
ලංකා සුපර් ඩීසල්	38,595.00	12,602.73	7,444.37	9,379.00	**68,021.10**
ලංකා භූමිතෙල්	229,827.00	-	-	-	**229,827.00**
ලංකා කර්මාන්ත භූමිතෙල්	14,905.00	-	-	-	**14,905.00**
ලංකා රසායනික නැප්තා	186,320.00	-	-	-	**186,320.00**
ලංකා දැවිතෙල් 1500 (වැඩි සල්ෆර්)	110,678.00	-	-	-	**110,678.00**
ලංකා දැවිතෙල් 1500 (අඩු සල්ෆර්)	97,427.00	261,768.24	-	-	**359,195.24**
ලංකා දැවිතෙල් සුපර්	226,499.00	-	-	-	**226,499.00**
ගුවන් යානා ඉන්ධන	815,721.00	-	-	-	**815,721.00**
සොල්වන්ට් (SBP) ද්‍රාවණය	1,989.00	-	-	-	**1,989.00**
ද්‍රවීකෘත ඛනිජ තෙල් වායු	19,918.00	-	-	-	**19,918.00**
ලංකා AV ගෑස්	108.00	-	-	-	**108.00**
එකතුව	**4,734,527.00**	**947,585.38**	**360,810.96**	**407,888.00**	**6,450,811.34**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම

සැලකිය යුතුයි:

බැරල් 1 = ලීටර් 159

කිලෝ ලීටර් 1 = ලීටර් 1000 = බැරල් 6.29

බොර තෙල් : මෙට්‍රික් ටොන් 1= බැරල් 7.33= කිලෝ ලීටර් 1.165

ඩීසල් : මෙට්‍රික් ටොන් 1= බැරල් 7.45= කිලෝ ලීටර් 1.19

ප්‍රෙට්‍රල් : මෙට්‍රික් ටොන් 1= බැරල් 8.5= කිලෝ ලීටර් 1.36

විදුලි උත්පාදනය සඳහා ඉන්ධන අලෙවිය

විදුලි උත්පාදනය සඳහා අවශ්‍ය ඉන්ධන සපයන එකම සැපයුම්කරු ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) කටයුතු කරන අතර, ලංකා විදුලිබල මණ්ඩලයට සහ පෞද්ගලික විදුලි නිෂ්පාදකයින්ට අවශ්‍ය ඉන්ධන ලබා දේ. 2022 වසරේ සිට 2025 වසර දක්වා විදුලි උත්පාදනය සඳහා සිදු කළ ඉන්ධන අලෙවිය 2.2.7 වගුවේ දක්වා ඇත. ඒ අනුව, 2025 වසරේදී විදුලි උත්පාදනය සඳහා ඉන්ධන ලීටර් 568,238 ක් සපයා ඇත.

2020 සිට 2025 දක්වා කාලය තුළ බොරතෙල් ආනයන විස්තර 2.2.8 වගුව මඟින් දැක්වෙන අතර 2022 සිට 2025 දක්වා කාලය තුළ පිරිපහදුව මඟින් නිෂ්පාදිත ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රමාණයන් පිළිබඳ විස්තර වගුව 2.2.9 මඟින් දක්වා ඇත.

වගුව 2.2.7
විදුලි උත්පාදනය සඳහා වූ ඉන්ධන අලෙවිය (2022 - 2025)

වසර	ලංකා විදුලිබල මණ්ඩලය (ලීටර් '000')				ලංකා විදුලි පුද්ගලික සමාගම (ලීටර් '000')			එකතුව (ලීටර් '000')
	ලංකා ඔටෝ ඩීසල්	නැප්තා	දැවි තෙල්	ලංකා සුපිරි ඩීසල්	ලංකා ඔටෝ ඩීසල්	දැවි තෙල්	ලංකා ඔටෝ ඩීසල්	
2022	86,769	46,781	181,103	12,147	115,205	123,369	5,678	**571,052**
2023	102,877	174,136	228,885	-	3,175	256,580	-	**765,653**
2024	44,647	147,251	206,467	-	16,609	164,335	-	**579,309**
2025	15,622	186,493	165,477	-	35,937	164,709	-	**568,238**

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2.2.4 බොරතෙල් ආනයනය සහ පිරිපහදු කිරීම

දිනකට බොර තෙල් බැරල් 38,000 ක පිරිපහදු ධාරිතාවක් සහිතව සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුව වර්ෂ 1969 දී ස්ථාපිත කරන ලදී. ඉන් පසු දෛනිකව බොරතෙල් බැරල් 50,000 ක ධාරිතාවක් දක්වා වර්ධනය වන පරිදි මෙම පිරිපහදුව වරින්වර නවීකරණයන්ට භාජනය කර ඇත. වර්තමානයේ රට තුළ බොරතෙල් පිරිපහදු කිරීම තුළින් රටෙහි සමස්ත වාර්ෂික ඛනිජ තෙල් ඉල්ලුමෙන් 1/3 ක් පමණ ප්‍රමාණයකට පිරිපහදුවේ මුළු නිෂ්පාදනය දායක වේ. පෙට්‍රල්, ඔටෝ ඩීසල්, දැවි තෙල්, භූමිතෙල්, ද්‍රවීකෘත වායු, ගුවන් යානා ඉන්ධන, තාර, රසායනික නැප්තා සහ සොල්වන්ට්ස් යනාදී නිමි භාණ්ඩ පිරිපහදුවෙන් නිෂ්පාදනය කරනු ලැබේ.

වගුව 2.2.8
බොර තෙල් ආනයනය (2020 - 2025)

වර්ෂය	ප්‍රමාණය (මෙ.ටො.)	ආනයන වටිනාකම (රු.මිලියන)
2020	1,666,000	98,277
2021	1,130,000	101,306
2022	743,000	180,019
2023	1,666,000	364,098
2024	1,519,284	322,404
2025	1,679,012	309,809

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2022 වර්ෂයේ දී බොරතෙල් මෙ.ටො. 743,000 ක ප්‍රමාණයක් ආනයනය කර ඇති අතර එය 2023 වර්ෂය වන විට බොරතෙල් මෙ.ටො. 1,666,000 ක් දක්වා වැඩි වී ඇත. ඒ අනුව 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ බොරතෙල් ආනයනය 124% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2024 වර්ෂය වන විට බොරතෙල් ආනයනය මෙ.ටො. 1,519,284 ක් දක්වා නැවතත් අඩු වී ඇති අතර එය 2025 වර්ෂය වන විට මෙ.ටො. 1,679,012 දක්වා වැඩි වී ඇත. වගු අංක ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2025 වසර තුළ දී බොරතෙල් මෙ.ටො. 1,794,646 ක් උපයෝගී කර ගනිමින් ඛනිජ තෙල් මෙ.ටො. 1,715,799 ක් පිරිපහදු කරන ලද අතර එම ප්‍රමාණය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදනවලින් 52% කි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2025 වසර තුළ නිමි ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන ප්‍රමාණ හා දේශීයව පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රමාණය වගුව 2.2.10 මගින් දක්වා ඇත.

වගුව 2.2.9
දේශීයව පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන (2022 - 2025)

නිෂ්පාදනය	ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)			
	2022	**2023**	**2024**	**2025**
බොරතෙල් යෙදවුම් ප්‍රමාණය	**529,773**	**1,677,033**	**1,543,839**	**1,794,646**
ඔක්ටේන් 92 පෙට්‍රල්	38,666	171,186	150, 665	181,412
ලංකා ඔටෝ ඩීසල්	128,165	505,675	443,933	518,618
දැවි තෙල් 800 සුපිරි	87,196	379,015	427,447	505,385
භූමිතෙල්	25,289	49,484	72,618	61,128
නැප්තා	30,835	129,058	121,449	150,031
එල්.පී. ගෑස්	5,687	23,800	20,815	25,527
ගුවන් යානා ඉන්ධන (Jet A 1)	57,346	233,652	207,434	273,098
ලංකා සොල්වන්ට්ස් (SBP)	2,690	1,524	1,267	600
එකතුව	**375,874**	**1,493,394**	**1,294,963**	**1,715,799**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වගුව 2.2.10
ආනයනික නිමි නිෂ්පාදන සහ දේශීයව පිරිපහදු කළ නිෂ්පාදන පිළිබඳ විස්තර - 2025

නිෂ්පාදනය	ආනයනික නිමි නිෂ්පාදන (මෙ.ටො.)	සපුගස්කන්ද පිරිපහදු නිෂ්පාදන (මෙ.ටො.)	එකතුව (මෙ.ටො.)	දේශීයව පිරිපහදු කළ ප්‍රතිශතය (%)
ලංකා ඔටෝ ඩීසල්	551,135	518,618	1,069,753	48
ලංකා සුපිරි ඩීසල්	25,063	-	25,063	-
ඔක්ටේන් 92 පෙට්‍රල්	644,890	181,412	826,302	22
ඔක්ටේන් 95 පෙට්‍රල්	15,329	-	15,329	-
භූමිතෙල්	-	61,128	61,128	100
ගුවන් යානා ඉන්ධන (Jet A 1)	330,049	273,098	603,147	45
නැප්තා	-	150,031	150,031	100
එල්.පී. ගෑස්	-	25,527	25,527	100
සොල්වන්ට්ස් (SBP)	-	600	600	100
ලංකා දැවි තෙල් 800 සුපිරි	-	505,385	505,385	100
එකතුව	**1,566,466**	**1,715,799**	**3,282,265**	**52**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2.2.5 ඉන්ධන ගබඩා කිරීම

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම ප්‍රධාන වශයෙන් කොලොන්නාව හා මුතුරාජවෙල පර්යන්ත දෙක මඟින් ඉන්ධන ගබඩා පහසුකම් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව කොලොන්නාව පර්යන්තයේ මෙට්‍රික් ටොන් 265,666 ක ඉන්ධන ගබඩා ධාරිතාවයක් ද මුතුරාජවෙල පර්යන්තයේ මෙට්‍රික් ටොන් 208,738 ක් වශයෙන් මෙට්‍රික් ටොන් 474,404 ක සමස්ත ඉන්ධන ගබඩා ධාරිතාවයක් රට තුළ පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, මෙමඟින් 2025 වර්ෂය තුළ ඉන්ධන ගබඩා කිරීම සඳහා සක්‍රීය දායකත්වයක් සපයන ලද අතර පහත 2.2.11 වගුව මඟින් ප්‍රධාන පර්යන්ත දෙක සතු ගබඩා ටැංකි ප්‍රමාණය හා සමස්ත ඉන්ධන ගබඩා ධාරිතාවය දක්වා ඇත.

බෙදාහැරීම සිදු කරයි. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොළොන්නාව සහ මුතුරාජවෙල යන ප්‍රධාන පර්යන්ත දෙක වෙතින් ඉන්ධන සැපයුම්කාර ආයතන/සමාගම් වෙත ඉන්ධන නිකුත් කිරීම සිදු කරනු ලබන අතර 2025 වර්ෂය තුළ දී ඊට අදාළ ප්‍රගතිය පහත වගුව 2.2.12 මඟින් දක්වා ඇත.

ඒ අනුව 2025 වර්ෂය තුළ වාර්තා කරනු ලබන මුළු බෙදාහැරීම් ප්‍රමාණය කිලෝ ලීටර් 4,576,443 ක් වන අතර එම බෙදාහැරීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන කිලෝ ලීටර් 3,269,546 ක් ද, ලංකා ඉන්දියානු තෙල් සමාගම් ඉන්ධන කිලෝ ලීටර් 435,047 ක් ද සිනොපෙක් සමාගමේ ඉන්ධන කිලෝ ලීටර් 463,998 ක් ද හා ආර්.එම්.පාර්ක්ස් සමාගමේ ඉන්ධන කිලෝ ලීටර් 407,852 කින් ද සමන්විත වේ. ඒ අනුව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාග මේ සමස්ථ ඉන්ධන බෙදා හැරීම්වලින් 71% ක් ලංකා ඛනිජ තෙල් සංස්ථාව සතු ඉන්ධන වන අතර ඉතිරි 29% ක ප්‍රමාණය ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් සමාගම සහ ආර්.එම්.පාර්ක්ස් සමාගම සතු ඉන්ධනවලින් සමන්විත වේ.

වගුව 2.2.11
කොලොන්නාව සහ මුතුරාජවෙල ඉන්ධන ගබඩා පර්යන්ත පිළිබඳ තොරතුරු

නිෂ්පාදනය	ටැංකි ප්‍රමාණය		ගබඩා ධාරිතාව (මෙට්‍රික් ටොන්)	
	කොළොන්නාව පර්යන්තය	මුතුරාජවෙල පර්යන්තය	කොළොන්නාව පර්යන්තය	මුතුරාජවෙල පර්යන්තය
නැප්තා	4	-	14,209	-
ඔක්ටේ න් 95 පෙට්‍රල්	3	-	18,249	-
ඔක්ටේන් 92 පෙට්‍රල්	6	14	65,473	95,105
භූමිතෙල්	1	-	10,488	-
ගුවන් යානා ඉන්ධන	4	-	38,988	-
ඔටෝ ඩීසල්	6	15	50,972	113,633
සුපර් ඩීසල්	3	-	17,232	-
දැවි තෙල්	8	-	48,120	-
සොල්වන්ට්ස්	1	-	342	-
කාර්මික භූමිතෙල්	1	-	1,593	-
නඩත්තු අවධියේ පවතින ටැංකි	2	-	-	-
එකතුව	**39**	**29**	**265,666**	**208,738**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

2.2.6 ඉන්ධන බෙදාහැරීම්

2025 වර්ෂය වන විට ඉන්ධන සැපයුම්කාර ආයතන හතරක් ඉන්ධන බෙදාහැරීමේ කටයුතුවල නිරත වන අතර ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම එම ආයතනවල ඉන්ධන අවශ්‍යතාවයන් අනුව ඉන්ධන

වගුව 2.2.12

ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය - 2025

නිෂ්පාදනය	ප්‍රමාණය (කිලෝ ලීටර්)				
	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියන් ඔයිල් සමාගම	සයිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	ආර්.එම්. පාර්ක්ස් සමාගම	එකතුව
දැවි තෙල්	396,224	-	-	-	**396,224**
ගුවන් යානා ඉන්ධන	611,925	-	-	-	**611,925**
ලංකා ඔටෝ ඩීසල්	1,020,388	195,742	225,886	183,172	**1,625,188**
ලංකා සුපර් ඩීසල්	32,618	9,114	8,989	9,378	**60,099**
නැප්තා	251,014	-	-	-	**251,014**
ඔක්ටේන් 92 පෙට්‍රල්	922,562	215,751	220,593	205,600	**1,564,506**
ඔක්ටේන් 95 පෙට්‍රල්	34,815	14,440	8,530	9,702	**67,487**
එකතුව	**3,269,546**	**435,047**	**463,998**	**407,852**	**4,576,443**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

ප්‍රස්තාරය 2.2.1

ඉන්ධන බෙදාහැරීමේ සංයුතිය - 2025



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

වගුව 2.2.13
සමස්ථ ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව - 2025

පළාත	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	ලංකා ඉන්දියානු තෙල් සමාගම	ආර්එම් පාර්ක් සමාගම	සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම	එකතුව
මධ්‍යම පළාත	72	36	10	11	**129**
නැගෙනහිර පළාත	90	19	13	15	**137**
උතුරුමැද පළාත	59	14	9	9	**91**
උතුරු පළාත	95	16	7	7	**125**
වයඹ පළාත	129	28	23	28	**208**
සබරගමුව පළාත	57	17	10	10	**94**
දකුණු පළාත	119	28	11	13	**171**
ඌව පළාත	40	16	8	9	**73**
බස්නාහිර පළාත	225	96	39	48	**408**
එකතුව	**886**	**270**	**130**	**150**	**1,436**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක්ස් සමාගම

2.2.7 ඛනිජ තෙල් වෙළඳපොළ ස්වභාවය

- **ලිහිසි තෙල් වෙළඳාම**

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූත් උසස් තත්ත්වයෙන් යුතු ලිහිසි තෙල් සහ ග්‍රීස් නිෂ්පාදන, තරඟකාරී මිල ගණන් යටතේ ශ්‍රී ලාංකීය පාරිභෝගිකයන් වෙත ලබා දීම අමාත්‍යාංශයේ අපේක්ෂාව ලෙස දැක්විය හැකිය.

1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 5 වැනි වගන්තිය සහ එහි පසුකාලීන සංශෝධනවලට ප්‍රාකාරව ලිහිසි තෙල් යනු ඛනිජ තෙල් නිෂ්පාදනයක් ලෙස අර්ථ දක්වා ඇත. එම පනත යටතේ පැවරී ඇති බලතලවලට අනුකූලව සහ 2006.05.08 දිනැති අංක 06/0858/217/015 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සහ 2006.05.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, 2006.07.12 දිනැති අංක 1453/6 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ශ්‍රී ලංකාවේ ලිහිසි තෙල් වෙළඳපොළ සම්පූර්ණයෙන්ම ලිබරල්කරණය කිරීමට පියවර ගන්නා ලදී.

ඒ අනුව, 2025 වර්ෂය වන විට දිවයිනට ලිහිසි තෙල් ආනයනය කිරීම සඳහා සමාගම් 34 කට අනුමැතිය ලබා දී ඇති අතර එම ආයතන වෙළඳ නාම 45 ක් යටතේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. මෙම සමාගම් අතුරින් ආයතන 4 ක් දේශීය ලිහිසි තෙල් නිෂ්පාදන කටයුතුවල නිරත වන අතර, ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු ප්‍රධාන ක්‍රියාකාරකම් පහක් යටතේ පවත්වාගෙන යනු ලැබේ. වගුව 2.2.14

වගුව 2.2.14
ලිහිසි තෙල් අංශයේ ක්‍රියාකාරකම් - 2025

ක්‍රියාකාරකම	විස්තරය	සමාගම් සංඛ්‍යාව
A1	ලිහිසි තෙල් සහ ග්‍රීස් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම, බෙදාහැරීම, මිශ්‍ර කිරීම සහ නිෂ්පාදනය කිරීම	4
A2	ලිහිසි තෙල් සහ ග්‍රීස් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම, සහ බෙදාහැරීම	27
B	මිශ්‍ර නොකළ සම්ප්‍රේෂණ තෙල් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම, සහ බෙදාහැරීම	1
C1	නාවික ලිහිසි තෙල් සහ ග්‍රීස් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම, සහ බෙදාහැරීම	1
C2	කාර්මික ලිහිසි තෙල් සහ ග්‍රීස් ආනයනය, අපනයනය, විකිණීම, සැපයීම, සහ බෙදාහැරීම	1

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක්ස් සමාගම

■ **තාර වෙළඳාම**

ශ්‍රී ලංකාවේ තාර නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසිනි. කෙසේ වුවද, දේශීය නිෂ්පාදනය මෙරට ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නොවන බැවින්, ස්ථාපිත නිර්ණායක මත පදනම්ව තාර ආනයනය කිරීම සඳහා වෙනත් සමාගම් වෙත ද අනුමැතිය ලබා දී ඇත. 2025 වර්ෂයේදී, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හැර අනෙකුත් සමාගම් 10 ක් සඳහා ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ නිර්දේශය මත තාර මෙට්‍රික් ටොන් 190,000 ක් ආනයනය කිරීමට මෙම අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දී ඇත. මෙම අනුමත ප්‍රමාණයෙන් මෙට්‍රික් ටොන් 82,141 ක් ආනයනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් විරුද්ධත්වයක් නොමැති බවට ලිපි නිකුත් කර ඇත. තවද, ශ්‍රී ලංකාවට තාර ආනයනය කිරීම සඳහා වූ නව ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමට අමාත්‍යාංශය මේ වන විට පියවර ගනිමින් සිටී.

■ **නැව් තෙල් වෙළඳාම**

වර්තමානයේදී, නෞකා ඉන්ධන ආනයනය කිරීම සඳහා සමාගම් 12කට අනුමැතිය ලබා දී ඇත. අදාළ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද මාසික වාර්තාවලට අනුව, 2025 වර්ෂය තුළ මෙට්‍රික් ටොන් 1,315,823 ක පමණ නෞකා ඉන්ධන ප්‍රමාණයක් අලෙවි කර ඇත.

නෞකා ඉන්ධන වෙළඳාමේ කාර්යක්ෂමතාව සහ පරාසය පුළුල් කිරීමේ අරමුණින් යුතුව නව ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ විද්වතෙකුගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කර ඇති අතර, එහි කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

■ **ජෙට් ඒ-1 ඉන්ධන**

ගුවන් යානා සඳහා ජෙට් ඒ-1 ඉන්ධන සැපයීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් සිදු කරනු ලබයි. මීට අමතරව, ජෙට් ඒ-1 ඉන්ධන ආනයනය කිරීම සඳහා කැනල් පුද්ගලික සමාගම වෙත ද අනුමැතිය ලබා දී ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතට අනුකූලව ගුවන් යානා ඉන්ධන සැපයීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇත. තවද, ශ්‍රී ලංකාව තුළ ජෙට් ඒ-1 ඉන්ධන ආනයනය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීම ද අමාත්‍යාංශයේ අරමුණ වී ඇත.

■ **කර්මාන්ත සහ සේවා සඳහා මෙරට බලපත්‍රලාභීන් විසින් ආනයනය නොකරන ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා විරෝධතාවක් නොමැති බවට ලිපි නිකුත් කිරීම - 2025**

මෙරට කාර්මික සහ සේවා අංශයන් සඳහා අත්‍යවශ්‍ය ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීමට බලපත්‍රලාභීන් වෙත බලය පවරා ඇති අතර ඇතැම් අවස්ථාවලදී, මෙම

බලපත්‍රලාභීන් විසින් ආනයනය නොකරන නිෂ්පාදන ආනයනය කිරීම සඳහා වෙනත් සමාගම් විසින් අමාත්‍යාංශය වෙත දෛනිකව ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබයි. මෙම ඉල්ලීම් සමාලෝචනය කර, අමාත්‍යාංශ අධීක්ෂණය යටතේ පත් කරන ලද කමිටුවක් මගින් නිර්දේශ නිකුත් කරනු ලැබේ.

පහත සඳහන් ආයතනවල නිර්දේශයන් ද ඒ ඒ අවස්ථාවලදී වෙන වෙනම ලබා ගනු ලැබේ:

- කර්මාන්ත අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
- රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය
- වෙනත් අදාළ ආයතන

ඒ අනුව, 2025 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් පහත සඳහන් කාණ්ඩ යටතේ ආනයනයන් සඳහා විරෝධතාවක් නොමැති බවට වන ලිපි නිකුත් කරන ලදී:

- රබර් ආශ්‍රිත නිෂ්පාදන *
- ඇඟලුම් ආශ්‍රිත නිෂ්පාදන *
- රූපලාවන්‍ය ආශ්‍රිත නිෂ්පාදන *
- තීන්ත ආශ්‍රිත නිෂ්පාදන *
- වෙනත් කාර්මික නිෂ්පාදන *
- අනෙකුත් කාර්මික සහ සේවා ආයතන වෙත අලෙවි කිරීම සඳහා වන නිෂ්පාදන **

2025 වර්ෂය තුළදී අමාත්‍යාංශය විසින්;

- කාර්මික නිෂ්පාදන සඳහා ඛනිජ තෙල් ආනයනය කිරීම වෙනුවෙන් විරෝධතාවක් නොමැති බවට ලිපි 474 ක් *
- අනෙකුත් කාර්මික සහ සේවා ආයතන වෙත අලෙවි කිරීම සඳහා ඛනිජ තෙල් ආනයනය කිරීම වෙනුවෙන් විරෝධතාවක් නොමැති බවට ලිපි 91 ක් නිකුත් කර ඇත.**

2.2.8 2025 වර්ෂය තුළ ඛනිජ තෙල් ක්ෂේත්‍රයට අදාළව ඉටුකරන ලද නියාමන කාර්යයන්

- **ඛනිජ තෙල් කර්මාන්තය සඳහා නව නියාමකවරයෙකු හඳුන්වා දීම**

ශ්‍රී ලංකාව තුළ පසුභාග ඛනිජ තෙල් කර්මාන්තය සඳහා මෙතෙක් විධිමත් නියාමන රාමුවක් නොපැවති අතර මෙම කර්මාන්තයට පෙට්‍රල්, ඩීසල්, දැවි තෙල් , ගුවන් යානා ඉන්ධන, ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව (ඛෂය) සහ ලිහිසි තෙල් වැනි ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, පිරිපහදු කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම ඇතුළත් වේ. මීට අමතරව, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අංශයන්හි අධීක්ෂණ කටයුතු ද පාර්ලිමේන්තුව විසින් පනවන ලද විවිධ නීති යටතේ සිදු කර ඇති අතර, ඒවා අදාළ නෛතික රාමුවලට යටත්ව තවදුරටත් ක්‍රියාත්මක වේ.

ඒකීය සහ ඒකාබද්ධ නියාමන ප්‍රවේශයක් නොමැති වීම හේතුවෙන් බොහෝ විට එකම කාර්යයන් කිහිප පාර්ශ්වයක් විසින් වරින් වර සිදු කරනු ලබන අතර, එමගින් අකාර්යක්ෂමතාවන් නිර්මාණය වී රටේ බලශක්ති අංශය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම අභියෝගාත්මක වී ඇත. ඛනිජ තෙල් වෙළඳපල මෙහෙයුම් ව්‍යාප්ත වීම සහ නව තරඟකාරී ආයතන වෙළඳපලට ප්‍රවිෂ්ට වීමත් සමඟ, නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම සහ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම වෙනුවෙන් ස්වාධීන නියාමකවරයෙකුගේ සහ ශක්තිමත් නියාමන රාමුවක අවශ්‍යතාවය රජය විසින් හඳුනාගෙන ඇත.

ඒ අනුව, කර්මාන්තයට අදාළ අනෙකුත් ව්‍යවස්ථා ඒකාබද්ධ කිරීමටත්, ඉහළ මට්ටමේ බලශක්ති සංක්‍රාන්ති පනතක් කෙටුම්පත් කිරීමටත් පියවර ගෙන ඇත. මෙ මගින් බලශක්ති පාරිභෝගිකයන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම සහ බලශක්ති අංශය සඳහා මහජන සහභාගීත්වය ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ.

මේ අතර, ලිහිසි තෙල් වෙළඳපල නියාමනය කිරීම සඳහා ස්ථිර නියාමකවරයෙකු මෙතෙක් පත් කර නොමැත. එවැනි පත්වීමක් සිදු කරන තෙක්, අමාත්‍ය මණ්ඩල තීරණ මත පදනම්ව, මෙම ක්ෂේත්‍රයේ නියාමන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) වෙත බලය පවරා ඇත.

ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය කිරීම සම්බන්ධයෙන් නව රජයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඛනිජ

තෙල් කර්මාන්තය සඳහා ස්ථිර නියාමකයෙකු පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

- **ඉන්ධන පිරවුම්හල් ඉදි කිරීම සහ මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාම පිළිබඳ මාර්ගෝපදේශ හඳුන්වා දීම**

1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ විධිවිධානවලට අනුකූලව, ආරම්භක අවස්ථාවේදී ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සහ බෙදා හැරීම සිදු කරන ලද්දේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) විසින් පමණි. කෙසේ වෙතත්, ඉන්ධන වෙළඳපල ලිහිල්කරණයත් සමග ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අමතරව තවත් සමාගම් කිහිපයකට - එනම් ලංකා ඉන්දියානු ඔයිල් සමාගම (LIOC), සයිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම (Sinopec), සහ ආර්.එම්. පාර්ක්ස් පුද්ගලික සමාගම (R.M. Parks) සහ යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා පුද්ගලික සමාගම (UP) වෙත ඉන්ධන ආනයනය සහ බෙදා හැරීම සඳහා අවසර ලබා දෙන ලදී.

එසේ වුවද, ඇතැම් ගැටලු හේතුවෙන් යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා පුද්ගලික සමාගම (United Petroleum Lanka (Pvt) Ltd.) මේ වන විට ශ්‍රී ලංකා වෙළඳපල තුළ තම මෙහෙයුම් කටයුතුවලින් ඉවත් වී ඇත.

ඛනිජ තෙල් වෙළඳපලට නව තරඟකරුවන් ප්‍රවිෂ්ට වීමත් සමඟ, ඉන්ධන පිරවුම්හල් ස්ථාපනය කිරීමේදී සහ පවත්වාගෙන යාමේදී අවම ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා පැහැදිලි මාර්ගෝපදේශ හඳුන්වා දීමේ අවශ්‍යතාවයක් මතු විය. ඒ අනුව, බලශක්ති අමාත්‍යාංශය විසින් පහත සඳහන් ප්‍රධාන අංශ ආවරණය වන පරිදි මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත:

- ඉන්ධන පිරවුම්හල් සඳහා ස්ථානයන් තෝරා ගැනීමේ නිර්ණායක
- ඉන්ධන පිරවුම්හල් ඉදිකිරීම සඳහා වන නිර්ණායක.
- ඉන්ධන පිරවුම්හල් පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම සඳහා වන නිර්ණායක

මෙම මාර්ගෝපදේශ අනුගමනය කරන ලෙස ඉන්ධන සපයනු ලබන සමාගම් වෙත නිල වශයෙන් දැනුම් දී ඇති අතර, මහජන දැනුවත් කිරීම සඳහා ඒවා අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ ද ප්‍රසිද්ධ කර ඇත. තවද, නව ඉන්ධන සැපයුම්කරුවන් මෙම ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන්නේද යන්න සහතික කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කරනු ලබයි.

මීට අමතරව, නව රජයේ ප්‍රතිපත්ති තීරණයක් අනුව, ශ්‍රී ලංකාව තුළ නව ඉන්ධන පිරවුම්හල් පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දීමේ සංශෝධිත ක්‍රියාපටිපාටියක් හඳුන්වා දී ඇත. මේ සඳහා කමිටුවක් පත් කර ඇති අතර, නව පිරවුම්හල් පිහිටුවීම සඳහා සුදුසු ස්ථාන හඳුනා ගනිමින් වාර්තාවක් සකස් කරමින් පවතී. අනාගතයේදී සිදු කරන සියලුම පිරවුම්හල් ස්ථාපනයන් මෙම වාර්තාව මගින් හඳුන්වා දෙනු ලබන මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කරනු ලැබේ.

- **ඛනිජ තෙල් නිෂ්පාදන සෘජුවම පාරිභෝගික ආයතන වෙත සැපයීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම**

ඉන්ධන සපයනු ලබන සමාගම් විසින් දිවයින පුරා ස්ථාපිත ඉන්ධන පිරවුම්හල් මගින් මෙන්ම, කාර්මික ආයතන, සමාගම් සහ හඳුනාගත් ඇතැම් රජයේ ආයතන ඇතුළු විවිධ පාරිභෝගික ආයතන වෙත සෘජුව ඉන්ධන සැපයීම මගින් ද ඉන්ධන බෙදා හරිනු ලබයි.ඉන්ධන පිරවුම්හල් පිහිටුවීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත්තද, එවැනි පාරිභෝගික ආයතන වෙත සෘජුවම තොග වශයෙන් ඉන්ධන සැපයීම සඳහා මින් පෙර අමාත්‍යාංශයෙන් විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. 2023 ඔක්තෝබර් 31 දින වන විට, ඉන්ධන සපයනු ලබන සමාගම් විසින් දිවයින පුරා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 3,385 ක් පමණ පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.

මෙම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන හරහා සැලකිය යුතු ඉන්ධන ප්‍රමාණයක් දෛනිකව බෙදා හරිනු ලබන බැවින්, එවැනි මධ්‍යස්ථාන පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අවශ්‍යතාවය අමාත්‍යාංශය විසින් හඳුනා ගන්නා ලදී. ඒ අනුව, දැනට ලියාපදිංචි

පාරිභෝගික සේවා මධ්‍යස්ථාන අතුරින් අඛණ්ඩව පවත්වාගෙන යා යුතු මධ්‍යස්ථාන තීරණය කිරීම සඳහා අවම නිර්ණායක හඳුන්වා දීමටත්, නව මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම නියාමනය කිරීමටත් පියවර ගෙන ඇත.

මෙම අවම ප්‍රමිතීන් සපුරාලන පාරිභෝගික සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා ඉන්ධන සපයනු ලබන සමාගම් විසින් අමාත්‍යාංශයේ විධිමත් අනුමැතිය ලබාගත යුතුය.

2025 වර්ෂය අවසානය වන විට ක්‍රියාත්මක වන පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ.

වගුව 2.2.15
පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව - 2025

ඉන්ධන සපයන සමාගම	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC)	521
ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC)	178
සයිනොපෙක් එනර්ජි ලංකා සමාගම (Sinopec)	14
එකතුව	**713**

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සයිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම.

- **අලුතින් පිහිටුවන ලද සහ පවතින පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම**

අලුතින් පිහිටුවන ලද පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සහ දැනට පවතින මධ්‍යස්ථාන නැවත ලියාපදිංචි කිරීම බලශක්ති අමාත්‍යාංශය හරහා සිදු කරනු ලබයි.

අදාළ විවිධ රාජ්‍ය ආයතන, කොන්ත්‍රාත්කරුවන්, පෞද්ගලික ආයතන ආදිය සඳහා තොග ඉන්ධන සැපයීම සඳහා මෙම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන පිහිටුවා ඇත.

- **ඉන්ධන මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීම**

දිගුකාලීනව පැවති අක්‍රමවත් ඉන්ධන මිලකරණ ක්‍රමවේදය තුළින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දුන් අතර, කලින් කලට සිදු කරන ලද මිල සංශෝධනයන් මඟින් ද ඉන්ධන මිලෙහි විශාල උච්චාවචනයන් එකවර සිදු කරනු දක්නට ලැබිණි. මෙම තත්ත්වයන් මගහරවා ගැනීම අරමුණු කර ගෙන 2022 මැයි මස සිට ක්‍රියාත්මක වන පරිදි පිරිවැය ආවරණය වන මිලකරණ සූත්‍රයක් මඟින් ඉන්ධන මිල තීරණය කිරීමට රජය මූලික පියවර ගන්නා ලදී.

2025 වර්ෂය තුළ අවස්ථා දහයකදී (10) ඉන්ධන මිල සංශෝධනයන් සිදු කරන ලදී. 2024 දෙසැම්බර් මාසයේ ඉන්ධන මිල සමඟ 2025 දෙසැම්බර් මාසයේ මිල ගණන් සැසඳීමේදී, පහත දැක්වෙන පරිදි මිල අඩු වී ඇති බව නිරීක්ෂණය විය.

- ඔක්ටේන් 92 පෙට්‍රල් - 5% කින්
- ඔක්ටේන් 95 පෙට්‍රල් - 10% කින්
- ඔටෝ ඩීසල් - 3% කින්
- භූමිතෙල් - 4% කින්

වගුව 2.2.16
2025 වර්ෂය තුළ වාර්තා වූ උපරිම සහ අවම වෙළෙඳපොළ මිල ගණන්

නිෂ්පාදනය	උපරිම මිල (රු./ලීටරය)	වාර්තා වූ මාසය	අවම මිල (රු./ලීටරය)	වාර්තා වූ මාසය
ඔක්ටේන් 92 පෙට්‍රල්	309	ජනවාරි/ පෙබරවාරි	293	අප්‍රේල්/ මැයි
ඔක්ටේන් 95 පෙට්‍රල්	371	ජනවාරි/ පෙබරවාරි	335	සැප්තැම්බර්/ ඔක්තෝබර්/ නොවැම්බර්/ දෙසැම්බර්
ඔටෝ ඩීසල්	289	ජූනි/ ජූලි	274	අප්‍රේල්/ මැයි
ලංකා සුපිරි ඩීසල්	331	ජනවාරි/ පෙබරවාරි/මාර්තු	313	අගෝස්තු/ සැප්තැම්බර්
ලංකා භූමිතෙල්	185	ජූනි/ ජූලි /අගෝස්තු	178	අප්‍රේල්/ මැයි

මූලාශ්‍රය: බලශක්ති අමාත්‍යාංශය

ප්‍රස්තාරය 2.2.2
2025 වර්ෂය තුළ වාර්තා වූ වෙළඳපොළ මිල ගණන්



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව


ලංකා සුපර් ඩීසල් මිල
ලීටරයක මිල (රු.)
500
400
300
200
100
0
මාසය
ජන.
පෙබ.
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝ.
සැප්තැ.
ඔක්තෝ.
නොවැ.
දෙසැ.
ලංකා ඩීසල් ලීටරයක මිල (රු.) - 2024
පෙට්‍රල් ඩීසල් බැරලයක මිල (රු.) - 2025
මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව


ලංකා ඔටෝ ඩීසල් මිල
ලීටරයක මිල (රු.)
400
350
300
250
200
150
100
50
0
මාසය
ජන.
පෙබ.
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝ.
සැප්තැ.
ඔක්තෝ.
නොවැ.
දෙසැ.
ලංකා ඩීසල් ලීටරයක මිල(රු.) -2024
ලංකා ඩීසල් බැරලයක මිල(රු.) - 2025
මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව


ලංකා භූමිතෙල් මිල
300
250
200
150
100
50
0
මාසය
ජන.
පෙබ.
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝ.
සැප්තැ.
ඔක්තෝ.
නොවැ.
දෙසැ.
ලංකා භූමිතෙල් ලීටරයක මිල(රු.) - 2024
ලංකා භූමිතෙල් ලීටරයක මිල(රු.) -2025
මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2.2.9 ඛනිජ තෙල් ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

- **හම්බන්තොට ප්‍රදේශයේ අපනයන අභිමුඛ ඛනිජ තෙල් පිරිපහදුවක් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම**

ඉහත ව්‍යාපෘතිය ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා චයිනා පෙට්‍රෝලියම් සහ කෙමිකල් කෝපරේෂන් (China Petroleum & Chemical Corporation) සමඟ ගිවිසුම්වලට එළඹීම සඳහා අමාත්‍යාංශය විසින් කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

ඒ අනුව, චයිනා පෙට්‍රෝලියම් සහ කෙමිකල් කෝපරේෂන් (China Petroleum) Chemical Corporation) සමඟ සාකච්ඡා වාර හයක් පවත්වා ඇති අතර එම සාකච්ඡා මේ වන විට අවසන් අදියරේ පවතී. මේ සම්බන්ධයෙන් අවසාන එකඟතාවයකට පැමිණීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට නියමිතය.

- **සපුගස්කන්ද පිරිපහදුව නවීකරණය කිරීම සහ නව පිරිපහදුවක් ඉදිකිරීම.**

වර්තමානයේදී රටේ බොරතෙල් අවශ්‍යතාවයෙන් දළ වශයෙන් 25% ක් සපුගස්කන්ද පිරිපහදුව මඟින් සපුරා ගන්නා අතර ඉතිරි 75% ක ප්‍රමාණය ආනයනය මඟින් සපුරාලනු ලබයි. මෙම ආනයන මත යැපීම විදේශ විනිමය සංචිත කෙරෙහි දැඩි පීඩනයක් එල්ල කරයි. දේශීය බොරතෙල් අවශ්‍යතාවය මෙරටේදීම නිෂ්පාදනය කිරීමේ අරමුණට අනුකූලව, පවතින පිරිපහදුව නවීකරණය කළ යුතුව ඇත. මීට අමතරව, දිනකට බැරල් 100,000 ක නිෂ්පාදන ධාරිතාවයකින් යුත් නව පිරිපහදුවක් ඉදිකිරීමේ අවශ්‍යතාවයක් ද පවතී. මේ වන විට ඒ සඳහා ජාත්‍යන්තර සමාගම්වලින් අභිලාෂ කැඳවා ඇති අතර, එයට ප්‍රතිචාර වශයෙන් අභිලාශ 20 ක් ලැබී ඇත.

- **ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංවර්ධන ව්‍යාපෘතිය**

යටත් විජිත සමයේ බ්‍රිතාන්‍ය රජය විසින් නැව් සඳහා ඉන්ධන සැපයීම පිණිස ඉදිකරන ලද ත්‍රිකුණාමලය චීන වරාය ඉහළ ටැංකි අංගනය මේ වන විට යළි සංවර්ධනය කෙරෙමින් පවතී. මෙම පහසුකම මෙට්‍රික් ටොන් 10,000 බැගින් වූ ගබඩා ධාරිතාවයකින් යුත් ටැංකිවලින් සමන්විත වේ.

මෙම ඉන්ධන ගබඩා ටැංකි සංවර්ධනය කිරීම සඳහා 2022 ජනවාරි 11 දිනැති අංක 21/2285/325/050 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් පහත සඳහන් විධිවිධාන යටතේ වසර 50 ක කාලයකට ටැංකි බදු දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත:

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) සඳහා ඉන්ධන ටැංකි 24 ක්
- ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) සඳහා ඉන්ධන ටැංකි 14 ක්
- ත්‍රිකුණාමලය පෙට්‍රෝලියම් ටර්මිනල්ස් (පුද්ගලික) සමාගම (TPTL) සඳහා ඉන්ධන ටැංකි 61ක්

i. ත්‍රිකුණාමලය ඉහළ ටැංකි අංගනයේ ටැංකි 24ක් සංවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2025.03.03 දිනැති CP/25/0321/825/018 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇති අතර, ජැටිය සහ ඉහළ ටැංකි අංගනය සම්බන්ධ කරන නළ මාර්ග ඉදිකිරීම සඳහා 2025.12.01 දිනැති 25/2192/825/018-I දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත.

2025 වසර තුළ, ටැංකි සංකීර්ණය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. සම්පූර්ණ කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් අතරට ස්ථාන සකස් කිරීම, ටැංකි පිරිසිදු කිරීම සහ පරීක්ෂා කිරීම, ආරක්ෂක යටිතල පහසුකම් ස්ථාපනය කිරීම, උපයෝගිතා පද්ධති සංවර්ධනය සහ අනෙකුත් අත්‍යවශ්‍ය කටයුතු සූදානම් කිරීම් ඇතුළත් විය. ඊට අමතරව, ගිනි ආරක්ෂණ සහ අපජල කළමනාකරණ පහසුකම් ඉදිකිරීම, ටැංකි පුනරුත්ථාපන කටයුතු සහ උපයෝගිතා සේවා සැපයීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ඉදිරියට යන අතර රටේ ඛනිජ තෙල් ගබඩා ධාරිතාව සහ බලශක්ති ආරක්ෂාව තවදුරටත් ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ii. ත්‍රිකුණාමලය ඛනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගමට (TPTL) අයත් ටැංකි සංවර්ධනය කිරීම (ටැංකි 61)

ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගමට අයත් ඉන්ධන ටැංකි 61 සංවර්ධනය කිරීම සඳහා වන මූලික ක්‍රියාකාරකම් 2025 වසර තුළ සිදු කරන ලද අතර, ඒවාට ස්ථාන ප්‍රවේශ වැඩිදියුණු කිරීම්, තාක්ෂණික තක්සේරු කිරීම් සහ කෙටිකාලීන හා දිගුකාලීන සංවර්ධන උපාය මාර්ග සකස් කිරීම ඇතුළත් වේ.

ව්‍යාපෘතිය සඳහා සුදුසු ආයෝජකයෙකු හඳුනා ගැනීම සඳහා, අභිලාෂ (EOI) කැඳවනු ලැබූ අතර සමාගම් හත (07) කින් යෝජනා ලැබුණි. ලද අභිලාෂ දැනට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ව්‍යාපෘති කමිටුව සහ සාකච්ඡා කමිටුව විසින් ඇගයීමට ලක් කෙරෙමින් පවතී.

මේ අතර, ශ්‍රී ලංකාව, ඉන්දියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුම ට අත්සන් තැබීමෙන් අනතුරුව, ත්‍රිකුණාමලය කලාපීය බලශක්ති මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ වැඩසටහනට මෙම ටැංකි සංවර්ධනය ද ඒකාබද්ධ කිරීම පිළිබඳ සාකච්ඡා සිදු කරමින් පවතී. ඒ අනුව, අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ත්‍රෛපාර්ශ්වික උපදේශන සහ සුදුසු ව්‍යාපාර ආකෘතියක් (business model) සකස් කිරීම මේ වන විට සිදු වෙමින් පවතී.

- **ත්‍රිකුණාමලය බලශක්ති කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය (UAE) අතර සහයෝගීතාව**

ත්‍රිකුණාමලය බලශක්ති කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, ඉන්දියානු රජය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍ය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම සඳහා අනුමැතිය පතා බලශක්ති අමාත්‍යාංශය සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය විසින් 2025.03.28 දින ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් 2025.04.02 දිනැති අංක 25/0567/825/031-I දරණ තීරණය මගින් එම යෝජනාවට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාව වෙනුවෙන් බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2025.04.05 දින මෙම අවබෝධතා ගිවිසුමට අත්සන් තබන ලදී. මේ සම්බන්ධයෙන් වන ත්‍රෛපාර්ශ්වික සාකච්ඡා මේ වන විට සිදුවෙමින් පවතී.

- **දිවයින පුරා විද්‍යුත් වාහන ආරෝපණ මධ්‍යස්ථාන (EV Charging Station) ස්ථාපිත කිරීම**

මෙම සැලසුම මගින් විද්‍යුත් වාහන ආරෝපණ මධ්‍යස්ථාන 10 ක් ඉදිකිරීම ඉලක්ක කරන අතර, ඉන් මධ්‍යස්ථාන 7 ක වැඩකටයුතු දැනටමත් නිම කර පාරිභෝගිකයින් සඳහා සේවා සපයනු ලබයි.

තවත් ස්ථාන 03 ක් එනම්, අනුරාධපුරය, දෙමටගොඩ සහ බම්බලපිටිය යන ප්‍රදේශවල ඉදිකිරීමේ කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.

- **ඉන්ධන ගබඩා ධාරිතාව ව්‍යාප්ත කිරීම**

වගුව 2.2.17
ඉන්ධන ගබඩා ධාරිතාව ව්‍යාප්ත කිරීම

විස්තරය	ඇස්තමේන්තුගත පිරිවැය (රුපියල් මිලියන)	මූල්‍ය ප්‍රභවය	වත්මන් තත්ත්වය
කොලොන්නාව පර්යන්තයේ මුළු ධාරිතාව මීටර් කියුබ් 64,000 කින් යුත් ටැංකි 6 ක් ඉදිකිරීම	3,374	ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL)	කොන්ත්‍රාත්තුව 2025.09.17 දින ප්‍රදානය කරන ලද අතර භූමිය 2025.09.30 දිනභාර දෙන ලදී. ටැංකි ඉදිකිරීමෙන් 8.5% ක් සම්පූර්ණ කර ඇත.
කොලොන්නාව පර්යන්තයේ මුළු ධාරිතාව මීටර් කියුබ් 22,000 කින් යුත් ටැංකි 2 ක් ඉදිකිරීම	1,470.4	ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL)	2025.12.24 දින ලංසු ඇගයීම් කමිටුව හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව පත් කර ඇත.
මුතුරාජවෙල පර්යන්තයේ මුළු ධාරිතාව මීටර් කියුබ් 40,000 කින් යුත් ටැංකි 3 ක් ඉදිකිරීම	3,496	ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL)	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර ප්‍රසම්පාදන ලේඛන සකස් කරමින් පවතී

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

- **ඉන්ධන නළ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම**

වගුව 2.2.18
ඉන්ධන නල මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම

විස්තරය	ඇස්තමේන්තුගත පිරිවැය (රුපියල් මිලියන)	මූල්‍ය ප්‍රභවය	වත්මන් තත්ත්වය
කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා අඟල් 18 ක විෂ්කම්භයකින් යුත් නළ මාර්ගයක් ඉදිකිරීම	2,852.5	ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL)	සංශෝධිත තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ඉදිරිපත් කර ඇති අතර, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු රැස්වීම පැවැත්වීමට නියමිතය. අවසාන ලේඛනය පරීක්ෂා කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.
කොලොන්නාව පර්යන්තයේ සිට කැලණිතිස්ස බලාගාරය දක්වා අඟල් 12 ක විෂ්කම්භයකින් යුත් නළ මාර්ගයක් ඉදිකිරීම	1,444	ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL)	2025.12.15 දින කැබිනට් අනුමැතිය ලැබී ඇත. ලංසු ඇගයීම් කමිටුව හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව පත්කිරීමට නියමිතය.
ගුවන් යානා ඉන්ධන ප්‍රවාහනය සඳහා මුතුරාජවෙල සිට කටුනායක ගුවන් තොටුපළ දක්වා නළ මාර්ගයක් ඉදිකිරීම	18,000	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC)	කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් ව්‍යාපෘතිය නතර කරන ලද අතර පසුව මෙම කාරණය උපදෙස් සහ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2.3 ඉදිරි දැක්ම 2026

විදුලි අංශය

2006 වසරේ දී පහත සඳහන් ව්‍යාපෘති විදේශ මූල්‍යකරණය යටතේ ආරම්භ කිරීමට නියමිතව ඇත.

- උසස් බෙදාහැරීමේ කළමනාකරණ පද්ධතියක් (ADMS) සහිත බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථාන හතරක් සහ බෙදාහැරීමේ අංශ 04 සඳහා උසස් මනුකරණ යටිතල පහසුකම් (AMI) ස්ථාපිත කිරීම.

- මෙ.වො.600 මහ ඔය පොම්ප කළ ජල ගබඩා විදුලි බලාගාරයේ (PSHP) සවිස්තරාත්මක සැලැසුම සකස් කිරීම (ලංකා විදුලිබල මණ්ඩලය විසින් ආසියානු සංවර්ධන බැංකුණය හරහා මෙය සිදුකෙරේ) ආරම්භ කර ඇත.

මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇති අතර මූලික කටයුතු ඉදිරියේ දී ආරම්භ කෙරෙනු ඇත.

- කිලිනොච්චි සිට හබරණ දක්වා උතුරු පළාතේ කි.වෝ. 400 සම්ප්‍රේෂණ ජාලය සංවර්ධනය කිරීම.

- නොරොච්චෝලේ - වාරියපොළ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය සහ වාරියපොළ වහරු අංගනය ඉදිකිරීම.

- පාදුක්ක කි.වෝ. 220 ග්‍රිඩ් උපපොළේ ස්ථිතික සමමුහුර්ත හානිපූරක ඒකකය (STATCOM) ස්ථාපනය කිරීම.

- නව හබරණ ග්‍රිඩ් උපපොළේ මෙ.වො.ඇ. 75 සමමුහුර්ත ධාරිත්‍රක ඒකකයක් ස්ථාපනය කිරීම.

- මීගමු ප්‍රදේශයේ ලංකා විදුලි පුද්ගලික සමාගමේ බෙදාහැරීමේ පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය.

- පූඬලු ඔය සහ පූඬලු ඔය ඇල්ල ද්විතීයික අංශ යෝජනා ක්‍රමය - ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය.

- සුළං සම්පත් තක්සේරුව, දැදුරු ඔය පාවෙන ප්‍රකාශ වෝල්ටීයතා සූර්ය බලශක්ති ව්‍යාපෘතිය, කරච්චි සුළං බලශක්ති ව්‍යාපෘතිය.

බලශක්ති අංශය

- සපුගස්කන්ද පිරිපහදුව නවීකරණය කිරීම සහ නව පිරිපහදුවක් ඉදිකිරීම සඳහා ආයෝජකයෙකු තෝරාගෙන එහි වැඩකටයුතු ආරම්භ කිරීම.

- ත්‍රිකුණාමලය ඉහළ ටැංකි අංගනයේ ටැංකි 24 ක් සංවර්ධනය කිරීමේ කටයුතු අඛණ්ඩව කරගෙන යාම.

- ත්‍රිකුණාමලය පෙට්‍රෝලියම් ටර්මිනල්ස් (පුද්ගලික) සමාගමට (TPTL) අයත් ටැංකි (ටැංකි 61) සංවර්ධනය කිරීමේ කටයුතු අඛණ්ඩව කරගෙන යාම.

- අනුරාධපුරය, දෙමටගොඩ සහ බම්බලපිටිය යන තවත් ස්ථාන තුනක (03) විද්‍යුත් වාහන ආරෝපණ මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සහ දිවයින පුරා විද්‍යුත් වාහන ආරෝපණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.

- ඉන්ධන ගබඩා ධාරිතාව ව්‍යාප්ත කිරීම.

- ඉන්ධන නළ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම.

03 වන පරිච්ඡේදය
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

03 වන පරිච්ඡේදය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදයම් ඒවායේ බදු ගෙවන කාලසීමාව නොසළකා ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4) දේපළ පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

බලශක්ති අමාත්‍යාංශය
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ඒසීඒ-එෆ්

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	සත්‍ය 2025	2024	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**			-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
2,400,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	2,137,599,304	3 ,158,283,029	
2,400,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**2,137,599,304**	3,158,283,029	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,865,819,147	7,941,916,912	ඒසීඒ-3
-	තැන්පතු		18,349,826	896,711	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		13,128,523	11,525,177	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,897,297,496**	7,954,338,800	
2,400,000,000	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**4,034,896,801**	11,112,621,829	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		669,398,526	613,559,261	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**3,365,498,275**	10,499,062,568	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	
196,150,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	186,302,291	172,701,438	ඒසීඒ-2(ii)
234,620,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	210,831,878	231,472,868	ඒසීඒ-2(ii)
626,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	461,177,700	343,781,526	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
500,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	46,650	500	ඒසීඒ-2(ii)
1,057,270,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**858,358,519**	747,956,332	
	මූලධන වියදම්				
6,580,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	4,071,351	5,167,451	
3,939,826,676	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,900,937,591	2,456,703,933	
1,884,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	1,370,099,719	7,530,808,674	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
292,292,000	හැකියා වර්ධනය	14	972,300	527,644,374	
3,976,500,000	වෙනත් මූලධන වියදම්	15	3,711,874,572	15,603,436,028	
10,099,698,676	**මුළු මූලධන වියදම් (උ)**		**6,987,955,532**	26,123,760,460	
	තැන්පතු ගෙවීම්		17,498,454	1,071,012	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		18,686,017	11,585,407	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		36,184,470	12,656,419	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		7,882,498,522	26,884,37,211	
(46,787,700,000)	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(4,517,000,247)	(16,385,310,643)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(4,517,000,247)	(16,385,998,643)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	688,001	ඒසීඒ-3
			(4,517,000,247)	(16,385,310,642)	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

බලශක්ති අමාත්‍යාංශය

ජීපීජී-8

2025 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ජීපීජී-6	630,620,523	745,479,913
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ජීපීජී-5/5(ඒ)	37,443,559	31,886,066
මුදල් හා මුදල් සමාන දෑ	ජීපීජී-3	-	688,001
මුළු වත්කම්		**668,064,083**	**778,053,980**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		26,639,642	21,933,522
දේපළ පිරියත හා උපකරණ සංචිතය		630,620,523	745,479,913
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ජීපීජී-5(බී)	9,550,000	9,550,000
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ජීපීජී-4	1,253,916.91	402,544
අග්‍රිම ශේෂය	ජීපීජී-3	-	688,001
මුළු වගකීම්		**668,064,083**	**778,053,980**

පිටු අංක…07…….සිට ……… දක්වා ජීපීජී 1 සිට ජීපීජී 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ………. සිට ………. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

……………………
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 26/02/26

……………………
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 26/02/26

……………………………………
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 26/

[illegible]ගේ චන්ද්‍රසේන
ප්‍රධාන මූල්‍ය නිලධාරි
බලශක්ති අමාත්‍යාංශය
නො: 437 ගාලු පාර,
කොළඹ 03.

මහාචාර්ය. කේ.ටී.එම් උදයංග හේමපාල
ලේකම්
බලශක්ති අමාත්‍යාංශය
අංක. 437. ගාලු පාර,
කොළඹ 03.

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

බලශක්ති අමාත්‍යාංශය
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය

		තත්‍ය 2025 රු.	සංශෝධිත 2024 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
මුළු බදු ලැබීම්		-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	1	301,661,904	742,592,829
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2	2,104,171,328	2,634,824,309
අග්‍රිම ලැබීම්	3	1,865,131,146	7,941,916,912
අත්තිකාරම් අයකර ගැනීම්	4	12,754,736	10,410,029
තැන්පතු ලැබීම්	3	18 ,349,826	896,711
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		**4,302,068,941**	**11,330,640,790**
<u>අඩුකළා - මුදල් වැය කිරීම්</u>			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	5	396,559,719	403,125,625
සහනාධාර සහ මාරුකිරීම්	6	149,175,800	112,277,526
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	7	1,170,525,731	7,995,785,499
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	8	1,677,610	1,245,856
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	9	668,710,525	613,559,261
අත්තිකාරම් ගෙවීම්	10	18,806,017	11,428,107
තැන්පතු ගෙවීම්	11	17,498,454	1,071,012
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		**2,422,953,856**	**9,138,492,886**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය)=(අ)-(ආ)		**1,879,115,085**	**2,192,147,904**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
පොළී		-	-
ලාභාංශ		-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-	-
උපණය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)		-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්:</u>			
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	12	1,879,115,085	2,191,459,902
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		**1,879,115,085**	**2,191,459,902**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)		**(1,879,115,085)**	**2,191,459,902)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)			688,001
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
දේශීය ණය ගැනීම්		-	-
විදේශීය ණය ගැනීම්		-	-
ප්‍රදානයන් ලැබීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-	
දේශීය ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		**-**	**688,001**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		**-**	**688,001**

3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	මුල් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු)	ආදායම් ඇස්තමේන්තුව (රු)	ප්‍රමාණය (රු)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.02.21	බදු නොවන ආදායම් හා වෙනත් ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට අදාල ගාස්තු	3,000,000,000.00	2,400,000,000.00	2,137,599,304.40	89%

3.5 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන (රු)	අවසාන ප්‍රතිපාදන (රු)		
පුනරාවර්තන	1,061,0000,000.00	1,057,270,000.00	1,009,356,619.00	95%
ප්‍රාග්ධන	20,081,000,000.00	10,584,730,000.00	6,987,955,532.00	66%

3.6 මු.රෙ 208 ප්‍රකාරව, ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
				මුල් ප්‍රතිපාදන (රු)	අවසාන ප්‍රතිපාදන (රු)		
1	දුම්රිය දෙපාර්තමේන්තුව	අමාත්‍යාංශයේ නිලධාරීන් වෙනුවෙන් නිකුත් කල නිදහස් දුම්රිය බලපත්‍ර	පුනරාවර්තන	621,100.00	621,100.00	621,100.00	100%
2	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ලං.වි.ම විසින් ලබා ගත් විදේශ ණය ගිණුම් ගත කිරීම	මූලධන	7,676,000,000.00	3,976,000,000.00	3,711,874,572.28	93%

3	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ලං.වි.ම විසින් කොළඹ නගරයේ අපද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් විදුලිය උත්පාදනය කිරීමට අදාළ වියදම් ගිණුම්ගත කිරීම	මූලධන	1,204,000,000.00	1,204,000,000.00	892,937,484.00	74%
5	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ලං.වි.ම වෙත කොරියානු රජයේ ප්‍රදානයක් ලෙස ලද බැරට බලශක්ති පද්ධතියට අදාළ වියදම් ගිණුම්ගත කිරීම	මූලධන	900,000.00	717,868,673.00	717,868,673.00	100%
8	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන සඳහා එක්සත් ජනපද නියෝජතායනය මඟින් ලබාදුන් ප්‍රදානයන්ට අදාළ වියදම් ගිණුම්ගත කිරීම	මූලධන	297,000,000.00	290,692,000.00	-	0%
9	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ශ්‍රී.ලං.ප.බ.ම වෙත විදේශ ප්‍රදාන ලෙස ලැබෙන උපකරණවල වටිනාකම ගිණුම්ගත කිරීම	මූලධන	163,000,000.00	163,000,000.00	50,299,193.84	31%
10	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ශ්‍රී.ලං.ප.බ.නි සභාව වෙත ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතාය-නයෙන් ප්‍රදානයන් ලෙස ලැබෙන උපකරණවල වටිනාකම ගිණුම්ගත කිරීම	මූලධන	32,000,000.00	38,308,000.00	36,307,758.28	95%
11	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ශ්‍රී.ලං.වි.ම. වෙත කෙරවලපිටිය - වරාය දෙවන භූගත සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාගත් විදේශ ණය ගිණුම්ගත කිරීම	මූලධන	7,000,000,000.00	483,031,327.00	-	0%

12	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ශ්‍රී.ලං.වි.ම. වෙත තිව් හබරණ කප්පල්තුරෙයි සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් AIIB වෙතින් ලබාගත් විදේශණය ගිණුම්ගත කිරීම	මූලධන	1,000,000.00	1,000,000.00	-	0%
13	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ශ්‍රී.ලං.වි.ම. වෙත සාම්පූර් කප්පල්තුරෙයි සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් AIIB වෙතින් ලබාගත් විදේශණය ගිණුම්ගත කිරීම	මූලධන	1,000,000.00	1,000,000.00	-	0%
14	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	සුනිත්‍ය බලශක්ති අධිකාරිය	පුනරාවර්තන	155,000,000.00	155,000,000.00	154,999,900.00	100%
15	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	සුනිත්‍ය බලශක්ති අධිකාරිය	මූලධන	200,000,000.00	200,000,000.00	149,993,337.00	75%
16	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	පරමාණුක බලශක්ති මණ්ඩලය	පුනරාවර්තන	50,000,000.00	50,000,000.00	50,000,000.00	100%
17	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	පරමාණුක බලශක්ති මණ්ඩලය	මූලධන	30,000,000.00	30,000,000.00	5,649,677.92	19%
18	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	පරමාණුක බලශක්ති නියාමන සභාව	පුනරාවර්තන	65,000,000.00	65,000,000.00	57,602,000.00	89%
19	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	පරමාණුක බලශක්ති නියාමන සභාව	මූලධන	7,000,000.00	7,000,000.00	6,368,623.42	89%
20	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය	පුනරාවර්තන	77,000,000.00	77,000,000.00	49,400,000.00	64%
21	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය	මූලධන	50,000,000.00	50,000,000.00	42,600,000.00	85%
22	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ජාතික විදුලි උපදේශන සභාව	පුනරාවර්තන	58,000,000.00	58,000,000.00	-	0%
23	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ජාතික විදුලි උපදේශන සභාව	මූලධන	51,000,000.00	51,000,000.00	-	0%

24	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය පිහිටුවීම	පුනරාවර්තන	58,000,000.00	58,000,000.00	-	0%
25	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය පිහිටුවීම	මූලධන	50,000,000.00	50,000,000.00	-	0%
26	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	විදුලි උත්පාදනය සඳහා න්‍යෂ්ඨික බලය සැලසුම් කිරීමේ වැඩසටහන	මූලධන	2,500,000.00	2,500,000.00	-	0%

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු)	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත (රු)	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	622,482,387.45	622,482,387.45	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	8,138,136.00	8,138,136.00	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

සටහන : 2025 වර්ෂයට අදාළ විගණකාධිපති වාර්තාව ඇමුණුම 1 ලෙස අමුණා ඇත.

04 වන පරිච්ඡේදය
කාර්යසාධන දර්ශක

04 වන පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

4.1 අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

බලශක්ති අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ විදුලිබල සහ බලශක්ති අංශයන්ගෙන් සමන්විත වේ. විදුලිබල අංශය මගින් විදුලිබල සැපයුමට අදාළ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කටයුතු කරන අතර බලශක්ති අංශය මගින් ඛනිජ තෙල් සැපයුම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

අමාත්‍යාංශයේ අංශ දෙකෙහිම ප්‍රධාන කාර්ය සාධන දර්ශක පහත වගුවේ දැක්වේ.

විශේෂිත දර්ශක		මිනුම් ඒකකය	2025 ප්‍රතිඵලවල සමස්ත ප්‍රගතිය
කාර්ය සාධන දර්ශක (KPI)	විස්තරය		
විදුලිබල අංශය			
01. ජාතික ජාලයෙහි සමස්ථ ස්ථාපිත පුනර්ජනනීය බලශක්ති ධාරිතාවය	සමස්ත ස්ථාපිත විදුලිබල ධාරිතාවයෙන් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව නියෝජනය කරන මෙ.වො. ප්‍රමාණය	ප්‍රතිශතය	67%
02. සමස්ථ විදුලි ජනන සංයුතියෙහි පුනර්ජනනීය බලශක්ති දායකත්වය	සමස්ත විදුලිබල උත්පාදන මිශ්‍රණයෙන් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව (ජලවිදුලි, සුළං, සූර්ය, ජෛව ස්කන්ධ) යොදා ගනිමින් උත්පාදිත ගි.වො.පැ. ප්‍රමාණය	ප්‍රතිශතය	60%
03. ඉහළ වෝල්ටීයතා සම්ප්‍රේෂණ ජාලයෙහි දිග (සම්ප්‍රේෂණ වැරගැන්නුම් / පද්ධති ධාරිතාව)	විදුලිය උත්පාදනය කෙරෙන ස්ථානවල සිට විබැර මධ්‍යස්ථාන (load centers) වෙත විදුලිය සම්ප්‍රේෂණයට පහසුකම් සලසන සම්ප්‍රේෂණ මාර්ගවල දිග සහ ග්‍රිඩ් උපපොළවල් ගණන	කි.වෝ. 220 මුදුන් සම්ප්‍රේෂණ මාර්ග කි.මී. ගණන	999
		කි.වෝ. 220 භූගත සම්ප්‍රේෂණ මාර්ග කි.මී. ගණන	22
		කි.වෝ. 132 මුදුන් සම්ප්‍රේෂණ මාර්ග කි.මී.ගණන	2350
		කි.වෝ. 132 භූගත සම්ප්‍රේෂණ මාර්ග කි.මී.ගණන	55
		ග්‍රිඩ් උපපොළවල් ගණන	92
04. ලංවිම (CEB) කොටස් වශයෙන් බෙදා වෙන් කිරීමෙන් අනතුරුව පිහිටුවන ලද ප්‍රධාන සමාගම් හතරෙහි මෙහෙයුම් සූදානම සම්පූර්ණ කිරීම.	ලංවිම (CEB) කොටස් වශයෙන් බෙදා වෙන් කිරීමෙන් අනතුරුව පිහිටුවන ලද ප්‍රධාන සමාගම් හතරෙහි සම්පූර්ණ මෙහෙයුම් සූදානම	ප්‍රතිශතය	50%
බලශක්ති අංශය			
05. ප්‍රමාණවත් තරම් ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදන සැපයුමක් පැවතීම	ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම, පිරිපහදු කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ අලෙවිකරණය	ප්‍රතිශතය	100%

06. ඛනිජතෙල් සහ ස්වභාවික වායු ගවේෂණ කටයුතු සිදු කිරීම.	ඛනිජ තෙල් සහ ස්වාභාවික වායු ගවේෂණය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීම.	ප්‍රතිශතය	10%
07. ඛනිජතෙල් ක්ෂේත්‍රය සඳහා ස්වාධීන නියාමකයෙකු හඳුන්වාදීම.	කාර්යක්ෂම, විශ්වසනීය සහ තිරසර ඛනිජ තෙල් වෙළඳපොළක් ප්‍රවර්ධනය කිරීම සඳහා සාධාරණ තරඟකාරිත්වය, විනිවිදභාවයෙන් යුතු මිලකරණ යාන්ත්‍රණයන්, පාරිභෝගික ආරක්ෂාව, සුරක්ෂිතබව සහ ගුණාත්මක ප්‍රමිතීන් සහ අදාළ නීති සහ රෙගුලාසි හා අනුකූල වීම තහවුරු කෙරෙන පරිදි ඛනිජ තෙල් කර්මාන්තය ස්වාධීනව නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම.	ප්‍රතිශතය	60%
08. ලිහිසි තෙල් සහ නෞකා ඉන්ධන සැපයුම් පිළිබඳ ප්‍රතිපත්ති සහ නියාමන රාමු සකස් කිරීම සම්පූර්ණ කිරීම.	ක්ෂේත්‍රයේ මනා පාලනය, වෙළඳපොළ තරඟකාරිත්වය, ගුණාත්මක ප්‍රමිතීන් සහ කර්මාන්තයේ තිරසර සංවර්ධනය සහතික වන පරිදි ලිහිසි තෙල් සහ නෞකා ඉන්ධන සැපයුම් කර්මාන්ත පාලනය කෙරෙන ප්‍රතිපත්ති සහ නියාමන රාමු අවසානයකට පත් කිරීම සහ අනුමැතිය ලබා ගැනීම.	ප්‍රතිශතය	70%

මූලාශ්‍රය: බලශක්ති අමාත්‍යාංශය

05 වන පරිච්ඡේදය
තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

05 වන පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 විදුලිබල ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධන ඉලක්ක (SDG)

තිරසර සංවර්ධන ඉලක්කය 7 - සැමට දැරිය හැකි විශ්වාසනීය, තිරසාර සහ නවීන බලශක්ති සඳහා ප්‍රවේශය සහතික කිරීම

බලශක්ති සැපයුම් සහ අදාළ පරිවර්තන පද්ධතිවලට ප්‍රවේශයක් නොමැතිවීම මානව හා ආර්ථික සංවර්ධනයට බාධාවකි. පරිසරය මඟින් පුනර්ජනනීය හා පුනර්ජනනීය නොවන බලශක්ති සම්පත් මාලාවක්, එනම් සුළං, සූර්ය, ජල, තාපය, ජෛව ඉන්ධන, ස්වභාවික වායු, ගල් අඟුරු හා පෙට්‍රෝලියම්ල සපයනු ලබයි.

හරිතාගාර වායු විමෝචනය අවම කිරීමට පියවර නොගෙන පොසිල ඉන්ධන භාවිතය වැඩිවීම ගෝලීය දේශගුණික විපර්යාස බලපෑම් ඉහල නැංවීමට හේතුවක් වෙයි. බලශක්ති කාර්යක්ෂමතාව හා පුනර්ජනනීය බලශක්ති භාවිතය ඉහල නැංවීම, දේශගුණික විපර්යාස අවම කිරීමටත් ආපදා අවදානම අවම කිරීමටත් දායක වෙයි.

ඒ අනුවල පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා විදුලිබල අංශය දායක වී ඇත.

- විදුලි බෙදාහැරීම් ජාලය වැඩි දියුණු කිරීම මඟින් මුළු නිවාස මුළු නිවාස 99.9% සඳහා විදුලි බලය ලබාදීම සහ ගුණාත්මක විදුලිය බෙදාහැරීමක් සහතික කිරීම.
- මෙරට විදුලිය සඳහා ප්‍රවේශය 100% දක්වා ඉහල නැංවීමග (විදුලි ප්‍රවේශය ලබා දීම දුෂ්කර බවට හඳුනාගෙන ඇති ප්‍රදේශ වන ඉතිරි 0.01% සඳහා මධ්‍යම ජාලයෙන් බැහැර විදුලි සැපයුම් වශයෙන් විදුලිය ලබා දී ඇත)
- වසර 2030 වන විට මෙරට ජනන මිශ්‍රණයෙන් 70%ක කොටසක් පුනර්ජනනීය බලශක්ති මඟින් සම්පාදනය කිරීම.
- වසර 2025 වන විට මෙ.වො. 1578.95ක සූර්ය බලශක්ති ධාරිතාවයක් ජාතික විදුලිබල ජාලයට එකතු කිරීම.

5.2 අදාළ තිරසාර සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය

තිරසර සංවර්ධන ඉලක්ක අරමුණු	තිරසර සංවර්ධන ඉලක්ක දර්ශක	මිනුම් ඒකකය	2030 සඳහා සැලසුම්ගත ඉලක්කය	2025 දක්වා ප්‍රගතිය
ඉලක්කය 7 - සැමට දැරිය හැකි, විශ්වාසදායක, තිරසාර හා නවීන බලශක්තිය සඳහා ප්‍රවේශය සහතික කිරීම				
7.1 වසර 2030 වන විටද දැරිය හැකි, විශ්වාසදායක සහ නවීන බලශක්ති සේවාවන් සඳහා විශ්වීය ප්‍රවේශය සහතික කිරීම.	7.1.1 විදුලිය සඳහා ප්‍රවේශය සහිත ජනගහනයේ අනුපාතය	ප්‍රතිශතය (%)	99.9%	98.2%
	7.1.2 පිරිසිදු ඉන්ධන සහ තාක්ෂණය මත මූලිකව යැපෙන ජනගහනයේ අනුපාතය	ජනගහනයේ (%)	99.9%	22.4%
7.2 වසර 2030 වන විටද ගෝලීය බලශක්ති මිශ්‍රණයේ පුනර්ජනනීය බලශක්ති දායකත්වය සැලකිය යුතු ලෙස වැඩි කිරීම්	7.2.1 ප්‍රභවය අනුව සමස්ත ස්ථාපිත ධාරිතාව තුළ පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය (ජල විදුලි, ඝන ජෛව ඉන්ධන, සුළං, සූර්ය බලය, ද්‍රව ජෛව ඉන්ධන, ජීව වායුව, භූ තාප, මුහුදු තරංග සහ අපද්‍රව්‍ය) (නියෝජන දර්ශකය)	ප්‍රතිශතය (%)	70%	67%
	7.2.2 අවසන් බලශක්ති පරිභෝජනය තුළ පුනර්ජනනීය බලශක්තියෙහි දායකත්වය.	ප්‍රතිශතය (%)	70%	60%

7.b වසර 2030 වන විට, නවීන හා තිරසර වූ බලශක්ති සේවාවන් සැපයීම උදෙසා යටිතල පහසුකම් පුළුල් කිරීම සහ තාක්ෂණය වැඩිදියුණු කිරීම්	7.b.1 ශ්‍රී ලංකාවේ ස්ථාපිත පුනර්ජනනීය බලශක්ති උත්පාදන ධාරිතාව (ඒකපුද්ගල වොට් පරිභෝජනය) (පුනරාවර්තනය 12.a.1)	දළ දේශීය නිෂ්පාදිතයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියනයක් සඳහා වැයවන බලශක්තිය (Toe per million LKR of GDP)	286	277.6

5.3 තිරසාර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග

ජයග්‍රහණ

1. ශ්‍රී ලංකාවේ විදුලි ආවරණය 99.9% මට්ටම දක්වා ඉහළ නංවා ඇත.
2. විදුලි ජනනය සඳහා පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ආකර්ශනීය මට්ටමක පවත්වා ගැනීමට හැකි වී ඇති අතර විදුලි ජනනය සඳහා පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය සහ අදාළ වර්ෂය පහත පරිදි වී ඇත.

	ප්‍රභවය	වර්තමාන ස්ථාපිත ධාරිතාව (මෙ.වො.)	2025 වසරේ ධාරිතා එක්කිරීම් (මෙ.වො.)
1	කුඩා ජල විදුලි	437.3	5.29
2	සූර්ය බලශක්තිය	331.9	161.85
3	පියැසි පාදක සූර්ය බලශක්තිය	2,243.0	766.00
4	සුළං	287.0	-
5	ජෛව ස්කන්ධ	64.3	1.50
	මුළු එකතුව	**3,363.5**	**934.64**



3. පුනර්ජනනීය බලශක්ති පාලන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා මූලික පියවර ගෙන ඇත.

2025 වසර අවසානය වන විට ප්‍රධාන ජල විදුලි බලාගාරවලින් හැර සමස්ත මෙ.වො. 3,363.5ක පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණයක් එක් කිරීම සිදුව ඇත. පියැසි පාදක සූර්ය බලශක්ති පද්ධතිවලින් මෙ.වො. 766ක ප්‍රමාණයක් ද සහිතව 2025 වසරේ දී විදුලිබල පද්ධතිය වෙත එක් කෙරුණු බලශක්තිය ප්‍රමාණය මෙ.වො. 934.64 කි.

අභියෝග

දිගුකාලීන විදුලි ජනන සැලැස්මේ සඳහන් පියැසි පාදක සූර්ය බලශක්තිය පද්ධතිගත කිරීමේ ඉලක්කය වාර්ෂිකව මෙ.වො.160 ක් වුවද, මෑත වසර ගණනාවක දී ම අනපේක්ෂිත ප්‍රමාණයකින් එය අභිබවා ගොස් ඇත. ණය ආධාර යටතේ සුහුරු මනු (ස්මාර්ට් මීටර) සහ SCADA පද්ධති පහසුකම් සම්බන්ධ කරමින් ජාතික විදුලිබල පද්ධතිය ක්‍රම ක්‍රමයෙන් සංවර්ධනය කිරීමට කටයුතු කරමින් ඇත. එහෙත් උත්පාදිත සියලුම බලශක්තිය අවශෝෂණය කර ගැනීමේ හැකියාව විදුලිබල පද්ධතියට නොමැති අතර විශේෂයෙන්ම හිරු එළිය හොඳින් ලැබෙන, ඉල්ලුම අඩු නිවාඩු දිනවල බලශක්තිය කප්පාදු කිරීමට සිදුව ඇත.

EDL සමාගම සහ ලංකා විදුලි පුද්ගලික සමාගම මගින් පාලනය වන විදුලිය බෙදාහැරීමේ පද්ධතිය නව SCADA පද්ධතියක් සහ උසස් මනුකරණ යටිතල පහසුකම් (AMI) සහිතව සංවර්ධනය කිරීම පිණිස යෝජනා ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත. මෙරට පුරා නව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති බිහි කිරීමට ඉඩ සැලසෙන පරිදි සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ශක්තිමත් කිරීම ද ඉදිරියේ දී සිදු කෙරේ.

තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වීමේදී ඛනිජ තෙල් ක්ෂේත්‍රය අභියෝග රැසකට මුහුණ දෙයි. එහි ප්‍රධාන අභියෝගයක් වන්නේ ජාතික බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කරමින් ඛනිජ තෙල් නිෂ්පාදනවල අඛණ්ඩ සැපයුම පවත්වාගෙන යාමත්, එමෙන්ම වඩාත් පිරිසිදු හා තිරසාර බලශක්ති ප්‍රභවයන් වෙත සංක්‍රමණය වීම සඳහා සහාය දීමත් ය.

විද්‍යුත් වාහන ආරෝපණ පහසුකම් වැනි නවෝත්පාදන තාක්ෂණ හඳුන්වාදීම ඇතුළුව ඉන්ධන ගබඩා කිරීම, බෙදාහැරීම සහ සිල්ලර අලෙවි යටිතල පහසුකම් නවීකරණය කිරීම සඳහා සැලකිය යුතු මූල්‍ය හා තාක්ෂණික ආයෝජන අවශ්‍ය වේ. මීට අමතරව, ජාතික දේශගුණික බැඳීම් සහ තිරසාර සංවර්ධන අරමුණු සමඟ අනුකූලව පාරිසරික බලපෑම් අවම කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය.

තවද, කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුත් සහ තිරසාර ඛනිජ තෙල් කර්මාන්ත කළමනාකරණයක් තහවුරු කිරීම සඳහා ඵලදායී ඛනිජ තෙල් නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ අධීක්ෂණ පද්ධති ශක්තිමත් කිරීම ඇතුළු නියාමන හා ආයතනික රාමු තවදුරටත් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

06 වන පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

06 වන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

■ බලශක්ති අමාත්‍යාංශය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	45	32	13
තෘතියික	06	04	02
ද්විතියික	122	87	41
ප්‍රාථමික	64	45	19
මුළු එකතුව	**237**	**168**	**75**

මූලාශ්‍රය: බලශක්ති අමාත්‍යාංශය

6.2 අමාත්‍යාංශයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේද යන්න

ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරී තනතුරු 13 ක පුරප්පාඩු තිබේ. අමාත්‍යාංශයේ කාර්යභාරයේ ස්වභාවය අනුව, හදිසි ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමේදී මෙම පුරප්පාඩු මඟින් ප්‍රමාදයන් ඇති කරන අතර, එය අත්‍යවශ්‍ය වාර්තා කාලෝචිත ලෙස සකස් කිරීමට සෘජුවම බලපායි. තවද, මෙම පුරප්පාඩු තනතුරුවල රාජකාරි ආවරණය කිරීමට පවතින මාණ්ඩලික නිලධාරීන් අවශ්‍ය වේ. එය අධික වැඩ බරක් ඇති කිරීමට හේතු වූ අතර එය සේවක අභිප්‍රේරණය අඩුවීමට හේතු වී තිබේ.

තවද, ප්‍රමාණවත් ද්විතීයික සහ තෘතීයික මට්ටමේ නිලධාරීන් නොමැතිකම දැනට සේවයේ නියුතු නිලධාරීන්ගේ වැඩ බර වැඩි කර ඇති අතර එමඟින් තවදුරටත් මෙහෙයුම් ප්‍රමාදයන් ඇති වේ. ඔවුන්ගේ කාර්යබහුල කාලසටහන් කාර්ය මණ්ඩලයේ චිත්ත ධෛර්යය අඩුවීමට ද හේතු වේ.

එබැවින්, මෙම තත්ත්වය අමාත්‍යාංශයේ සංවිධානාත්මක කාර්ය සාධනයට සෘජුව හා අහිතකර ලෙස බලපායි.

6.3 මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම්

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	01	වසර 01	75,000.00	-	දේශීය	දැනුම ලබා ගන්නා ලදී
02	රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම	05	පැය 150	50,000.00	-	දේශීය	දැනුම ලබා ගන්නා ලදී
03	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොතෙහි කැපී පෙනෙන ලක්ෂණ	01	දින 01	9,500.00	-	දේශීය	දැනුම ලබා ගන්නා ලදී
04	ප්‍රසම්පාදන ලේඛන (ලංසු ලියවිලි) පිළිබඳ පුහුණුව	04	දින 01	50,000.00	-	දේශීය	සාර්ථකව නිම කරන ලදී
05	ලිපිගොනුකරණය	02	දින 01	13,000.00	-	දේශීය	සාර්ථකව නිම කරන ලදී
06	කාර්යාල සටහන් ලිවීම	01	දින 01	6,500.00	-	දේශීය	සාර්ථකව නිම කරන ලදී
07	නව වැටුප් චක්‍රලේඛය අනුව රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප සකස් කිරීම පුහුණු පාඨමාලාව	01	දින 01	6,500.00	-	දේශීය	සාර්ථකව නිම කරන ලදී

08	නිවාඩු විෂය භාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම	01	දින 01	6,500.00	-	දේශීය	දැනුම ලබා ගන්නා ලදී
09	කාර්යාල කළමනාකරණ හා මුදල් රෙගුලාසි පාඨමාලාව	01	දින 02	12,000.00	-	දේශීය	දැනුම ලබා ගන්නා ලදී
10	දෙමළ පාඨමාලාව (කාර්යාල කාර්ය සහායක හා රියදුරු)	06	පැය 100	30,000.00	-	දේශීය	සාර්ථකව නිම කරන ලදී
11	ව්‍යාපෘති කළමනාකරණ පුහුණු පාඨමාලාව	03	දින 02	36,000.00	-	දේශීය	සාර්ථකව නිම කරන ලදී
12	පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී අයුරින් පවත්වා ගෙන යාම	01	දින 01	6,500.00	-	දේශීය	සාර්ථකව නිම කරන ලදී
13	කාර්යාල ක්‍රම සම්බන්ධ පුහුණු පාඨමාලාව	01	දින 02	12,000.00	-	දේශීය	දැනුම ලබා ගන්නා ලදී
14	කාර්යාල ඵලදායීතාවය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පාඨමාලාව	02	දින 04	60,000.00	-	දේශීය	සාර්ථකව නිම කරන ලදී
15	කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරී පුහුණුව	04	දින 02	48,000.00	-	දේශීය	දැනුම ලබා ගන්නා ලදී
16	ප්‍රසම්පාදන ලේඛන පුහුණු පාඨමාලාව	04	දින 01	50,000.00	-	දේශීය	දැනුම ලබා ගන්නා ලදී
17	සයිබර් ආරක්ෂණ පුහුණුව	55	දින 02	25,800.00	-	දේශීය	සාර්ථකව නිම කරන ලදී
18	රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	03	වර්ෂ 01	240,000.00	-	දේශීය	සාර්ථකව නිම කරන ලදී
19	බදුකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	01	වර්ෂ 01	95,000.00	-	දේශීය	සාර්ථකව නිම කරන ලදී
20	දකුණු ආසියානු උප කලාපීය ආර්ථික සහයෝගිතා (SASEC) වැඩසටහනේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම සහ 2025 සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම	01	දින 01		-	දේශීය	දැනුම ලබා ගන්නා ලදී
	ADB බලශක්ති ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමේ දකුණු ආසියානු උප කලාපීය ආර්ථික (SASEC) වැඩසටහන		දින 06		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදී
21	නව න්‍යෂ්ටික බල වැඩසටහනක් සඳහා ජාතික ස්ථාවරයක් ස්ථාපිත කිරීම පිළිබඳ අන්තර් කලාපීය පුහුණු පාඨමාලාව	01	දින 10		-	විදේශීය	සාර්ථකව නිම කරන ලදී
	ජාත්‍යන්තර සූර්ය බලශක්ති සන්ධානයේ 08 වන සැසිවාරය		දින 11		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී
22	බලශක්ති අන්තර් සම්බන්ධතාවය පිළිබඳ 15 වන විශේෂඥ ක්‍රියාකාරී කණ්ඩායම	01	සති 02		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී
	පිරිසිදු බලශක්ති සංක්‍රාන්ති පිළිබඳ උප කලාපීය වැඩමුළුව		දින 04		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදී
	SASEC උප කලාපයේ විදුලි උපකරණ සඳහා කලාපීය සැපයුම් සහ වටිනාකම් දාම සංවර්ධනය ශක්තිමත් කිරීම පිළිබඳ වැඩමුළුව		දින 05		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී

23	කාබන් ශුන්‍ය ඉලක්කය කරා පිරිසිදු බලශක්ති සංක්‍රාන්තිය පිළිබඳ හැඳින්වීම	01	දින 07		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදි
	හම්බන්තොට BESS ව්‍යාපෘතිය සඳහා දැනුවත් කිරීමේ සහ දැනුම හුවමාරු වැඩසටහන		දින 06		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදි
24	කුඩා මොඩියුලර් ප්‍රතික්‍රියාකාරකවල ආරක්ෂිත සහ ආරක්ෂිත යෙදවීම වැඩිදියුණු කිරීම පිළිබඳ දකුණු මධ්‍යම සහ නැගෙනහිර ආසියානු පදනම් යටිතල පහසුකම් (පළමු) පෑන්-ප්‍රාදේශීය සමුළුව	01	දින 02		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදි
25	ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව (TEC) 2024/2025 යටතේ ශ්‍රී ලංකාවේ දූපත් සේවා නිලධාරීන් සඳහා හත්වන මැදි වෘත්තීය පුහුණු වැඩසටහන	01	දින 15		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී
26	චීනය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සංවර්ධනය සහ දරිද්‍රතාවය පිටු දැකීමේ ක්ෂේත්‍රයේ අත්දැකීම් හුවමාරුව පිළිබඳ සම්මන්ත්‍රණය	01	දින 27		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදි
27	ගෝලීය සංවර්ධන මුලපිරීම යටතේ සංවර්ධනය වෙමින් පවතින රටවල කාබන් උදාසීනත්වය සහ බලශක්ති නවෝත්පාදන සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	02	දින 28		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී
	2025 නොවැම්බර් 10 සිට නොවැම්බර් 16 දක්වා හයිඩ්‍රජන් බලශක්තිය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන - පිරිවැය ඉන්දීය රජය විසින් දරනු ලැබේ.	01	දින 07		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී
28	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ගෝලීය බලශක්ති පාලන පද්ධතිය ගොඩනැගීම පිළිබඳ සම්මන්ත්‍රණය	01	දින 17		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී
	ජාල ස්ථායිකරණය සඳහා BESS සහ ස්මාර්ට් ජාලකය පිළිබඳ දැනුම හුවමාරු වැඩසටහන	01	දින 07		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදි
29	ගෝලීය සංවර්ධන මුලපිරීම යටතේ සංවර්ධනය වෙමින් පවතින රටවල කාබන් උදාසීනත්වය සහ බලශක්ති නවෝත්පාදන සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	02	දින 28		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී
30	න්‍යෂ්ටික බලශක්ති යටිතල පහසුකම් සංවර්ධනයේ කාලීන ගැටළු පිළිබඳ තාක්ෂණික රැස්වීම	01	දින 07		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී
	18 වන දකුණු ආසියානු බලශක්ති ලේකම්වරුන්ගේ වටමේස සමුළුව (PSRT) සහ 04 වන ද්විවාර්ෂික පොදුරාජ්‍ය මණ්ඩලීය තිරසාර බලශක්ති සංසදය		දින 06		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදි

	ආසියා පිරිසිදු බලශක්ති සංසදය	01	දින 05		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදී
	තිරසාර හා අඩු කාබන් අනාගතයක් සඳහා නව්‍ය විසඳුම්		දින 04		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී
31	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ප්‍රකාශ වෝල්ටීයතා ව්‍යාපෘති හරහා දරිද්‍රතාවය පිටුදැකීමේ ප්‍රතිපත්ති සහ භාවිතය පිළිබඳ සම්මන්ත්‍රණය	01	දින 25		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදී
32	20 වන ආසියානු පිරිසිදු බලශක්ති සංසදය	01	දින 07		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදී
33	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ප්‍රකාශ වෝල්ටීයතා ව්‍යාපෘති හරහා දරිද්‍රතාවය පිටුදැකීමේ ප්‍රතිපත්ති සහ භාවිතය පිළිබඳ සම්මන්ත්‍රණය- පිරිවැය චීන රජය විසින් දරනු ලැබේ.	01	දින 54		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී
34	අන්තර් සම්ප්‍රේෂණ මාර්ග	01	දින 05		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදී
35	ශ්‍රී ලංකාව සඳහා පුනර්ජනනීය බලශක්තිය, සංවර්ධනය සහ තත්ත්ව සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය - පිරිවැය චීන රජය විසින් දරනු ලැබේ.	01	දින 15		-	විදේශීය	සාර්ථකව සහභාගි වන ලදී
36	20 වන ආසියානු පිරිසිදු බලශක්ති සංසදය - කොරියානු බලශක්ති ඒජන්සිය සමඟ සහයෝගයෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් දරනු ලබන පිරිවැය	01	දින 07		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී
	න්‍යෂ්ටික බලශක්ති වැඩසටහනක් සඳහා ආරක්ෂාවන් සම්බන්ධයෙන් නීතිමය රාමුව සහ නියාමන යටිතල පහසුකම් පිළිබඳ ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව - IAEA විසින් ආවරණය කරනු ලබන පිරිවැය		දින 08		-	විදේශීය	දැනුම ලබා ගන්නා ලදී

මූලාශ්‍රය: බලශක්ති අමාත්‍යාංශය

අමාත්‍යාංශයට පවරා ඇති සාමූහික මූලික වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමේදී, මානව සම්පත් උපායමාර්ගිකව සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක් වන අතර, එයට කාර්ය මණ්ඩල හැකියාවන්, කුසලතා, කුසලතා, සහයෝගීතාවය සහ උද්යෝගය ආයතනයේ අවශ්‍යතා සමඟ පෙළගැස්වීම ඇතුළත් වේ.

පුහුණු වැඩසටහන් කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරනය, දැනුම, කුසලතා වැඩි දියුණු කිරීමට උපකාරී වන අතර එමගින් අපේක්ෂිත ප්‍රමිතීන්ට කාර්ය සාධනය ඉහළ නංවයි.

07 වන පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

07 වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම්)			
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		

3.2	මූල්‍ය බලතල පවරාදී තිබීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව.. රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණය චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධීකරණ නිළධාරියෙකු පත් කර එම එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	104(03), 104(04) ප්‍රකාරව කටයුතු සිදු කරනු ලබයි	
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල් බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අක්‍රිය බැංකු ගිණුමක් නොමැත		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		

12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකුල වීම	අනුකුල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකුල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකුල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකුල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකුල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකුල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකුල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකුල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකුල වේ		
15	**ආදායම් ගිණුම්**	අනුකුල වේ		
15.1	අදාළ රෙගුලාසි වලට අනුකුලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකුල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකුල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකුල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකුල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකුල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකුල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකුපත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකුල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකුල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්තිය ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකුල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනයකොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන්කර තිබීම	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 (1) හි 03 වන ඡේදයට අනුව, මෙය අවශ්‍ය නොවන බව දන්වා ඇත.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨනිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ENR/E/ME/2025/FA/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 මැයි 29 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

බලශක්ති අමාත්‍යාංශය

ශීර්ෂය 119 - බලශක්ති අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 119 - බලශක්ති අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව බලශක්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, බලශක්ති අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව බලශක්ති අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව බලශක්ති අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

2023 අප්‍රේල් 25 දිනැති අංක අමප/23/0632/621/031 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ලියාපදිංචි ලිහිසිතෙල් කර්මාන්තයේ එක් බලපත්‍රලාභියෙකුගෙන් වාර්ෂික ස්ථාවර ලියාපදිංචි ගාස්තුව ලෙස රු. 6,000,000 ක මුදලක්ද, ඊට අමතරව වාර්ෂික විකුණුම් පරිමාව පාදක කරගනිමින් එම වටිනාකමින් සියයට 0.9ක මුදලින්, වාර්ෂික ස්ථාවර ලියාපදිංචි ගාස්තුව අඩුකොට ඉතිරි මුදල විචල්‍ය ලියාපදිංචි ගාස්තුව ලෙස අයකළ යුතුය. ඒ අනුව, අමාත්‍යාංශය එක් එක් බලපත්‍රලාභියා සමඟ ඇතිකරගත් ගිවිසුම්වල 3.5 වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභී ආයතන විසින් ආනයන සහ විකුණුම් වලට අදාල මාසික තොරතුරු අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි මාසිකව, අර්ධ වාර්ෂික තොරතුරු අර්ධ වර්ෂය අවසන් වී දින 14ක් ඇතුළත සහ වාර්ෂික විගණනය කළ තොරතුරු මාස 06ක් ඉක්මවීමට පෙර අමාත්‍යාංශයට සහ මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. 2025 වර්ෂය තුළ වාර්ෂික බලපත්‍ර ලබාගත් ආයතන 35න් ආයතන 16ක් පමණක් ස්වතක්සේරුව මත විචල්‍ය ලියාපදිංචි ගාස්තු ගෙවා තිබුණි. අමාත්‍යාංශය විසින් ගිවිසුම් ප්‍රකාරව අදාල තොරතුරු බලපත්‍රලාභීන්ගෙන් ලබාගෙන පරීක්ෂා කර විචල්‍ය ලියාපදිංචි ගාස්තු නිවැරදිව ගණනය කර, අයකර ගැනීමට හෝ හිඟ විචල්‍ය ලියාපදිංචි ආදායම ලෙස හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. නියැදි විගණන පරීක්ෂණයට අනුව කර්මාන්තයේ සිටින සීමාසහිත පොදු සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද 2025 වර්ෂයේ කාර්තු වාර්තා වලට අනුව ලිහිසිතෙල් විකුණුම් ආදායම මත ලැබිය යුතු විචල්‍ය ලියාපදිංචි ගාස්තුව වූ රු. 20,523,031 ක් විචල්‍ය ලියාපදිංචි ගාස්තු එකතුකර ගැනීමට හෝ හිඟ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

ඉවතලන ප්ලාස්ටික්/ පොලිතීන් මගින් ඉන්ධන නිපදවීම සඳහා 2009 වර්ෂයේ අමාත්‍යාංශයට සියයට 60ක හිමිකාරීත්වයක් සහිතව මූලික ප්‍රාග්ධනයද ඇතුළුව රු. මිලියන 300කට අධික වියදමක් දරා සීමා සහිත පොලිප්ටෝ ලංකා (පුද්ගලික) සමාගම පිහිටුවා සමාගමේ අපේක්ෂිත අරමුණු ඉටු නොවීම හේතුවෙන්, 2018 සැප්තැම්බර් 26 දින මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ගිවිසුමක් අත්සන් කර තිබුණද, එම ගිවිසුම අනුව නිමවුම්කරු විසින්

අමාත්‍යාංශයට 2018 වර්ෂයේ සිට වසර 10කින් බේරුම් කළ යුතු ප්‍රතිෂ්ඨාව වූ රු. 82,019,500ක වටිනාකම හා අමාත්‍යාංශයට ලැබිය යුතු ප්‍රතිෂ්ඨාව ගණනය කිරීමේදී රු.1,250,000කට තක්සේරු කරන ලද මෝටර් වාහනයේ වටිනාකමද අයකරගැනීමට හෝ ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට හෝ කටයුතුකර නොතිබුණි.

1.6.3 කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලි හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම

බලශක්ති අමාත්‍යාංශය විසින් වසර දෙකක් සඳහා බදු පදනම මත ලබාගෙන තිබූ කම්කරු කොන්ග්‍රස් ගොඩනැගිල්ල සඳහා අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද රු. 2,130,000 ක් වූ අත්තිකාරම් ගෙවීම, වියදම් දැරූ වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතවී තිබුණි. මේ හේතුවෙන් ගිණුම් කාලපරිච්ඡේදයෙන් ඔබ්බට ගෙවන ලද අත්තිකාරම් මුදල ජනරජ ගිණුමේ රජයට ඇති හිමිකම නිරූපණය කිරීම සඳහා 9188 - කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා 9189 - කුලි හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම තුළ ගිණුම්ගතකර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

බලශක්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2025 දෙසැම්බර් 31 දිනට හිඟ බලපත්‍ර ගාස්තු ඇතුළුව රු. 650,522,043 ක හිඟ ආදායමක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර ඇතත් එම මුදල තුළ වර්ෂයකට වැඩි කාලයක සිට ලැබිය යුතු මුදල රු.17,432,823ක් විය. එසේම වසරකට වැඩි කාලයක සිට අයවිය යුතු මුදල තුළ රු. 4,400,000ක තාර ලියාපදිංචි ගාස්තු ද ඇතුළත් වූ අතර මෙම තාර ලියාපදිංචි ගාස්තුව ලබා ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. තවද, ඉහත මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් දැනුම් දීමේ ලිපි පමණක් යවා ඇති අතර වෙනත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති රීති වලට යොමුව	නීති රීති වලට අනුකූල නොවීම්
(අ) 1995 අංක 16 දරණ මුදල් පනත	පනත ප්‍රකාරව, 95/96 බදු වසරේ සිට බලපැවැත්වෙන පරිදි සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද අයකරනු ලබයි. 2012 අංක 12 දරණ මුදල් පනත (සංශෝධිත) අනුව 2012/2013 බදු වර්ෂයේ සිට රජයේ ආයතන සුඛෝපභෝගී බදු මුදලින් නිදස්කර තිබුණි. 2024 දෙසැම්බර් 05 දිනැති අංක 2024/05 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව 2012 වර්ෂයට පෙර මිලදීගත් සුඛෝපභෝගී වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම වාහන මිලදීගත් පාර්ෂවයන් වෙත අයිතිය පැවරීමේදී වාහන දෙකක් සඳහා හිඟ සුඛෝපභෝගී බදු ලෙස රු. 254,000ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. ඒ අනුව, අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන 2012 වසරට පෙර මිලදීගත් සුඛෝපභෝගී වාහන 10කට අදාල බද්ද මෙතෙක් නිරවුල් කර නොතිබුණි.
(ආ) 1992 අගෝස්තු 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/92	සංචිත වාහන වල රාජ්‍ය ලාංඡනය හෝ ආයතනයේ සලකුණ යෙදිය යුතු වුවත්, බලශක්ති අමාත්‍යාංශය සංචිත වාහන 25ක ලාංඡන යෙදීමට කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

බලශක්ති අමාත්‍යාංශයේ බලශක්ති අංශයෙහි මෙහෙවර "ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි, අඩු වියදම් බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කරමින් ඉන්ධන ආනයනය කළමනාකරණය හා දේශීයව නව බලශක්ති ප්‍රභවයන් බලශක්ති මිශ්‍රණයට එකතු කිරීම සහ නියමිත නීති සහ අණපනත් වලට අනුකූලව බලශක්ති විෂයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය මඟින් පරිසර හිතකාමී තිරසර බලශක්ති සැපයුමක් තහවුරු කිරීම " වේ. එමෙන්ම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යන් යටතේ "බලශක්ති සම්පත් පාලනය නියාමනය සහ උපයෝජනය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම" සහ අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයන් යටතට "ඛනිජතෙල් අංශයට අදාල සංවර්ධන හා

නියාමන කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය" සිදුකළ යුතු වුවද, බලශක්ති නියාමනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය කර නොතිබුණි. තවද, 2006 ජුනි 08 දිනැති අංක අමප/06/0858/217/015 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, 2002 අංක 33 දරණ ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධි විධාන) පනතට බලශක්ති නියාමනය සහ බලශක්ති නියාමනය සම්බන්ධයෙන් නීති සම්පාදනයට අදාලව සංශෝධන පනවන ලෙස දන්වා තිබූ අතර, 2022 අංක 27 දරණ ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධි විධාන) (සංශෝධන) පනත සකස්කර තිබුණ ද, ඒ තුළ ද බලශක්ති නියාමනය සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීමක් කර නොතිබුණි. බලශක්ති නියාමනය සම්බන්ධව නියාමන රාමුවක් නොමැති වීම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ බලශක්ති වෙළඳපොළ තුළ පහත තත්ත්වයන් ඇතිවීමේ අවදානමක් පවතින බව කැබිනට් මණ්ඩල සංදේශය පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

- අඩු ගුණාත්මකභාවයෙන් හා අවධානම් සහිත ඉන්ධන හා ලිහිසි තෙල් වෙළඳපොළට පැමිණීම.
- අනිවාර්ය ජාතික ඉන්ධන තත්ත්ව ප්‍රමිතියක් නොමැති කම.
- පාරිභෝගික පැමිණිලි සහ ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය නිසි ආකාරව ක්‍රියාත්මක නොවීම.
- අගය එකතු කළ ඉන්ධන නිෂ්පාදන සහ කාර්යසාධන ආකලන සඳහා නියාමනයක් නොමැති කම.
- සේවා ගුණාත්මකභාවය, ඉන්ධන පිරවුම්හල්වල ඌණතාවයන් සහ ප්‍රමාණවත් ආරක්ෂක අධීක්ෂණයක් නොමැති කම.
- පාරිභෝගිකයින්ට, පරිසරයට සහ ජාතික බලශක්ති ආරක්ෂාවය අවධානමක් ඇති කිරීම.
- ලිහිසිතෙල් වෙළඳපොළ දත්ත සහ තොරතුරු යාවත්කාලීන වී නොමැති බැවින්, ලිහිසිතෙල් කර්මාන්ත පාර්ශවකරුවන්ට ස්වාධීන වෙළඳපොළ තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම.

4.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) විදුලිබල සැපයුමේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහයවීමේ ව්‍යාපෘතිය යටතේ කිලෝමීටර් 285ක දිගකින් යුත් කිලෝවොල්ට් 33ක කුළුණු මාර්ග සහ කිලෝවොල්ට් 33ක ගැන්ට්‍රි 13ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2019 ඔක්තෝබර් 28 දින රු. මිලියන 7,314.05 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණි. එම ව්‍යාපෘතිය ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද පැකේජ 04 යටතේ දින730 ක් ඇතුළත එනම් 2021 ඔක්තෝබර් 27 දින වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, 2026 මාර්තු 31 දක්වා අවස්ථා 06 කදී දින 1,731කින් කාලය දීර්ඝ කිරීම ලබා තිබූ අතර කාලය දීර්ඝ කිරීම්වල එකතුව ආරම්භක ඉදිකිරීම් කාලය මෙන් 02 ගුණයකට වඩා වැඩි වී තිබුණි. ඉහත පරිදි කොන්ත්‍රාත්කරුට කාල

දීර්ඝ කිරීම් ලබා දී තිබුණද, 2025 දෙසැම්බර් 31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 89.02 සහ සියයට 73.76 ක් විය. මෙලෙස අවස්ථා ගණනකදී කාල දිගු කිරීම් හේතුවෙන්, මධ්‍යම වෝල්ටීයතා ජාලයේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම, ග්‍රාමීය විදුලිබල ජාලය පුළුල් කිරීම සහ පුනර්ජනනීය යෙදවුම් අවශෝෂණය කිරීම යන ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි.

(ආ) විදුලිබල පද්ධතිය සවිබල ගැන්වීමේ සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දෙන ලද ණය මුදල 2025 ජනවාරි 09 දින සිට බලාත්මක වුවද, ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පැකේජ 7න් කිසිදු පැකේජයක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු සඳහා කිසිදු ගෙවීමක් නොකර 2025 වර්ෂය තුළදී එ.ජ ඩො 161,829 කට සමාන රු.49,045,534ක බැඳීම් ගාස්තු සහ පොළී ගාස්තු පමණක් එම ණය මුදලින් දරා තිබුණි.

(ඇ) හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර 1) යටතේ ක්‍රියාත්මක වූ මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 19,288 ක් වේ. ව්‍යාපෘති ණය ගිවිසුම අනුව 2014 වර්ෂයේ ආරම්භ කර 2019 සැප්තැම්බර් 30 දින අවසන් කිරීමට නියමිතව තිබුණද, නිසි සැලසුම් සකස් කිරීමක් හා නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකිරීම හේතුවෙන්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීම මත ව්‍යාපෘතියේ ලොට් අංක 01 නැවත සැලසුම් කිරීමට සිදුවීමත්, ඒකදේශීය මත්ස්‍ය විශේෂයක් හමුවීම හේතුවෙන්, ඒ පිළිබඳ පරිසර අධ්‍යනයක් කිරීමට සිදුවීමත් නිසා ව්‍යාපෘති ආරම්භය සැලසුම් කල කාලයට වඩා වසර 03ක ප්‍රමාදයකින් වැඩ ආරම්භකර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට මොරොගොල්ල ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 91.6ක් සහ සියයට 70ක් වූ අතර ව්‍යාපෘති කාලය 2026 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.2.1 (ඇ) අනුව, ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින්, අදාල ප්‍රසම්පාදන අස්තිත්වයන්හි එක් එක් කොන්ත්‍රාත්තුව සැලසුම් කර ඇති පරිදි, අමාත්‍යාංශය මෙන්ම එකී අමාත්‍යාංශයේ විෂය පථයට අයත් සියලුම ප්‍රසම්පාදන අස්තිත්වයන් විසින් ප්‍රධානය කරන ලද සහ ක්‍රියාත්මක කරන ලද සියලුම ප්‍රසම්පාදනයන් සම්බන්ධව එක් එක් සැපයුම්කරු/කොන්ත්‍රාත්කරු/සේවා සම්පාදකගේ නම සමඟ ප්‍රසම්පාදනයේ තථ්‍ය ප්‍රමාණය, තත්ත්වය, පිරිවැය මෙන්ම කාල ඉලක්කයන්ට අදාළ පරාමිතීන් සඳහන් කරමින් අදාළ ප්‍රසම්පාදන අස්තිත්වයන්හි සවිස්තරාත්මක වාර්ෂික

ප්‍රසම්පාදන සැලසුම්වලට අනුව පිළියෙල කරන ලද ඒකාබද්ධ "ප්‍රසම්පාදන කාර්යසාධන වාර්තාව", ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත කාර්තුමය වශයෙන් ලබාදිය යුතු වුවද, 2026 මාර්තු 30 දින වන විටත් බලශක්ති අමාත්‍යාංශය ඉහත මාර්ගෝපදේශය අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.2.3 (ඇ) අනුව, රාජ්‍ය ප්‍රසම්පාදන මූලධර්ම නිසි ලෙස පිළිපැදීම සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ඇති බව පෙන්වාදීම පිණිස අදාල ප්‍රසම්පාදන අස්තිත්වය විසින් වාර්ෂිකව සහ අර්ධ-වාර්ෂිකව ඒකාබද්ධ ප්‍රසම්පාදන අනුකූලතා වාර්තාවක් සකස් කර පවත්වාගෙන යායුතු ය. එකී වාර්තාවල පිටපත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරී විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2026 මාර්තු 30 දින වන විටත් බලශක්ති අමාත්‍යාංශය ඉහත මාර්ගෝපදේශය අනුව කටයුතු කර නොතිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරක් සඳහා අවිධිමත් ලෙස වැඩ බැලීමේ පත්වීමක් ලබාදී වසර 07ක් සඳහා වැටුප් වශයෙන් රු. 2,000,000 ක් ගෙවා තිබීම සම්බන්ධයෙන් 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ නිරීක්ෂණ මඟින් පෙන්වා ඇතත් විගණන කළමනාකරණ කමිටු තුළ දී උප කමිටු පිහිටුවමින් කාර්ය පැවරීම් සිදුකරනු මිස එම මුදල් නැවත අයකර ගැනීමට 2026 අප්‍රේල් 30 දක්වාම කටයුතු කර නොතිබුණි.

පී.කේ.එම්.පී. තෝනිස්,
නියෝජ්‍ය විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පී.කේ.එම්.පී. තෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය